# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

2021 ජුනි මස 25 වන දින

**II** වන කොටස

## අතිරේකය

(2021.06.28 දින නිකුත් කරන ලදී)

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද; වෙළෙඳපොළ ආයතන, ඇතැම් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණ, වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීම සඳහා ද; ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා සහ බලාත්මක කිරීමේ පියවර සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; වෙළෙඳපොළ විෂමාචාරය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ද; සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමකයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග මැඩපැවැත්වීම සඳහා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 280.00 තැපැල් ගාස්තුව : රු. 135.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා

එල්.ඩී.—ඕ 8/2017

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද; වෙළෙඳපොළ ආයතන, ඇතැම් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණ, වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීම සඳහා ද; ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා සහ බලාත්මක කිරීමේ පියවර සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; වෙළෙඳපොළ විෂමාචාරය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ද; සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමකයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග මැඩපැවැත්වීම සඳහා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2021 අංක      දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර මේ පනතේ අනෙකුත් විධිවිධාන *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක හෝ දිනවල සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ එකිනෙකට වෙනස් කොටස් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් එකිනෙකට වෙනස් දින නියම කරනු ලැබිය හැකි ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කළ දින සිට (2) වන උපවගන්තියේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

## I වන කොටස

### I වන පරිච්ඡේදය

### මූලික

පනත අදාළ වීම

**2.** මේ පනතේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් හැර, මේ පනත සුරැකුම්පත් , සුරැකුම්පත් වෙළෙඳපොළවල් සහ ඒ හා සම්බන්ධ කරුණු සඳහා අදාළ වන්නේ ය.

මේ පනතේ පරමාර්ථය සහ අරමුණු

**3.** මේ පනතේ පරමාර්ථය සහ අරමුණ:-

(අ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම;

(ආ) සාධාරණ, විධිමත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීම, පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම;

(ඇ) දේශීය සහ විදේශීය ආයෝජකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම; සහ

(ඈ) සුරැකුම්පත් වෙළෙඳපොළවල්වලට අදාළව සපයනු ලබන සේවාවන්හි උසස් වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට වගබලා ගැනීම,

විය යුතු ය.

## 2 වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම

**4.** (1) මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සඳහා, (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සංයුතිය

**5.** (1) කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය: -

(අ) කොමිෂන් සභාවේ බහුවිධ අංශ පිළිබිඹු කිරීම සඳහා (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, සුරැකුම්පත් වෙළෙඳපොළට අදාළ

කරුණු සම්බන්ධයෙන් වෘත්තීයමය ප්‍රවීණතාවක් සහ කීර්තියක් ඇත්තා වූ ද නීතිය, මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, බැංකුකරණය හෝ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල විශේෂ දැනුමක් හෝ පෘථුල පළපුරුද්දක් ඇත්තා වූ ද නිපුණතාව පෙන්නුම් කර ඇත්තා වූ ද, යටත් පිරිසෙයින් තැනැත්තන් පස්දෙනෙකු පෞද්ගලික අංශයේ සිටින තැනැත්තන් වන්නා වූ ද, තැනැත්තන් හයදෙනෙකුගෙන්;

(ආ) නම් කළ සාමාජිකයන් දෙදෙනෙකුගෙන්, එනම්, -

(i) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරන ලද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකුගෙන්; සහ

(ii) ශ්‍රී ලංකා මුදල් මණ්ඩලය විසින් නම් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය මහ බැංකු අධිපතිවරයකුගෙන්; සහ

(ඇ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් දෙදෙනකුගෙන්:-

(i) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පත් කරන ලද සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයාගෙන්; සහ

(ii) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපතිවරයාගෙන්.

(2) කොමිෂන් සභාවේ පත්කළ සාමාජිකයන් අතරින්, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස එක් සාමාජිකයකු නම් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තන් පත් කිරීමේ දී, අමාත්‍යවරයා විසින්-

(අ) ඒ තැනැත්තාගේ විශ්වසනීයත්වය සහ කීර්තිය; සහ

(ආ) කොමිෂන් සභාවේ සම්බන්ධතා සහ ඒ තැනැත්තාට ඇති හෝ ඒ තැනැත්තා නියෝජනය කරන යම් සම්බන්ධතා අතර යම් ගැටුමක් ඇතිවීමේ ඉඩකඩ,

සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

*සම්බන්ධතා අතර ගැටුම්*

**6.** කොමිෂන් සභාවේ සෑම පත් කළ හෝ නම් කළ සාමාජිකයකු විසින් ම, තමා පත් කරනු ලැබූ විට දී, තමා පත් කරනු ලැබූ අවස්ථාවේ දී තමාට තිබිය හැකි යම් සම්බන්ධතා අතර ගැටුමක් පිළිබඳව අමාත්‍යවරයා වෙත ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

*පත් කළ හෝ නම් කළ සාමාජිකයන්ගේ ධුර කාලය*

**7.** කොමිෂන් සභාවේ පත් කළ හෝ නම් කළ සෑම සාමාජිකයකු ම මියයාමෙන්, නීතියක් ක්‍රියාත්මකවීමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර උපරිම වශයෙන් අනුගාමී වන හෝ අන්‍යාකාරයෙන් වන යම් ධුර කාල දෙකක කාලසීමාවකට යටත්ව නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

*කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම*

**8.** (1) කොමිෂන් සභාවේ යම් පත් කළ හෝ නම් කළ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම විටක දී, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර අමාත්‍යවරයා විසින් එය පිළිගනු ලැබීමෙන් පසුව එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) නිල බලයෙන් පත් වන සාමාජිකයකු හැර වෙනත් යම් සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ (4) වන හෝ (5) වන උපවගන්තිවල විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් ධුරය හිස් කරන අවස්ථාවක, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින්, වෙනත් තැනැත්තකු, ඔහු අනුප්‍රාප්ත වන්නා වූ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා හැර කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකුට, රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාලයක් ඔහුගේ ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වී ඇති අවස්ථාවක, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින්, එම කාලසීමාව තුළ

ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොමැති කොමිෂන් සභාවේ පත් කළ හෝ නම් කළ සාමාජිකයකු ඔහුගේ ධුරය හිස් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොමැති සභාපතිවරයා වන්නා වූ කොමිෂන් සභාවේ සාමාජිකයකු ඔහුගේ ධුරය හිස් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

**9.** (1) යම් තැනැත්තකු, - නුසුදුසුකම් සහ ඉවත් කිරීම සඳහා වන හේතු

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) කොමිෂන් සභාව බලපත්‍ර දෙන ලද හෝ ලියාපදිංචි කරන ලද ආස්ථිත්‍යයක අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු හෝ සේවා නියුක්තකයකු වේ නම් හෝ වුවහොත්;

(ඇ) සිහිවිකල් හෝ තම කාර්ය ඉටු කිරීමට නොහැකි තැනැත්තකු වේ නම් හෝ වුවහොත්;

(ඈ) නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වේ නම් හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත්ව ඇත්නම්; හෝ

(ඉ) චරිත දූෂණය සම්බන්ධයෙන් වූ වරදක් සඳහා වරදකරුවකු කරනු ලැබී නම් හෝ ලැබ ඇත්නම්; හෝ

(ඊ) කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්,

එම තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ නම් කිරීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු -

(අ) ඔහුගේ කාර්යවලට අදාළව බරපතළ විෂමාචාරයකට වරදකරු වේ නම්;

(ආ) ඔහු දිගටම ධුරයේ කටයුතු කිරීම කොමිෂන් සභාවේ යහපතට අහිතකර වන පරිදි ඔහුගේ තනතුර අනිසි ලෙස භාවිත කළහොත්;

(ඇ) (1) වන උපවගන්තිය යටතේ නුසුදුස්සකු වුවහොත්; හෝ

(ඈ) මේ පනතේ විධිවිධාන කඩ කළහොත්,

අමාත්‍යවරයා විසින්, ඔහු සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කිරීමෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්

**10.** (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීමේ මුලසුන දැරීමට ඔවුන් අතුරින් එක් අයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වූ කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, මුලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**11.** මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, කොමිෂන් සභාවේ අරමුදලින් කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා

**12.** (1) කොමිෂන් සභාවේ සභාපතිවරයාට, රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තාවකාලිකව ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට කටයුතු කිරීමට කොමිෂන් සභාවේ වෙනත් සාමාජිකයකු නම් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයාට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඕනෑම විටක දී ඉල්ලා අස්විය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

සාමාජිකයන් විසින් යම් සම්බන්ධතාවක් හෙළිදරව් කිරීම

**13.** කොමිෂන් සභාව විසින් යම් කරුණක් පිළිබඳව ගනු ලබන යම් තීරණයක් සම්බන්ධයෙන් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් යම් සම්බන්ධතාවක් දක්වන සාමාජිකයකු විසින් එම තීරණය ගනු ලබන්නා වූ කොමිෂන් සභාවේ රැස්වීමේ දී, එම සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර එම හෙළිදරව් කිරීම කොමිෂන් සභාවේ රැස්වීම්වල සටහන්වල වාර්තා කරනු ලැබිය යුතු ය. තව ද එම කරුණ සම්බන්ධයෙන් වන කොමිෂන් සභාවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට එම සාමාජිකයා සහභාගී නොවිය යුතු අතර, එම සාකච්ඡාව පැවැත්වෙන හෝ එම තීරණය ගැනීම කෙරීගෙන යන අතරතුර දී එම සාමාජිකයා එම රැස්වීමෙන් ඉවත්ව සිටිය යුතු ය.

පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් ක්‍රියාපටිපාටි, ක්‍රියා හෝ තීරණ බලරහිත නොවිය යුතු බව

**14.** කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාපටිපාටියක්, ක්‍රියාවක් හෝ තීරණයක් බලරහිත නොවිය යුතු ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව

**15.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා පැමිණ නොමැති අවස්ථාවක දී, කොමිෂන් සභාවේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටින බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

**කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය**

**16.** කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය:- කොමිෂන් සභාවේ ප්‍රධාන කර්තව්‍ය, බලතල සහ කාර්ය

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම සහ සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට සහාය වීම;

(ආ) ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළවල් සම්බන්ධයෙන් වන පර්යේෂණ සහ පුහුණු කිරීම් ඇතුළුව ශ්‍රී ලංකාව තුළ සුරැකුම්පත් වෙළෙඳපොළවල් සංවර්ධනය කිරීම දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඇ) වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන්, ලියාපදිංචි තැනැත්තන්, නිෂ්කාශන සාමාජිකයන්, වෙළෙඳ සහභාගිකයන්, තැන්පතුගාර සහභාගිකයන්, නිකුත්කරන්නන්, ආයෝජකයන් හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවන් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත කලින් කලට මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාමාන්‍ය හෝ විශේෂ විධාන හෝ උපදෙස් ලබාදීම;

(ඈ) වෙළෙඳ ආයතනවල, වෙළෙඳපොළ අතරමැදියන්ගේ, සාමූහික ආයෝජන යෝජනාක්‍රමවල හෝ ලැයිස්තුගත පොදු සමාගම්වල අතිරේක සේවා සැපයුම්කරුවන්ට කලින් කලට සාමාන්‍ය හෝ විශේෂ විධාන හෝ උපදෙස් ලබා දීම;

(ඉ) වෙළෙඳපොළ ආයතනයක් ලෙස ක්‍රියාත්මකවීමට සංස්ථාවකට බලපත්‍රයක් ප්‍රදානය කිරීම සහ එය නිසි පරිදි කටයුතු කරන බවට වගබලා ගැනීම;

(ඊ) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ක්‍රියාත්මකවීමට යම් තැනැත්තකුට බලපත්‍රයක් ප්‍රදානය කිරීම සහ එය නිසි පරිදි කටයුතු කරන බවට වගබලා ගැනීම;

(උ) ලියාපදිංචි තැනැත්තකු ලෙස, වෙළෙඳපොළ අතරමැදියකු සඳහා සහ එය වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමට හෝ මිල දී ගැනීමට සේවාදායකයන්ට උපදෙස් ලබා දෙන්නා වූ තැනැත්තෙක් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමේ දී ඔවුන් කටයුතු කරන ආකාරය නියාමනය කිරීම;

(ඌ) යම් තැනැත්තකු වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම;

(එ) ලැයිස්තුගත පොදු සමාගම්වලට හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයන්ට කලින් කලට සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීම;

(ඒ) අත්කරගන්නකුට, අර්පණදායියකුට හෝ අර්පණදායියකු හෝ අර්පණලාභියකු හා එක්ව ක්‍රියාකිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන්ට හෝ ලැයිස්තුගත පොදු සමාගමක් අත්කර ගැනීමට හෝ ඒකාබද්ධ වීමකට අදාළ වන්නා වූ ඉලක්ක සමාගමකට සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීම;

(ඔ) මේ පනත, නියෝග හෝ රීතිවල ආසන්න කඩවීම් වැළැක්වීමට සහ කඩවීම් මැඩපැවැත්වීමට යම් තැනැත්තකුට විශේෂ විධාන නිකුත් කිරීම;

(ඕ) විනිමය ස්ථානයක දී සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම නියාමනය කිරීම;

(ක) සුරැකුම්පත් නිකුත් කිරීම නියාමනය කිරීම;

(ග) යම් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම තහනම් කිරීම හෝ අත්හිටුවීම හෝ ලැයිස්තුගත කළ සුරැකුම්පත් අපලේඛනගත කිරීම හෝ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම තහනම් කිරීම හෝ අත්හිටුවීම හෝ ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ සාධාරණ සහ විධිමත් සුරැකුම්පත් වෙළෙඳපොළක් සහතික කිරීම සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි සලකනු ලබන යම් පියවර ගැනීම;

(ච) කොමිෂන් සභාවේ පරමාර්ථ සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි යම් නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරවීම සහ එම නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැටුප් සහ වේතන හෝ අනෙකුත් පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ තීරණය කිරීම;

(ජ) යම් නිශ්චල හෝ චංචල දේපළක් කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ට) ලැයිස්තුගත පොදු සමාගමක් අත්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම හෝ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු නියාමනය කිරීම;

(ඩ) වෙළෙඳපොළ ආයතනයක, වෙළෙඳපොළ අතරමැදියකුගේ, ලියාපදිංචි තැනැත්තකුගේ, ලැයිස්තුගත පොදු සමාගමක හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක යම් කටයුත්තක් පිළිබඳව විභාග කිරීම සහ විමර්ශන පැවැත්වීම;

(ණ) යම් තැනැත්තකු විසින් කරන ලදැයි කියනු ලබන මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් රීතියක් හෝ විධානයක් හෝ ලබා දෙන ලද යම් උපදෙසක් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති බලාත්මක කිරීමේ පියවර ගැනීම;

(ත) මේ පනතේ විෂය පථය තුළට ගැනෙන්නා වූ යම් කාරණාවකට අදාළව යම් සංවිධානයක් හෝ විදේශීය නියාමන අධිකාරියක් සමඟ ගිවිසුම්වලට හෝ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම;

(ද) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු, අතිරේක සේවා සපයන්නකු, යම් ලැයිස්තුගත පොදු සමාගමක් හෝ යම් ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක් විසින් සිදු කරන ලද නීති විරෝධී චර්යා පිළිබඳ තීරණ ප්‍රකාශයට පත් කිරීම;

(න) සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳ ආවේක්ෂණ සිදු කිරීම;

(ප) කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද යම් සේවාවන් සඳහා ගාස්තු හෝ අයකිරීම් අයකර ගැනීම;

(බ) මූල්‍ය පද්ධතියට ඇති සංස්ථානික අවදානම අවම කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි පරිදි යම් පියවර ගැනීම;

(ම) සුරැකුම්පත්වලට දායකවීම සඳහා මහජනයාට අර්පණයක් සිදු කර ඇති සමාගම්වලට විශේෂ හෝ සාමාන්‍ය විධාන ලබා දීම;

(ය) ඇතැම් මහජන අර්පණ හෝ නිකුත් කිරීම් මේ පනතේ විධිවිධානවලින් නිදහස් කිරීම;

(අඅ) මේ පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් යෝග්‍ය යැයි සළකනු ලබන විශේෂඥයන් පත් කිරීම; සහ

(ආඅ) මේ පනත යටතේ වන කොමිෂන් සභාවේ පරමාර්ථ, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය යැයි, ආනුෂංගික සහ උපසේවී යැයි සලකනු ලැබිය හැකි වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම,

විය යුතු ය.

කොමිෂන් සභාවේ අතිරේක බලතල

**17.** 16 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති බලතලවලට අමතරව, කොමිෂන් සභාවට පහත දැක්වෙන බලතල ද තිබිය යුතු ය:-

(අ) වෙළෙඳපොළ ආයතන හෝ වෙළෙඳපොළ අතරමැදියන් හෝ ලියාපදිංචි තැනැත්තන් හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල භාරකරුවන් මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූලව කටයුතු කරනු ලබන්නේ ද යන්න නිශ්චය කර ගැනීමට සහ තීරණය කිරීම පිණිස ඔවුන්ගේ කටයුතු පිළිබඳ අධීක්ෂණ සහ පරීක්ෂණ සිදු කිරීම සහ, අවස්ථාවෝචිත පරිදි, එම වෙළෙඳපොළ ආයතනවලින්, වෙළෙඳපොළ අතරමැදියන්ගෙන්, ලියාපදිංචි තැනැත්තන්ගෙන් හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල භාරකරුවන්ගෙන් එම පරීක්ෂණ සිදු කිරීමේ දී දරන ලද වියදම් අයකර ගැනීම;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද ආකෘතියට හා ආකාරයට අනුකූලව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරනු ලැබූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ අතුරු මූල්‍ය ප්‍රකාශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස වෙළෙඳපොළ ආයතන හෝ වෙළෙඳපොළ අතරමැදියන්ට නියම කිරීම; සහ

(ඇ) සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක බලපත්‍රලත් කළමනාකරණ සමාගමට, සෑම වසරක් සඳහා ම වන වාර්තා සහ යටත් පිරිසෙයින්, ඒ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒ වසරේ කටයුතු පිළිබඳ වාර්තා දෙකක්වත් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස නියම කිරීම. කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි යම් විස්තර එකී සෑම වාර්තාවකම ඇතුළත් විය යුතු ය. පළමු වාර්තාව ඒ වසරේ සැප්තැම්බර් මස තිස් වන දිනට පසු නොවන දිනක දී ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර දෙවන වාර්තාව එළඹෙන වසරේ මාර්තු මස තිස් එක් වන දිනට පසු නොවන දිනක දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

නඩු කටයුතුවල දී කොමිෂන් සභාව නියෝජනය කිරීම

**18.** කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්, නීතිඥවරයකු වන කොමිෂන් සභාවේ යම් නිලධරයකුට හෝ වෙනත් යම් නීතිඥවරයකුට කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පවරන ලද හෝ කොමිෂන් සභාවට විරුද්ධව පවරන ලද යම් නඩු කටයුත්තකට හෝ කොමිෂන් සභාවට සැලකිය

යුතු සබඳතාවක් ඇති යම් නඩු කටයුත්තකට පෙනී සිටීමට බලය දෙනු ලැබිය හැකි ය.

4 වන පරිච්ඡේදය

**කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය**

අධ්‍යක්ෂ-ජනරාල්වරයා

**19.** (1) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර එකී අධ්‍යක්ෂ-ජනරාල්වරයා එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ පාරිශ්‍රමික ඇතුළු සේවා නියුක්තියේ කොන්දේසි කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු -

(අ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතළ විෂමාචාරයකට වරදකරු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ නියාමන ආයතනයක් හෝ පෙර සේවායෝජකයකු විසින් ගන්නා ලද විනය ක්‍රියාමාර්ගයකට යටත්ව ඇත්නම්;

(ආ) කලින් ධුරයෙන් පහකර ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් සිදු කර ඇත්නම්,

කොමිෂන් සභාව විසින් එම තැනැත්තා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ලෙස පත් කිරීම සඳහා නිර්දේශ කරනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ එහි බලතල, කර්තව්‍ය සිදු කිරීම සහ කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, එසේ කිරීමට අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන කවර හෝ විටක දී, මේ පනතින් ඔහුට පිරිනමන ලද හෝ පවරන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් නිලධරයකුට හෝ සේවකයකුට පවරනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව, එම නිලධරයා හෝ සේවකයා විසින්, එම බලය, කර්තව්‍යය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, පහත දැක්වෙන, හේතු කිසිවක් සැලකිල්ලට ගෙන (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ-ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:-

(අ) කොමිෂන් සභාව සඳහා ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී, යම් සබඳතා අතර ගැටුමක් ඇති වීමට ඇති ඉඩකඩ;

(ආ) ඒ තැනැත්තා සිහිවිකල්භාවයට පත් වීම හෝ ඔහුගේ කාර්ය ඉටු කිරීමට නොහැකි බවට පත් වීම;

(ඇ) ඒ තැනැත්තා ඔහුගේ කාර්යයන්ට අදාළව බරපතළ විෂමාචාරයකට වරදකරු වීම; හෝ

(ඈ) ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහුගේ ස්වාධීනත්වයට බාධා විය හැකි යම් කටයුත්තකට ඒ තැනැත්තා සම්බන්ධ වීම:

එසේ වුව ද, එසේ ඉවත් කිරීමට පෙරාතුව කොමිෂන් සභාව විසින්, එම අධ්‍යක්ෂ-ජනරාල්වරයාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

**20.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන යටතේ වන එහි කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින්, එහි කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි එය විසින් සලකනු ලබන පරිදි සේවක සංඛ්‍යාවට අදාළ තනතුරු පිහිටුවා නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරවනු ලැබිය හැකි අතර, එම සේවකයන්ගේ සහ නිලධරයන්ගේ වැටුප් සහ වේතන හෝ අනෙකුත් පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ විශ්‍රාම වැටුප් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාව විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා නියාමනය කරනු ලැබිය හැකි අතර එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, තාක්ෂණික සේවක පිරිසට සුරැකුම්පත් වෙළෙඳපොළවල්, මුදල්, නීතිය, මුදල් ආර්ථික විද්‍යාව යන විෂයයන් සහ අනෙකුත් විෂයයන් පිළිබඳ පුහුණුව ලබාදීම ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම සිදු කරනු ලැබිය යුතු අතර, මේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාව පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශීය රටක දී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීමට කොමිෂන් සභාවට බලය හිමි විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් චර්යා ධර්ම සංග්‍රහයක් පිහිටුවනු ලැබිය යුතු අතර එය කොමිෂන් සභාවේ නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය යුතු ය.

(5) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතළ විෂමාචාරයකට වරදකරු බවට කලින් තීරණය කරනු ලැබ ඇත්නම් හෝ නියාමන ආයතනයක් විසින් යම් විනය ක්‍රියාමාර්ගයකට යටත් කර ඇත්නම්;

(ආ) කලින් ධූරයෙන් පහ කර ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් සිදු කර ඇත්නම්,

කොමිෂන් සභාව විසින් එම තැනැත්තා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්

පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කැමැත්ත ම ඇතිව, එම කාර්යය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයා සඳහා සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(8) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයා සඳහා සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(9) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීමට ගිවිසගෙන ඇති යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයේ යොදවන අවස්ථාවක, එම තැනැත්තා විසින් කොමිෂන් සභාවේ සේවය කරනු ලබන යම් කාලසීමාවක්, එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) කොමිෂන් සභාව විසින් එහි නිලධරයන් හෝ සේවකයන්, එම නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ කැමැත්ත ඇතිව, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක වෙනත් රාජ්‍ය ආයතනවලට හෝ නියාමන අධිකාරිවලට, එම ආයතනය හෝ අධිකාරිය සහ කොමිෂන් සභාව අතර ගිවිසගත් ගිවිසුමක් මත කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා අනුයුක්ත කිරීමට යෝජනා කරනු ලැබිය හැකි ය. එසේ අනුයුක්ත කරන කාලසීමාව කොමිෂන් සභාවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සංස්ථාවල නිලධරයන් පත්කිරීම**

**21.** (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු එම නිලධරයාගේ හෝ සේවකයාගේ සහ එම සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, විශ්‍රාම වැටුප් හෝ සේවක අර්ථසාධක අරමුදල්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව, කොමිෂන් සභාව විසින් සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් ගිවිස ගනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තාවකාලිකව නැතහොත් ස්ථිරව ම කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී ඔහු කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

**කොමිෂන් සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය**

**22.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ ඒවායේ කාර්ය සඳහා කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා, නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව**

**23.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.

II වන කොටස

**වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන**

මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ

**24.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ විය යුත්තේ :-

(අ) වෙළෙඳපොළ ආයතන පිහිටුවීම මගින් ශ්‍රී ලංකාව තුළ සාධාරණ, විධිමත්, විනිවිදභාවයෙන් යුත් සහ කාර්යක්ෂම සුරැකුම්පත් වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම;

(ආ) සුරැකුම්පත් වෙළෙඳපොළක ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම; සහ

(ඇ) සුරැකුම්පත් වෙළෙඳපොළවල් හා සම්බන්ධ සංස්ථානික අවදානම් අවම කිරීම,

විය යුතු ය.

1 වන පරිච්ඡේදය

**විනිමය ස්ථාන**

බලපත්‍ර නොලත් විනිමය ස්ථානයක් පිහිටුවීමට එරෙහි තහනම

**25.** (1) කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක අධිකාරී බලය මත හැර යම් තැනැත්තකු විසින්, විනිමය ස්ථානයක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

විනිමය ස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලුම් කිරීම

**26.** (1) විනිමය ස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති මගින් දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් සහ ආකෘතියකින් සහ යම් ලේඛන සහ නියම කරනු ලැබිය හැකි යම්

ගාස්තු ද සමඟ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, සංස්ථාවක් විසින් පමණක් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව-

(අ) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරුට හැකියාව ඇති බවට;

(ආ) එහි ව්‍යාපාරයට සහ මෙහෙයුම්වලට සම්බන්ධ යම් අවදානම් විචක්ෂණශීලි ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඉල්ලුම්කරු සතු වන බවට;

(ඇ) (අ) ඡේදය යටතේ වන එහි බැඳීම් ඉටු කිරීමේ දී, විනිමය ස්ථානය විසින් මහජන සුබසිද්ධියට පටහැනිව ක්‍රියා නොකරන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය පාලනකරණ ව්‍යුහයන් ඉල්ලුම්කරු සතු වන බවට;

(ඈ) ඉල්ලුම්කරුට-

(i) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළඳපොළක්;

(ii) එහි ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රමාණවත් සහ නිසි ලෙස සූදානම් කර ඇති පරිශ්‍රයක්;

(iii) එහි ව්‍යාපාර කටුයුතු සඳහා දක්ෂ සේවක පිරිසක්; සහ

(iv) අවදානම් කළමනාකරණය කිරීම සඳහා සහ හදිසි අවස්ථාවලට මුහුණදීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවක්, ආරක්ෂක සැලසුම් සහ පහසුකම් සහිත ස්වයංක්‍රීය පද්ධතීන්,

සැපයීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍යමය සම්පත්, මානව සම්පත්, ස්වයංක්‍රීය පද්ධතීන් සහ අනෙකුත් සම්පත් ඇති බවට;

(ඉ) ඉල්ලුම්කරු විසින්, රීති මගින් -

(i) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක්;

(ii) වෙළෙඳපොළ සහභාගිකයන් ඇතුළත් කර ගැනීම සඳහා;

(iii) ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කරන විට දී එහි වෙළෙඳ සහභාගිකයන්ගේ ව්‍යාපාර කටයුතු නිසි පරිදි නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(iv) යහපත් චරිතයකින් සහ උසස් ව්‍යාපාරික විශ්වාසනීයත්වයකින් යුතු නොවන තැනැත්තන් වෙළෙඳ සහභාගිකයන් ලෙස පිළිගැනීමෙන් බැහැර කිරීම;

(v) ව්‍යාපාර කටයුතු කිරීමේ දී සාධාරණ සහ යුක්තිසහගත මූලධර්මවලට අනනුකූල ලෙස කටයුතු කිරීම හෝ විනිමය ස්ථානයේ රීති හෝ මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීම හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් යම් වෙළෙඳ සහභාගිකයකු හෝ එම වෙළෙඳ සහභාගිකයා වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු සඳහා දඩ නියම කිරීම ඇතුළුව එම වෙළෙඳ සහභාගිකයා හෝ තැනැත්තා ඉවත් කිරීම, ඔවුන්ගේ කටයුතු අත්හිටුවීම හෝ ඔවුන් විනය පාලනයට යටත් කිරීම;

(vi) සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම හෝ අපලේඛනගත කිරීම සිදු කළ හැකි කොන්දේසි;

(vii) එම ලැයිස්තුගත සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම පාලනය වන කොන්දේසි සහ විනිමය ස්ථානයේ තම සුරැකුම්පත් ලැයිස්තුගත කර ඇති සමාගම් හෝ වෙනත් ආස්ථිත්‍යයන් විසින් අනුගමනය කරනු ලැබිය යුතු රීති;

(viii) එහි පහසුකම් තුළ ගනුදෙනු කළ හැකි හෝ වෙළෙඳාම් කළ හැකි සුරැකුම්පත් පන්තිය හෝ පන්ති;

(ix) වෙළෙඳපොළ විෂමාචාරය තහනම් කිරීම සහ විමර්ශන සිදු කරන ආකාරය;

(x) එහි වෙළෙඳ සහභාගිකයන්ගේ ව්‍යාපාර කටයුතු කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ හෝ විමර්ශන පැවැත්වීම;

(xi) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ විධිමත් සහ සාධාරණ වෙළෙඳාමක් පවත්වා ගැනීම සඳහා යම් නිශ්චිත සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම අත්හිටුවීම;

(xii) සාමාජිකයන්ගෙන් බහුතරය වෙළෙඳ සහභාගිකයන්ගෙන් හෝ විනිමය ස්ථානයෙන් ස්වාධීන තැනැත්තන් වන්නා වූ විනය කමිටුවක්-

(අ) වෙළඳ සහභාගිකයන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර;

(ආ) වෙළෙඳ සහභාගිකයන් අතර;

(ඇ) වෙළෙඳ සහභාගිකයන් සහ විනිමය ස්ථානයක්, මධ්‍යම තැන්පතුගාරය හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් අතර;

(ඈ) විනිමය ස්ථානයේ ලැයිස්තුගත ආස්ථිත්‍යයන් සහ විනිමය ස්ථානය අතර,

වන ආරාවුල් සම්බන්ධයෙන් විභාග කර තීරණය කිරීම සඳහා පත් කිරීම;

(xiii) සාමාන්‍යයෙන්, ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ නිසි සැලකිල්ල දක්වමින් විනිමය ස්ථානයේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම,

සඳහා විධිවිධාන සලස්වන බවට; සහ

(ඊ) මහජනයාගේ සුබසිද්ධීන් හෝ වෙළෙඳපොළ මනා ලෙස නියාමනය කිරීම බලපත්‍රය ප්‍රදානය මගින් ඉටු වන බවට,

කොමිෂන් සභාව සෑහීමට පත් වන විට දී, කොමිෂන් සභාව විසින්, විනිමය ස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා එම ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන යම් ඉල්ලුම්කරුවකු විසින්, ඉල්ලුම් පත්‍රයට අදාළව කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි නියම කරනු ලැබිය හැකි යම් අතිරේක තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි ලෙස නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත්, කොමිෂන් සභාව විසින්, නියම කරන ලද නියම හෝ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ අතිරේක නියම හෝ කොන්දේසි පැනවීම හෝ කරනු ලැබිය හැකි ය.

විනිමය ස්ථානයේ කාර්ය

**27.** (1) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් සඳහා විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් සහතික කිරීම විනිමය ස්ථානයක කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එහි කාර්යය ඉටු කිරීමේ දී, විනිමය ස්ථානය විසින්-

(අ) ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම;

(ආ) සමාගම්වලට අදාළ යම් නීතියක් යටතේ සැලසිය යුතු යම් සුබසිද්ධියක්, (අ) ඡේදයේ සඳහන් සුබසිද්ධිය සමග

ගැටෙන විට දී, (අ) ඡේදයේ සඳහන් සුබසිද්ධිය බලපැවැත්වෙන බවට වගබලා ගැනීම; සහ

(ඇ) එහි ව්‍යාපාරය සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානමක් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) වෙන යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් සෑම විට දී ම මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම විනිමය ස්ථානයක අධ්‍යක්ෂවරයකුගේ කාර්යය විය යුතු අතර මේ පනත යටතේ වන කාර්යය සහ වෙනත් යම් නීතියක් යටතේ වන අධ්‍යක්ෂවරයකුගේ කාර්යය අතර ගැටුමක් ඇති වූ විට මේ පනත යටතේ වන කාර්යය බලපැවැත්විය යුතු ය.

(4) එහි රීතිවලට අනුකූලව කටයුතු කිරීම අධීක්ෂණය කිරීමේ හෝ සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා එහි රීති යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගැනීම විනිමය ස්ථානයේ කාර්යය විය යුතු ය.

(5) යම් විනිමය ස්ථානයකට -

(අ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි අවම මූල්‍යමය නියමයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා යම් වෙළෙඳ සහභාගිකයකු සතු හැකියාව ඇතුළුව එහි බලපත්‍රලත් ව්‍යාපාරය සම්බන්ධයෙන් වන බැඳීම් ඉටු කිරීම සඳහා යම් වෙළෙඳ සහභාගිකයකු සතු හැකියාවට අහිතකර ලෙස බලපානු ලබන හෝ අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් කරුණක්; හෝ

(ආ) විනිමය ස්ථානයේ මතය අනුව, යම් වෙළෙඳ සහභාගිකයකුගේ හෝ අදාළ වෙළෙඳ සහභාගිකයාගේ ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ මූල්‍යමය තත්ත්වයට හෝ මූල්‍යමය ඒකාග්‍රතාවට බොහෝ දුරට බලපෑ හැකි බවට පෙන්නුම් කරනු ලබන හෝ පෙන්නුම් කරනු ලැබිය හැකි යම් අවිධිමත් ක්‍රියාවක්, මේ පනතේ

යම් විධිවිධානයක්, නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකිරීමක් හෝ වෙනත් යම් කරුණක්,

පිළිබඳව දැන ගැනීමට ලැබුණහොත් එම විනිමය ස්ථානය විසින් වහාම ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) විනිමය ස්ථානයක් විසින්, (5) වන උපවගන්තියේ සඳහන් කටයුතු සිදුවීම මත එහි වෙළෙඳ සහභාගිකයන් කිසිවකුට එරෙහිව අවවාදයක් ලබා දෙනු ලබන, දඩයක් නියම කරනු ලබන, ඔහුගේ කටයුතු අත්හිටුවනු ලබන, ඔහු ඉවත් කරනු ලබන හෝ ඔහුට එරෙහිව වෙනත් යම් විනය පියවරක් පනවනු ලබන අවස්ථාවක, එම විනිමය ස්ථානය විසින් දින හතක් ඇතුළත පහත දැක්වෙන තොරතුරු ලිඛිතව කොමිෂන් සභාව වෙත ලබා දෙනු ලැබිය යුතු ය:-

(අ) වෙළෙඳ සහභාගිකයාගේ ව්‍යාපාරයේ නම සහ ලිපිනය;

(ආ) ගන්නා ලද ක්‍රියාමාර්ගය සඳහා වූ හේතුව සහ එම ක්‍රියාමාර්ගයේ ස්වභාවය;

(ඇ) වෙළෙඳ සහභාගිකයාගේ කටයුතු අත්හිටුවනු ලබන හෝ වෙළෙඳ සහභාගිකයාට එරෙහිව දඩයක් පනවා ඇත්නම්, එසේ ඔහුගේ කටයුතු අත්හිටුවන ලද කාලසීමාව සහ නියම කරන ලද දඩයේ ප්‍රමාණය; සහ

(ඈ) ගන්නා ලද වෙනත් යම් විනය පියවරක්.

විනිමය ස්ථානයක බලපත්‍රය අවලංගු කිරීම

**28.** (1) කොමිෂන් සභාව විසින්, -

(අ) ලිඛිත දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි, මේ පනතේ 26 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) ලිඛිත දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි, යම් පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම නතර කරන ලෙස හෝ යම් සේවාවන්

සැපයීම නතර කරන ලෙස හෝ එම විනිමය ස්ථානය වෙත විධාන කිරීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක් උද්ගත වන අවස්ථාවක, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුබසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි පරිදි නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වුවහොත් මිස, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම සිදු කරනු නොලැබිය යුතු යː-

(අ) විනිමය ස්ථානය විසින් සිය සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම නතර කරනු ලැබීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී විනිමය ස්ථානය ගණන් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(ඇ) විනිමය ස්ථානය විසින් එහි බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකර තිබීම හෝ මේ පනත යටතේ වන යම් වරදකට චෝදනා ලැබීම;

(ඈ) විනිමය ස්ථානය විසින්, මේ පනත යටතේ නිකුත් කරන ලද එහි බලපත්‍රයේ හෝ විධානයේ නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්ව තිබීම හෝ මේ පනත යටතේ වන යම් විධිවිධානයකට හෝ අවශ්‍යතාවයකට අනුකූලව කටයුතු කිරීමට අන්‍යාකාරයකින් අපොහොසත් වීම;

(ඉ) 26 වන වගන්තියේ කාර්ය සඳහා ලබා දෙන ලද යම් තොරතුරක වැදගත් කරුණක් අසත්‍ය ලෙස හෝ නොමඟ යවන සුලු ලෙස ලබා දී තිබීම හෝ එමගින් වැදගත් තොරතුරක් ලබා දීම පැහැර හැර තිබීම;

(ඊ) විනිමය ස්ථානයට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල ම හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොතිබීම;

(උ) විනිමය ස්ථානයේ යම් දේපළකට අදාළව හෝ යම් දේපළක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන යම් තැනැත්තකු පත් කර තිබීම;

(ඌ) විනිමය ස්ථානය විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී එහි ණය හිමියන් සමඟ, සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට එළඹ ඒවා ඉටුකර නොතිබීම; හෝ

(එ) විනිමය ස්ථානය විසින් එහි මෙහෙයවීම යටතේ, විනිමය ස්ථානයක් වශයෙන් වන එහි බලපත්‍රය අවලංගු කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබීම සහ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සිතන්නේ නම්.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා, යම් විනිමය ස්ථානයක් විසින්, කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන සති දෙකක් ඉක්ම වූ කාලසීමාවකට එම සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම නතර කර ඇති අවස්ථාවක, එම විනිමය ස්ථානය විසින් එහි සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් සිදු වුව ද, එය නොතකා-

(අ) විනිමය ස්ථානයේ මෙහෙයුම් නවතා දැමීමේ හෝ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති සේවාවන් සැපයීම නතර කිරීමේ කාර්යය සඳහා;

(ආ) ආයෝජකයන්ගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා; හෝ

(ඇ) මහජන සුබසිද්ධිය සඳහා,

කොමිෂන් සභාව විසින් දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එම අවලංගු කිරීමෙන් හෝ විධානයෙන් බලපෑමට ලක් වූ යම් ක්‍රියාකාරකම්, එම අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දින

සිට හෝ ඉන්පසුව දිගටම කරගෙන යාමට කොමිෂන් සභාව විසින් එම විනිමය ස්ථානයට අවසර දෙනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් යම් විනිමය ස්ථානයකට දිගටම කටයුතු කරගෙන යාම සඳහා අවසර ලබා දී ඇති අවස්ථාවක, එම අවසරයට අනුකූලව එහි කටයුතු කරගෙන යාම හේතුවෙන් එම විනිමය ස්ථානය විසින් (1) වන උපවගන්තිය කඩකර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳ අමාත්‍යවරයා වෙත දැන්වීමක් ලබා දී, අයෝජකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා හෝ මහජනයාගේ සුබසිද්ධිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන යම් පියවර ගනු ලැබිය හැකි ය.

(7) කරුණු ඉදිරිපත් කිරීම සඳහා විනිමය ස්ථානයට අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් විනිමය ස්ථානයක් විසින් එකී දැන්වීම ලැබුණු දින සිට දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ගොනු කර ඇති වුව ද, එය නොතකා, අමාත්‍යවරයාගේ තීරණය ලබා දෙන තෙක්, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් දිගටම බලාත්මක විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබූ විට දී, අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ සහ විනිමය ස්ථානයේ කරුණු ඉදිරිපත් කිරීම්වලට සවන් දීමෙන් පසු, එම අභියාචනය ලැබීමෙන් මාස තුනක කාලසීමාවක් ඇතුළත-

(අ) එම අභියාචනයට අවසර දී එම බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය අහෝසි කරන ලෙස කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකිය; හෝ

(ආ) එම අභියාචනයට අවසර නොදෙනු ලැබිය හැකි ය.

(11) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ තීරණය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(12) (11) වන උපවගන්තියට යටත්ව, කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ සිදුකරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

විනිමය ස්ථානයක බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම

**29.** 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ යම් විධානයක් නිකුත් කිරීමක්-

(අ) එම විනිමය ස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ 28 වන වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානය නිකුත් කිරීමට පෙරාතුව වුව ද, 28 වන වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන විට දී, බලපත්‍රය අවලංගු කළ හෝ විධානය නිකුත් කළ පසුව වුව ද එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැන නගින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

හදිසි අවස්ථාවක දී විනිමය ස්ථානය වසා දැමීම

**30.** (1) (අ) ශ්‍රී ලංකාව තුළ යම් හදිසි අවස්ථාවක් හෝ ස්වභාවික ආපදාවක් ඇතිවීම; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ආර්ථික හෝ මූල්‍යමය අර්බුදයක් හෝ ඒ හා සමාන වෙනත් යම් අවස්ථානුගත කරුණක් පැවතීම,

හේතුවෙන් සුරැකුම්පත් වෙළෙඳපොළෙහි සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම සඳහා විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් පැවතීම වැළැක්වෙමින් පවතින බව හෝ වැළැක්වීමට ඉඩ ඇති බව කොමිෂන් සභාවේ මතය වන විට, විනිමය ස්ථානය විමසීමෙන් පසු, කොමිෂන් සභාව විසින්, එහි සුරැකුම්පත් වෙළෙඳපොළ ව්‍යාපාරික දින පහක්

නොඉක්මවන කාලසීමාවක් සඳහා වසා දමන ලෙස විනිමය ස්ථානයට විධාන කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ වන සුරැකුම්පත් වෙළෙඳපොළ වසා දැමීම තවත් යම් කාලසීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි අතර එම එක් එක් කාලසීමාව වරක දී ව්‍යාපාරික දින පහක් නොඉක්මවනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද විධානයක, එම වසා දැමීම සඳහා වූ හේතු සහ (2) වන උපවගන්තිය යටතේ වන යම් වසා දැමීම දීර්ඝ කිරීමක්, එම දීර්ඝ කිරීම සඳහා වූ හේතු නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, විනිමය ස්ථානය වෙත (1) වන උපවගන්තිය යටතේ වන විධානයක හෝ (2) වන උපවගන්තිය යටතේ වන දීර්ඝ කිරීමක පිටපතක් ලබා දෙනු ලැබිය යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ වන විධානය හෝ (2) වන උපවගන්තිය යටතේ වන දීර්ඝ කිරීම බලාත්මකව පවතින තෙක් එම විධානය හෝ දීර්ඝ කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා එම විනිමය ස්ථානය විසින් සාධාරණ ලෙස ඉටු කරනු ලැබිය හැකි සියලු දේ කරන ලෙස එම විනිමය ස්ථානයට විධාන කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් මේ වගන්තිය යටතේ එහි බලය ක්‍රියාත්මක කරනු ලබන විට දී, මේ වගන්තිය යටතේ වන බලය ක්‍රියාත්මක කිරීම සඳහා වන හේතු දක්වමින් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත දැනුම්දීමක් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ -

"ව්‍යාපාරික දිනය" යන්නෙන්, වසා දැමීම සිදු නොවූයේ නම් විනිමය ස්ථානය තුළ නිල වශයෙන් වෙළෙඳාමක් පවතින යම් දිනයක් අදහස් වේ;

"සාධාරණ වෙළෙඳපොළ" යන්නට, සැපයුම් සහ ඉල්ලුම් බලවේග පෙන්නුම් කරනු ලබන වෙළෙඳපොළක් ඇතුළත් වේ.

බලපත්‍රලත් විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන්

**31.** (1) යම් විනිමය ස්ථානයක් විසින් එහි සුරැකුම්පත් එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමට තීරණය කරනු ලබන විට දී, එම විනිමය ස්ථානය විසින් ඒ සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) යම් විනිමය ස්ථානයක් විසින් එම විනිමය ස්ථානයේ අවශ්‍ය සියලු ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කර ඇති බවට සෑහීමට පත් වන විට දී, කොමිෂන් සභාව විසින්, එම විනිමය ස්ථානයට එහි සුරැකුම්පත් එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීම සඳහා අනුමතය ලබා දෙනු ලැබිය යුතු ය.

(3) එකී අනුමතය ලබාදුන් විට දී, එම විනිමය ස්ථානය විසින්-

(අ) එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමෙන් ඇති විය හැකි සම්බන්ධතා අතර ගැටුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා;

(ආ) එම විනිමය ස්ථානයේ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීමේ විශ්වසනීයත්වය සහතික කිරීමේ කාර්යය සඳහා; සහ

(ඇ) එම විනිමය ස්ථානය ලැයිස්තුගත සමාගමක් බවට පත් වුවහොත් ලැයිස්තුගත සමාගමක් ලෙස වන බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීම සඳහා,

කොමිෂන් සභාව විසින් අවශ්‍ය කරනු ලැබිය හැකි පරිදි යම් වැඩපිළිවෙළකට එළඹී එම අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන් මගින්-

(අ) එම විනිමය ස්ථානයේ නිල ලැයිස්තුවට එම විනිමය ස්ථානය ඇතුළත් කර ගැනීමට හෝ ඉන් එම විනිමය ස්ථානය ඉවත් කිරීමට;

(ආ) එම විනිමය ස්ථානයේ සුරැකුම්පත් එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීම හෝ වෙළෙඳාම් කිරීම නැවැත්වීමට හෝ අත්හිටුවීමට; හෝ

(ඇ) ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන් හෝ (1) වන උපවගන්තියේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් යෝග්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කරුණු පවත්වාගෙන යාමට,

අදාළව එම විනිමය ස්ථානය විසින් තීරණ ගැනීම සහ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට ඒ සඳහා කොමිෂන් සභාවට ඉඩ දෙනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ වන යම් වැඩපිළිවෙළක් මගින්, එම වැඩපිළිවෙළ යටතේ හෝ අන්‍යාකාරයකින් කොමිෂන් සභාව විසින් සපයනු ලබන සේවාවන් සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තු විනිමය ස්ථානය විසින් කොමිෂන් සභාවට ගෙවනු ලැබීම සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(6) යම් විනිමය ස්ථානයක රීති අනුමත කිරීම සඳහා හෝ සංශෝධනය කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතලවලට අගතියක් නොමැතිව, කොමිෂන් සභාව විසින්, ලිඛිත දැන්වීමක් මගින් -

(අ) එම විනිමය ස්ථානයේ සුරැකුම්පත් ලැයිස්තුගත කිරීමක් සඳහා හෝ වෙළෙඳාම් කිරීමක් සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය සඳහා එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන් මද වශයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) යම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයකින් එම විනිමය ස්ථානය නිදහස් කරනු ලැබිය හැකි ය.

2 වන පරිච්ඡේදය

**නිෂ්කාශනාගාරය**

**32.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පරිච්ඡේදයේ - අර්ථ නිරූපණය

"මධ්‍යම ප්‍රතිපාර්ශ්වය" යන්නෙන්, එක් එක් වෙළෙඳාම සඳහා ඇපවීම මගින් සෑම විකුණුම්කරුවකුට ම

ගැනුම්කරු වීමෙන් ද සෑම ගැනුම්කරුවකුටම විකුණුම්කරුවීමෙන් ද සුරැකුම්පත් වෙළෙඳපොළෙන් වෙළෙඳාම් නිෂ්කාශනය කිරීමෙහි සහ නිරවුල් කිරීමෙහි නිරත නෛතික තැනැත්තකු අදහස් වේ;

"පැහැර හැරීමේ නඩු කටයුතු" යන්නෙන්, නිෂ්කාශනාගාරයක් විසින් එහි පැහැර හැරීමේ රීති යටතේ පවරන ලද යම් නඩු කටයුතු හෝ ගන්නා ලද වෙනත් ක්‍රියාමාර්ග අදහස් වේ;

"පැහැර හැරීමේ රීති" යන්නෙන්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් සම්බන්ධයෙන් වන විට, යම් නිෂ්කාශන සාමාජිකයකු තමා පාර්ශ්වයක් වන්නා වූ යම් නිරවුල් නොකළ වෙළෙඳපොළ ගිවිසුම් සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් වන තම බැඳීම් ඉටු කිරීමට අපොහොසත්ව ඇත්නම්, පැහැර හැරීමේ නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබන යම් නිෂ්කාශනාගාරයක රීති අදහස් වේ;

"පැහැරහරින්නා" යන්නෙන්, යම් පැහැර හැරීමේ නඩු කටයුත්තකට යටත් වන්නා වූ නිෂ්කාශන සාමාජිකයකු අදහස් වේ;

"වෙළෙඳපොළ ගාස්තුව" යන්නෙන්-

(අ) යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් දරනු ලබන හෝ යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක තැන්පත් කළ, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවල නිශ්චිතව දක්වා ඇති යම් දේපළක් සම්බන්ධයෙන්; සහ

(ආ) වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීම සහතික කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරය සම්බන්ධයෙන් සෘජුව ම පැන නගින වගකීම් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා,

බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද ස්ථාවර හෝ චල ගාස්තුවක් අදහස් වේ;

"වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපය" යන්නෙන්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක වෙළෙඳපොළ ගිවිසුම් ඉටු කිරීම සහතික කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් සම්බන්ධයෙන් ඍජුවම පැන නගින වගකීම් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් එම බලපත්‍රය දරනු ලබන හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක තැන්පත් කරන ලද බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවල නිශ්චිතව දක්වා ඇති පරිදි වෙනත් යම් ආකාරයක සමපාර්ශ්වීය ඇපයක් ලෙස ලබා දෙන ලද යම් දේපළක් හෝ ඇපයක් අදහස් වේ;

"වෙළෙඳපොළ ගිවිසුම" යන්නෙන්, -

(අ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීතිවලට යටත් වන්නා වූ ද, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක නිෂ්කාශන පහසුකම භාවිත කරමින් ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ සහ නිරවුල් කිරීමේ කාර්යය සඳහා නවීකරණයක් ප්‍රකාරව එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන සාමාජිකයකු සමඟ එළඹෙන ලද්දා වූ ද ගිවිසුමක් අදහස් වේ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් නවීකරණයක් සිදු වුව ද නොවුව ද බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක නිෂ්කාශන පහසුකම භාවිත කරමින් නිෂ්කාශනය කරනු ලබන හෝ නිෂ්කාශනය කරනු ලැබිය යුතු හෝ නිරවුල් කරනු ලබන හෝ නිරවුල් කරනු ලැබිය යුතු ගනුදෙනුවක් අදහස් වේ;

"අදාළ ධුර දරන්නා" යන්නෙන් -

(අ) යම් සමාගමකට අදාළව, එහි ඈවරකරු, තාවකාලික ඈවරකරු, භාර ගැනුම්කරු හෝ

කළමනාකරු හෝ ඒ හා සමාන තැනැත්තකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු; හෝ

(ආ) වස්තුභංගත්වයකට අදාළ නඩු කටයුතු ප්‍රකාරව පත් කරන ලද යම් තැනැත්තකු,

අදහස් වේ.

**33.** විනිමය ස්ථානයක සිදුවන සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් පිහිටුවනු ලැබිය හැකි ය. විනිමය ස්ථානයක නිෂ්කාශනාගාරයක් පිහිටුවීම

**34.** (1) මේ පරිච්ඡේදය යටතේ නිෂ්කාශනාගාරයක් පිහිටුවීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් එම තැනැත්තා වෙත බලපත්‍රයක් ප්‍රදානය කර ඇත්නම් නම් මිස යම් තැනැත්තකු විසින් බලපත්‍රලත් විනිමය ස්ථානයක හෝ වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ හෝ නිරවුල් කිරීමේ කාර්යය සඳහා නිෂ්කාශන පහසුකමක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතු ය. බලපත්‍ර නොලත් නිෂ්කාශන පහසුකමක් පිහිටුවීමට එරෙහි තහනම

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ නිදහස් කරන ලද සුරැකුම්පත් සඳහා නිෂ්කාශන පහසුකම් සපයනු ලබන යම් තැනැත්තකු හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනන්‍ය වශයෙන් සපයනු ලබන යම් නිෂ්කාශන පහසුකමක් හෝ මේ පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි සුරැකුම්පත් නිරවුල් කිරීම සහ නිෂ්කාශනය කිරීම සඳහා විධිවිධාන සලස්වන ඒකාබද්ධ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක් ලෙස කටයුතු කරන නිෂ්කාශන පහසුකමක් සහ ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

**බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වන බලය**

**35.** (1) කොමිෂන් සභාව විසින්, එම බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව, නිෂ්කාශනාගාරයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලුම්කරුවකුට බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් නිසි පරිදි නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත් වන්නේ නම්, කොමිෂන් සභාව විසින් පනවන ලද නියම සහ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ බලපත්‍රයට අලුත් නියම සහ කොන්දේසි පැනවීම සිදු කරනු ලැබිය හැකි ය.

**නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම**

**36.** (1) බලපත්‍රලත් විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ සුරැකුම්පත් නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සහතික කිරීම සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක් ලෙස හෝ අන්‍යාකාරයකින් ක්‍රියාකරන නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමඟ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට සහ ආකෘතියකට අනුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් සංස්ථාවක් විසින් පමණක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේ දී, මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝගවල හෝ රීතිවල අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ එම ඉල්ලුම්කරු විසින් තහවුරු කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත් කිරීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු යම් ඉල්ලුම්කරුවකු විසින් සපයනු ලැබිය යුතු ය.

(4) (මෙහි මින් මතු "නිෂ්කාශන රීති" යනුවෙන් සඳහන් කරනු ලබන) එම නිෂ්කාශනාගාරයේ රීති මගින් -

(අ) එහි නිෂ්කාශන පහසුකම් මගින් නිෂ්කාශනය කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව කාර්යක්ෂම ලෙස නිෂ්කාශන පහසුකම් සැපයීම;

(ආ) නිෂ්කාශන සාමාජිකයන් විසින් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීති මගින් බැඳීමට එකඟ වනු ලබන්නේ යම් ගිවිසුම් යටතේ ද නිෂ්කාශන සාමාජිකයන් සමඟ එම ගිවිසුම්වලට එළඹීමේ අවශ්‍යතාව;

(ඇ) එසේ ඇතුළත් කර ගැනීම සඳහා වන විනිවිදභාවයෙන් යුත් සහ වෙනස් ලෙස නොසලකන සුලු උපමාන ඇතුළුව නිෂ්කාශනාගාරයකට නිෂ්කාශන සාමාජිකයන් ඇතුළත් කර ගැනීම;

(ඈ) එහි නිෂ්කාශන පහසුකම් භාවිත කරන නිෂ්කාශන සාමාජිකයන් සඵලදායී ලෙස නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඉ) නිෂ්කාශන සාමාජිකයන්ගෙන් ඇප හෝ සමපාර්ශ්වීය ඇප භාර ගැනීමට අදාළ කොන්දේසි සහ එම ඇප හෝ සමපාර්ශ්වීය ඇප කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම;

(ඊ) නිරවුල් කිරීමේ ඇප අරමුදලක් පිහිටුවීම සහ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම;

(උ) නිෂ්කාශන සාමාජිකයන්ගේ බැඳීම් සහ ප්‍රාග්ධනය, අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වන අවම අවශ්‍යතා;

(ඌ) (i) නිෂ්කාශනාගාරය සහ එහි නිෂ්කාශන සාමාජිකයන් අතර වන; සහ

(ii) නිෂ්කාශන සාමාජිකයන් අතර වන,

ආරාවුල් සාධාරණ ලෙස සහ කාර්යක්ෂම ලෙස නිරවුල් කිරීම;

(එ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් නිෂ්කාශන සාමාජිකයන් හට දඬ පැනවීම සඳහා වන බලතල හෝ අධිකාරී බලය ඇතුළුව නිෂ්කාශන සාමාජිකයන් ඉවත්

කිරීම, ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම, සහ ඔවුන් විනය පාලනයට යටත් කිරීම;

(ඒ) එහි පහසුකම් භාවිත කර නිෂ්කාශනය කළ හැකි හෝ නිරවුල් කළ හැකි සුරැකුම්පත් පන්තිය හෝ සුරැකුම්පත් පන්ති නිශ්චිතව දැක්වීම;

(ඔ) (i) නිෂ්කාශන රීති යටතේ වන සිය බැඳීම් ඉටු කිරීමට නිෂ්කාශන සාමාජිකයකු අපොහොසත්ව ඇත්තේ නම්, පැහැර හැරීමේ නඩු කටයුතු ආරම්භ කිරීම සහ සිය බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට හෝ නොහැකි වීමට ඉඩ ඇති බවට පෙනී යන නිෂ්කාශන සාමාජිකයකු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අවදානම් කළමනාකරණ කාර්යපටිපාටි;

(ii) පැහැර හරින නිෂ්කාශන සාමාජිකයකු පැහැර හැරීමක් සිදු කළ හෝ වස්තුභංගත්වයට පත්වූ අවස්ථාවක, එම සාමාජිකයා විසින් ලබා දෙන ලද ඇප හෝ සමපාර්ශ්වීය ඇප තැන්පත් කිරීම සහ ඒවා කාර්යක්ෂම ලෙස නිර්මාණය කිරීම සහ උපලබ්ධි කිරීම ඇතුළුව සමපාර්ශ්වීය ඇපය පාලනය කිරීම;

(iii) ඉහත (i) වන සහ (ii) වන අයිතමයන්ට අදාළ අවස්ථානුගත කරුණු යටතේ හෝ නිෂ්කාශනාගාරයක නුබුන්වත්භාවයට තර්ජනයක් ඇති කරනු ලබන වෙනත් යම් අවස්ථානුගත කරුණක් යටතේ නිෂ්කාශනාගාරයේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම, සඳහා පහසුකම් සැලසීම සඳහා පැහැර හැරීමේ රීති ඇතුළත් කිරීම;

(ඕ) නිරවුල් කිරීමේ නියෝග නිරවුල් කිරීමේ පද්ධතියට ඇතුළත් කරන අවස්ථාව සහ එම නියෝග අවසානාත්මක සහ අනහෝසිකර වන අවස්ථාව;

(ක) ප්‍රතිපාර්ශ්වය ආදේශ කිරීම සිදුවන අවස්ථාව;

(ග) ලාභ ලබා ගැනීමේ වැඩපිළිවෙළවල්, නිරවුල් කිරීම් අවසානතාව සහ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක් ලෙස කටයුතු කරන බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට අදාළ වෙනත් යම් බැඳීම්,

සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

**37.** (1) 35 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කර ඇති නිෂ්කාශනාගාරයක් විසින්- නිෂ්කාශනාගාරයක කාර්ය

(අ) සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ හෝ නිරවුල් කිරීමේ කාර්ය සඳහා, ආරක්ෂිත, කාර්යක්ෂම සහ ඵලදායී නිෂ්කාශන පහසුකමක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ආ) එහි ව්‍යාපාර සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කරනු ලැබිය යුතු ය;

(ඇ) එහි සේවාවන් භාවිත කර නිෂ්කාශනය කළ යුතු හෝ නිරවුල් කළ යුතු සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් භාර ගන්නා ලද මූල්‍යමය අවදානම්වලට අනුව ප්‍රමාණවත් මට්ටමක ප්‍රාග්ධනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඈ) එහි රීතිවල තහවුරු කරන ලද සීමා ඇතුළත සහ ආන්තික, ගාස්තු සහ සමපාර්ශ්වීය ඇප යන ආකාරයෙන් සහ එහි නිෂ්කාශන සාමාජිකයන්ගෙන් ලබා ගත යුතු ඇප සැලැස්ම ඇතුළත මූල්‍යමය වගකීම භාර ගනු ලැබිය යුතු ය;

(ඉ) දත්ත සැකසීමේ යටිතල පහසුකමක් සහ අවදානම් කළමනාකරණය සඳහා වන අභ්‍යන්තර විගණන ක්‍රම ඇතුළු වෙනත් අභ්‍යන්තර පාලනයන් පිහිටුවීම සහ පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඊ) ගිණුම්හිමියන්ගේ ඇප සහ වත්කම් බලපතුලත් නිෂ්කාශනාගාරයේ වත්කම්වලින් වෙන්ව තබා ගනු ලැබිය යුතු ය;

(උ) එහි නිෂ්කාශන සාමාජිකයන්ගෙන් ලබා ගත් ඇප හෝ වත්කම් තැන්පත් කරන ලද්දේ යම් කාර්ය සඳහා ද එම කාර්ය හැර වෙනත් කාර්ය සඳහා එම ඇප හෝ වත්කම් භාවිත කරනු නොලැබිය යුතු ය; සහ

(ඌ) ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සංස්ථානික අවදානම අවම කිරීම පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වමින් සෑමවිට දී ම මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක අධ්‍යක්ෂවරයකුගේ කාර්යය විය යුතු අතර, මේ පනත යටතේ වන කාර්යය සහ වෙනත් යම් නීතියක් යටතේ වන අධ්‍යක්ෂවරයකුගේ කාර්ය අතර ඝට්ටනයක් ඇති වූ අවස්ථාවක, මේ පනත යටතේ වන කාර්යය බලපැවැත්විය යුතු ය.

(3) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් සෑමවිටදී ම-

(අ) නිසි පරිදි විස්තර කරන ලද, විනිවිදභාවයෙන් යුක්ත වූ සහ ස්ථිර වගකීම් රේඛා සහිත පැහැදිලි සංවිධානාත්මක ව්‍යුහයක් ඇතුළත් ශක්තිමත් පාලන වැඩපිළිවෙළ, එයට මූණපාන්නට සිදුවන හෝ සිදුවිය හැකි අවදානම් හඳුනාගැනීමට, කළමනාකරණය කිරීමට, අධීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග සහ මනා පරිපාලන සහ ගිණුම් කාර්ය පටිපාටිය ඇතුළු ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ යෙදීම;

(ආ) මේ පනතට සහ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත්ව ඵලදායී වන ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි යොදා ගැනීම;

(ඇ) එහි සේවාවන් සහ කටයුතු සිදු කිරීමෙහි අඛණ්ඩතාව සහ විධිමත් ක්‍රියාකාරිත්වය සහතික කරනු ලබන සංවිධානාත්මක ව්‍යුහයක් පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සුදුසු සහ සමානුපාතික ක්‍රම, සම්පත් සහ කාර්යපටිපාටි යොදා ගැනීම;

(ඈ) අවදානම් කළමනාකරණය සඳහා වන වාර්තාකරණ පරිපාටිය සහ නිෂ්කාශනාගාරයේ අනෙකුත් මෙහෙයුම් සඳහා වන වාර්තාකරණ පරිපාටි අතර පැහැදිලි වෙන් කිරීමක් පවත්වාගෙන යාම;

(ඉ) පවත්වාගෙන යනු ලබන තොරතුරුවල විශ්වසනීයත්වය සහ රහස්‍යභාවය සහතික කිරීම සඳහා ඉහළ ප්‍රමිතීන්වල ආරක්ෂාවක් සහතික කිරීම සඳහා සිදු කරනු ලබන සේවාවන්වල සහ ක්‍රියාකාරකම්වල සංකීර්ණත්වය,

විවිධත්වය සහ වර්ගය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් වන තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වාගෙන යාම; සහ

(ඊ) එහි පාලන වැඩපිළිවෙළ බලපත්‍රලත් නිෂ්කාශනාගාරය පාලනය වන රීතී සහ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීමේ උපමාන මහජනයාට නොමිලේ ලබා ගැනීමට සැලැස්වීම,

සිදු කරනු ලැබිය යුතු ය.

බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය

**38.** මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පිරිනමන ලද බලතල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද රීති සහ එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ නියම සහ කොන්දේසිවලට අනුකූලව එහි කර්තව්‍ය භාරගෙන යන බවට කොමිෂන් සභාව සෑහීමට පත්වීම පිණිස යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් නියාමනය කිරීමට සහ අධීක්ෂණය කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

නිෂ්කාශනාගාරයක බලපත්‍රය අවලංගු කිරීම

**39.** (1) කොමිෂන් සභාව විසින්, ලිඛිත දැන්වීමක් මගින් -

(අ) එකී දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි 35 වන වගන්තිය යටතේ නිෂ්කාශනාගාරයකට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) එකී දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි යම් පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම නතර කරන ලෙස හෝ යම් සේවාවන් සැපයීම නතර කරන ලෙස හෝ එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට විධාන කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක් උද්ගත වන අවස්ථාවක, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුබසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය සහ නිරවුල් කිරීම නිසි පරිදි නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම් මිස, කොමිෂන්

සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම සිදු කරනු නොලැබිය යුතු යඃ-

(අ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන පහසුකම් සැපයීම නතර කරනු ලැබීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත බලපත්‍රලත් නිෂ්කාශනාගාරය ගණින් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(ඇ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් එහි බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකර තිබීම හෝ මේ පනත යටතේ වන යම් වරදකට චෝදනා ලැබීම;

(ඈ) බලපත්‍රපත් නිෂ්කාශනාගාරය විසින්, මේ පනත යටතේ නිකුත් කරන ලද එහි බලපත්‍රයේ අවශ්‍යතාවයේ හෝ විධානයේ යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්ව තිබීම හෝ මේ පනත යටතේ වන යම් විධිවිධානයකට හෝ අවශ්‍යතාවයකයට අනුකූලව කටයුතු කිරීමට අන්‍යාකාරයකින් අපොහොසත් වීම;

(ඉ) 36 වන වගන්තියේ කාර්ය සඳහා සපයන ලද යම් තොරතුරක වැදගත් කරුණක් අසත්‍ය ලෙස හෝ නොමඟ යවන සුලු ලෙස ලබා දී තිබීම හෝ එමගින් වැදගත් තොරතුරක් ලබාදීම පැහැර හැර තිබීම;

(ඊ) නිෂ්කාශනාගාරයට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොමැති වීම;

(උ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ යම් දේපළකට අදාළව හෝ ඒ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව තුළ හෝ පිටත, භාර ගැනුම්කරුවකු, භාරගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන යම් තැනැත්තකු පත් කර තිබීම;

(ඌ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත එහි ණයහිමියන් සමග සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට එළඹී තිබීම; හෝ

(එ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින්, එහි මෙහෙයවීම යටතේ, එය වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබීම.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා නිෂ්කාශනාගාරය විසින්, එසේ කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබානොගෙන සති දෙකක් ඉක්ම වූ කාලසීමාවකට එහි නිෂ්කාශන පහසුකම් සැපයීම නතර කර ඇති අවස්ථාවක, එම නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන පහසුකම් සැපයීම නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් සිදු වුව ද, එය නොතකා-

(අ) නිෂ්කාශනාගාරයේ මෙහෙයුම් නවතා දැමීමේ හෝ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති සේවාවන් සැපයීම නතර කිරීමේ; හෝ

(ආ) ආයෝජකයන් හෝ මහජන සුබසිද්ධිය ආරක්ෂා කිරීමේ,

කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින් දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එම අවලංගු කිරීමෙන් හෝ විධානයෙන් බලපෑමට ලක් වූ යම් ක්‍රියාකාරකම්, එම අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දින සිට හෝ එම දිනට පසුව දිගටම කරගෙන යාමට කොමිෂන් සභාව විසින් එම නිෂ්කාශනාගාරයට අවසර දෙනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, එය විසින් එසේ කිරීම අවශ්‍ය යැයි සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින්, අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරනු ලබන තෙක්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා මාස හයක කාලසීමාවකට අතුරු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකි අතර, එකී කාලසීමාව වසරක කාලයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(6) කරුණු ඉදිරිපත් කිරීම සඳහා නිෂ්කාශනාගාරයට අවස්ථාවක් ලබානොදී, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

**අකෘප්තියට පත් නිෂ්කාශනාගාරයක් විසින් අභියාචනයක් කරනු ලැබිය හැකි බව**

**40.** (1) 39 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයෙන් අතෘප්තියට පත් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින්, එම තීරණය පිළිබඳව නිෂ්කාශනාගාරයට දැනුම්දුන් දිනෙන් පසු දින දාහතරක් ඇතුළත, අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ගොනු කර ඇති වුව ද, එය නොතකා, අමාත්‍යවරයාගේ තීරණය ලබා දෙන තෙක් මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් දිගටම බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබූ විට දී, අමාත්‍යවරයා විසින්-

(අ) එම අභියාචනයට අවසර දී බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය අහෝසි කරන ලෙස කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම අභියාචනයට අවසර නොදෙනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාව විසින් (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගන්නා ලද තීරණය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියට යටත්ව, කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ සිදු කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

**නිෂ්කාශනාගාරයක බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම**

**41.** 39 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් -

(අ) එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරය මාර්ගයෙන් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ 39 වන වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානය නිකුත් කිරීමට පෙරාතුව වුව ද, 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වනවිට දී බලපත්‍රය අවලංගු කළ හෝ විධානය නිකුත් කළ පසුව වුව ද, එම

ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැන නඟින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

පැහැර හැරීමේ රීති

**42.** (1) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින්, අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, නිෂ්කාශන සාමාජිකයකුට තමා පාර්ශ්වයක් වන්නා වූ යම් නිරවුල් නොකළ වෙළෙඳපොළ ගිවිසුම් සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් වන බැඳීම් ඉටුකිරීමට නොහැකි වන්නේ නම් හෝ නොහැකි වීමට ඉඩ ඇත්නම්, පැහැර හැරීමේ රීති යටතේ පැහැර හැරීමේ නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක් ආරම්භ කරනු ලබන අවස්ථාවක එම පැහැර හරින්නා පාර්ශ්වයක් වන්නා වූ වෙළෙඳපොළ ගිවිසුම් නිරවුල් කිරීමේ කාර්ය සඳහා එහි නිෂ්කාශන රීති යටතේ ගන්නා ලද සියලු තදනන්තර නඩු කටයුතු හෝ වෙනත් ක්‍රියාමාර්ග එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ පැහැර හැරීමේ රීති යටතේ සිදුකර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ නඩු කටයුතු ආදිය ප්‍රමුඛ විය යුතු බව

**43.** (1) බුන්වත්භාවයට, වස්තුභංගත්වයට හෝ ගණන් බේරා වසා දැමීමට යටත් තැනැත්තකුගේ වත්කම්වලට හෝ භාරගැනුම්කරුවකු, භාරගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඈවරකරුවකු හෝ ඒ හා සමාන තත්ත්වයක තැනැත්තකුට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධාන සමඟ යම් අනනුකූලතාවක් තිබුණ ද, පහත දැක්වෙන කිසිවක් නීතියෙහිලා කිසිම ප්‍රමාණයකට අවලංගු නොවිය යුතු ය:-

(අ) වෙළෙඳපොළ ගිවිසුමක්;

(ආ) වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමට අදාළ නිෂ්කාශනාගාරයක රීති;

(ඇ) වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමට අදාළ නිෂ්කාශනාගාරයක රීති යටතේ ගන්නා ලද යම් නඩු කටයුත්තක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක්;

(ඇ) වෙළෙඳපොළ ගාස්තුවක්;

(ඉ) වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක්;

(ඊ) නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීති; හෝ

(උ) යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක්.

(2) (1) වන උපවගන්තියට යටත්ව, එම තනතුරේ කටයුතු කිරීමේ දී අදාළ ධුර දරන්නකු සතු බලතල සහ නුබුන්වත්භාවයට අදාළ නීතිය හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යම් අධිකරණයක් සතු බලතල-

(අ) නිෂ්කාශනාගාරයක රීතීවලට අනුකූලව වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීම; හෝ

(ආ) යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක්,

වළක්වන හෝ එයට බාධා කරන ආකාරයකින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

පැහැර හැරීමේ නඩු කටයුතුවලට අදාළ අතිරේක විධිවිධාන

**44.** 2007 අංක 7 දරන සමාගම් පනතේ ඇති කිසිවක් මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් යම් වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් උපලබ්ධි කිරීම සහ බැහැර කිරීම සඳහා පවරන ලද පැහැර හැරීමේ නඩු කටයුතු වැළැක්වීම හෝ ඒවාට බාධා කිරීම කරනු නොලැබිය යුතු ය.

පැහැර හැරීමේ නඩු කටයුත්තක් අවසන් වූ පසු වාර්තා කිරීමේ කාර්යය

**45.** (1) යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක් අවසන් වූ පසු, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා හෝ ආඥප්තිය වෙත එක් එක් පැහැරහරින්නා සම්බන්ධයෙන් වන වාර්තාවක් සපයනු ලැබිය යුතු යः-

(අ) පැහැරහරින්නා විසින් හෝ පැහැර හරින්නාට ගෙවිය යුතු බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් සහතික කරන ලද යම් ශුද්ධ මුදලක් ඇත්නම්, එම ශුද්ධ මුදල;

(ආ) කිසිදු මුදලක් එසේ පැහැරහරින්නාට නොගෙවිය යුතු බව; සහ

(ඇ) එය විසින් සුදුසු යැයි සිතනු ලබන පරිදි එම පැහැර හැරීමේ නඩු කටයුත්ත සම්බන්ධයෙන් වන වෙනත් යම් විස්තර.

(2) (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්තාවේ සහතික කළ පිටපතක් වහාම -

(අ) කොමිෂන් සභාවට;

(ආ) වාර්තාව අදාළ වන පැහැර හරින්නාට හෝ වාර්තාව අදාළ වන පැහැරහරින්නා වෙනුවෙන් කටයුතු කරනු ලබන අදාළ ධුර දරන්නාට හෝ එම පැහැරහරින්නාගේ බූදලය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නාට; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් යම් තැනැත්තකුට,

සපයනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් වාර්තාවක් පිළියෙල කර ඇති අවස්ථාවක, එම පැහැරහරින්නාගේ අදාළ ධුර දරන්නා විසින්, එම වාර්තාව අදාළ වන පැහැරහරින්නාගේ ණය හිමියන්ගේ අවධානය එය වෙත යොමුවීම පිණිස ඒ බවට දැන්වීමක් පළකරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය ප්‍රකාරව අදාළ ධුර දරන්නා වෙත හෝ පැහැරහරින්නා වෙත වාර්තාවක් ලද අවස්ථාවක, ඔහු විසින්, ඔහුගේ යම් ණය හිමියකුගේ ඉල්ලීම මත -

(අ) එම ඉල්ලීම ලැබීමෙන් දින දෙකක් ඇතුළත ණය හිමියාගේ පිරික්සුම සඳහා එම වාර්තාව ලබා ගැනීමට සැලැස්විය යුතු ය; හෝ

(ආ) අදාළ ධුර දරන්නා හෝ පැහැරහරින්නා විසින් තීරණය කරනු ලබන පරිදි අදාළ ගාස්තුවක් ගෙවීමෙන් පසු, ඉල්ලීම් කරන ලද පරිදි ණය හිමියාට එම වාර්තාවේ සහතික

කළ පිටපතක් හෝ ඉන් කොටසක් සපයනු ලැබිය යුතු ය.

පැහැර හැරීමේ නඩු කටයුතු අවසන් වූ පසු ගෙවිය යුතු ශුද්ධ මුදල

**46.** (1) පැහැර හැරීමේ නඩු කටයුතු අවසන් වූ පසු, 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් සහතික කරන ලද ශුද්ධ මුදල පැහැරහරින්නා විසින් හෝ පැහැරහරින්නා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, භාර ගැනුම්කරුවකු සඳහා හෝ ගණන් බේරා වසාදැමීමක් සඳහා නියෝගයක් සිදු කර ඇති අවස්ථාවක හෝ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සඳහා යෝජනාවක් සම්මත කර ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන් ශුද්ධ මුදල 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ වන ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතුවලට අදාළව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

ඇතැම් ගනුදෙනුවලින් ජනිත වන යම් මුදල් ප්‍රමාණ අයකර ගැනීම සඳහා අදාළ ධුර දරන්නා සතු අයිතිවාසිකම

**47.** (1) නිෂ්කාශන සාමාජිකයකු විසින් ("පළමුවන නිෂ්කාශන සාමාජිකයා") (3) වන උපවගන්තියේ විස්තර කරන ලද අවස්ථානුගත කරුණු යටතේ වෙනත් නිෂ්කාශන සාමාජිකයකුට ("දෙවන නිෂ්කාශන සාමාජිකයා") අධි අගයකට සුරැකුම්පත් විකුණන්නේ නම්, හෝ එම සාමාජිකයාගෙන් අඩු අගයකට සුරැකුම්පත් මිල දී ගන්නේ නම් සහ ඉන්පසු අදාළ ධුර දරන්නකු විසින්-

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයා;

(ආ) විකිණීමේ දී හෝ මිල දී ගැනීමේ දී දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා; හෝ

(ඇ) දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ හෝ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තාගේ බූදලය,

වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, අධිකරණයක් විසින් අන්‍යාකාරයකින් නියෝග කරනු ලැබුවහොත් මිස, අදාළ ධුර දරන්නා විසින්, පළමුවන නිෂ්කාශන සාමාජිකයාගෙන් හෝ පළමුවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාගෙන්, පළමුවන නිෂ්කාශන සාමාජිකයා හෝ පළමුවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් සිදු කරන

ලද විකිණීම හෝ මිල දී ගැනීම මගින් ලබා ගන්නා ලද හඳුනාගන්නා ලද ලාභයට සමාන මුදල් ප්‍රමාණයක් අය කර ගනු ලැබිය හැකි ය.

(2) විකිණීම හෝ මිල දී ගැනීම නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුව ඉටු කරනු ලැබ එය වෙළෙඳපොළ ගිවිසුමක් මගින් ප්‍රතියෝජනය කරනු ලැබ තිබුණ ද හඳුනාගත් ලාභයට සමාන මුදල් ප්‍රමාණය අයකර ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් විකිණීමක් හෝ මිල දී ගැනීමක් සඳහා වන අවස්ථානුගත කරුණු විය යුත්තේ -

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව හඳුනාගන්නා ලද සිදුවීමක් සිදුවී ඇති අවස්ථාවක්; සහ

(ආ) (i) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව හඳුනාගන්නා ලද සිදුවීමක් ඇතිවීමට ඉඩ තිබූ බව පළමුවන නිෂ්කාශන සාමාජිකයා දැන සිටි හෝ සාධාරණව දැන සිටීමට හැකිව තිබූ අවස්ථාවක්; හෝ

(ii) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට හඳුනාගන්නා ලද සිදුවීමක් සිදුවීමට ඉඩ තිබූ බව පළමුවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් දැන සිටියා වූ හෝ සාධාරණව දැන සිටීමට හැකිව තිබුණා වූ ද, විකිණීම හෝ මිල දී ගැනීමට එළඹෙන ලද දිනයට ඉක්බිතිව ම එළඹෙන මාස හයක කාලසීමාව ඇතුළත හඳුනාගන්නා ලද සිදුවීම සිදු වී ඇත්තා වූ අවස්ථාවක් යන අවස්ථා දෙකෙන් එක් අවස්ථාවක්,

වන්නේ ය.

(4) මේ වගන්තියේ -

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයකුට හෝ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකිණීමක් හෝ මිල දී ගැනීමක් සම්බන්ධයෙන් වන හෝ සම්බන්ධයෙන් වූ

තැනැත්තකුට අදාළව, "හඳුනාගන්නා ලද සිදුවීමක්" යන්නෙන් -

(i) අවස්ථාවෝචිත පරිදි, දෙවන නිෂ්කාශන සාමාජිකයා හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් සිදු කරන ලද වස්තුභංගත්ව ක්‍රියාවක්;

(ii) 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව කැඳවන ලද ණය හිමියන්ගේ රැස්වීමක්; හෝ

(iii) දෙවන නිෂ්කාශන සාමාජිකයා හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා ගණන් බේරා වසා දැමීම සඳහා අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීම,

අදහස් වේ;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකිණීමකට හෝ මිල දී ගැනීමකට අදාළව "හඳුනාගන්නා ලද ලාභය" යන්නෙන් -

(i) විකිණීමේ හෝ මිල දී ගැනීමේ විෂයය වන්නා වූ සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගයේ; සහ

(ii) විකිණීම හෝ මිල දී ගැනීමට එළඹුණු අවස්ථාවේ දී විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වන ප්‍රතිෂ්ටාවේ අගය,

අතර වෙනස අදහස් වේ.

ප්‍රධානයා ලෙස නිෂ්කාශන සාමාජිකයා ඇතැම් ගනුදෙනුවලට පාර්ශ්වයක් විය යුතු බව

**48.** වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, වෙළෙඳපොළ ගිවිසුමක් ඇතුළුව බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් සමඟ යම් ගනුදෙනුවකට එළඹෙන නිෂ්කාශන සාමාජිකයකු ඔහු එම ගිවිසුමට අනුයෝජිතයකු ලෙස පාර්ශ්වයක් වන්නේ ය යන්න නොතකා, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් හෝ එයට එරෙහිව වන සිවිල් නඩු කටයුත්තක්, හිමිකම්පෑමක් හෝ ඉල්ලීමක් ඇතුළු

සියලු කාර්ය සඳහා, එම ගනුදෙනුව සඳහා අනුයෝජිතයකු ලෙස නොව ප්‍රධානයකු ලෙස පාර්ශ්වයක් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

**නිෂ්කාශනාගාරයකට ලබාදෙන ලද වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපය**

**49.** වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව නිෂ්කාශන සාමාජිකයකු විසින් වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීම සඳහා හෝ වෙළෙඳපොළ ගාස්තුවක් යටතේ හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් ලබා දෙන ලද අවස්ථාවක දී, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට ලබා දෙන ලද එම වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයේ යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් සම්බන්ධයෙන් වන කිසිම සිවිල් නඩු කටයුත්තක්, හිමිකම්පෑමක් හෝ ඉල්ලීමක් එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයට එරෙහිව ගෙන ඒමට අවසර දෙනු නොලැබිය යුතු ය.

**වෙළෙඳපොළ ගාස්තුවකට යටත් සමපාර්ශ්වීය ඇපය අදාළ කර ගැනීම**

**50.** බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීතීවල නිශ්චිතව දක්වන ලද කාර්යපටිපාටියට අනුකූලව වෙළෙඳපොළ ගිවිසුමකට හෝ වෙළෙඳපොළ ගාස්තුවකට යටත් සමපාර්ශ්වීය ඇපය ක්‍රියාවෙහි යෙදවීමට බලපත්‍රලත් නිෂ්කාශනාගාරය හිමිකම් ලැබිය යුතු ය.

**නිරවුල් කිරීම සඳහා සුරැකුම්පත් මාරු කිරීම**

**51.** (1) අදාළ උපදෙස එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමේ හෝ වෙළෙඳපොළ ගිවිසුමක් සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් කටයුතු කිරීමේ කාර්ය සඳහා වන්නේ නම්, මධ්‍යම තැන්පතුගාරයක් විසින්, ගිණුම්හිමියකුගේ සුරැකුම්පත් ගිණුමක් තුළට හෝ ඉන් පිටතට සුරැකුම්පත් මාරුකිරීම සඳහා යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් ලබා දෙන ලද උපදෙසක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින්, (1) වන උපවගන්තිය යටතේ වෙළෙඳපොළ ගිවිසුමකට පාර්ශ්වයක් වන ගිණුම්හිමියකුට අදාළ වන හෝ නිෂ්කාශන සාමාජිකයෙක් පාර්ශ්වයක් බවට පත් වී ඇති වෙළෙඳපොළ ගිවිසුමක් ඇති කරනු ලබන වෙළෙඳාමක් සිදු කිරීමට නිෂ්කාශන සාමාජිකයකුට උපදෙස් ලබා දී ඇති ගිණුම්හිමියකුට අදාළ වන සුරැකුම්පත් ගිණුමකට අදාළව පමණක් (1) වන උපවගන්තිය යටතේ වන උපදෙසක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) මධ්‍යම තැන්පතුගාරය විසින්, (1) වන උපවගන්තිය ප්‍රකාරව ගිණුම් හිමියකුගේ සුරැකුම්පත් ගිණුමක් තුළට හෝ එම ගිණුමෙන් පිටතට වෙළෙඳපොළ ගිවිසුමක් ප්‍රකාරව යම් සුරැකුම්පත් මාරු කිරීමක් සිදු කරන ලද අවස්ථාවක, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීති යටතේ විධිවිධාන සලසා ඇති පරිදි මිස, එම සුරැකුම්පත්හි කිසිදු හිමිකමක් ගිණුම්හිමියකුට මාරු නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය ප්‍රකාරව ගිණුම්හිමියකුගේ සුරැකුම්පත් ගිණුමක් තුළට හෝ එම ගිණුමෙන් පිටතට සුරැකුම්පත් මාරු කිරීමක් සිදුකර ඇති අවස්ථාවක, ඒ ගිණුම්හිමියා විසින් ගෙන එන ලද නඩුකරයකට හෝ හිමිකම් පෑමකට හෝ ඒ ගිණුම් හිමියාට හා වන්දි ගෙවීමට මධ්‍යම තැන්පතුගාරය යටත් නොවිය යුතු ය.

සුරැකුම්පත් මිලට ගැනීම සහ විකිණීම

**52.** (1) අවස්ථාවෝචිත පරිදි, එම විකිණීම හෝ මිල දී ගැනීම යම් වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමේ හෝ පැහැර හැරීමේ නඩු කටයුතු සඳහා පහසුකම් සැලසීමේ හෝ යම් වෙළෙඳපොළ ගාස්තුවක අඩංගු වන යම් වත්කමක් හෝ වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් ලෙස සපයා ඇති යම් වත්කමක් උපලබ්ධි කිරීමට එම නිෂ්කාශනාගාරයට ඉඩ ලබාදීමේ කාර්ය සඳහා සිදු කරනු ලබන්නේ නම්, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරය වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමක් හෝ මිලට ගැනීමක් සිදු කරන ලෙස යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් යම් විනිමය ස්ථානයකට නියම කරනු ලැබිය හැකි අතර එම විනිමය ස්ථානය විසින් එම උපදෙස ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව විනිමය ස්ථානයක් විසින්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමක් හෝ මිලට ගැනීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, යම් තැනැත්තකු විසින් ගෙන එන ලද යම් නඩුකරයකට හෝ හිමිකම් පෑමකට හෝ විනිමය ස්ථානය යටත් නොවිය යුතු ය. තව ද, යම් තැනැත්තකුට හානි වන්දි ගෙවීමට ද යටත් නොවිය යුතු ය.

(3) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් සිදු කරන ලද යම් සුරැකුම්පත් නිෂ්කාශන කිරීමේ හෝ නිරවුල් කිරීමේ ගනුදෙනුවක් හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් වෙත සිදු කරන ලද යම් ගෙවීමක්, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ නිෂ්කාශනය කිරීමේ සහ නිරවුල් කිරීමේ රීතිවලට අනුකූලව මිස ප්‍රතිනමනය කරනු, නිෂ්ප්‍රභ කිරීම කරනු හෝ අවලංගු කිරීම කරනු නොලැබිය යුතු ය.

අපරාධ සහ සිවිල් වගකීමෙන් ආරක්ෂාව

**53.** (1) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීති යටතේ වන බලතල පැවරීම ප්‍රකාරව තම කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් හෝ ඒ බැඳීම ඉටු කිරීම හෝ කරන ලදැයි කියනු ලබන එම බැඳීම් ඉටු කිරීම අතරතුර හෝ ඒ හා සම්බන්ධයෙන් සාධාරණ සැලකිල්ලෙන් යුතුව සහ සද්භාවයෙන් යුතුව කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා යන්නට-

(අ) එම තැනැත්තාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු; සහ

(ආ) එම තැනැත්තා විසින් පිහිටුවන ලද යම් කමිටුවක යම් සාමාජිකයකු,

ඇතුළත් විය යුතු ය.

(3) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු යම් පැහැරහරින්නකුගේ යම් දේපළකට අදාළව යම් අදාළ ධුර දරන්නකු විසින් යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන්නා වූ ද, ඔහු එම ක්‍රියාමාර්ගය ගැනීමට හිමිකම් ලබන බවට අදාළ ධුර දරන්නා විසින්, සාධාරණව විශ්වාස කරනු ලබන්නා වූ හෝ එසේ විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු ඇත්තාවූ ද අවස්ථාවක, එකී අලාභය හෝ හානිය අදාළ ධුර දරන්නාගේ නොසැලකිල්ල හේතුවෙන් සිදු වූයේ නම් මිස, අදාළ ධුර දරන්නා විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් හේතුවෙන් ඇතිවන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් අදාළ ධුර දරන්නා විසින් යම් තැනැත්තකුට වගකියනු නොලැබිය යුතු ය.

## 3 වන පරිච්ඡේදය

### මධ්‍යම තැන්පතුගාරය

බලපත්‍ර නොලත් මධ්‍යම තැන්පතුගාරයක් ක්‍රියාත්මක කිරීමට එරෙහි තහනම

**54.** (1) යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම සුරැකුම්පත් යම් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති වුව ද, නැති වුව ද, යම් සුරැකුම්පත් හැසිරවීම සඳහා මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු, වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධානාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීමට යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය-

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ පිහිටුවනු ලබන මධ්‍යම තැන්පතුගාරයක්;

(ආ) ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන මධ්‍යම තැන්පතුගාරයක්; හෝ

(ඇ) කොමිෂන් සභාව විසින් නිදහස් කර ඇති යම් සුරැකුම්පත් නිකුත් කිරීමක් සඳහා මධ්‍යම තැන්පතුගාරයක් සපයන යම් තැනැත්තකු,

සඳහා අදාළ නොවිය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරයක් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම් කිරීම

**55.** (1) මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමඟ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට සහ ආකෘතියකට අනුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් සංස්ථාවක් විසින් පමණක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මධ්‍යම තැන්පතුගාරය විසින් -

(අ) සුරැකුම්පත් තැන්පත් කිරීම, දැරීම. ඉවත් කර ගැනීම, මාරුකිරීම සහ සුරැකුම්පත් ලේඛනයේ සටහන් කිරීම කරනු ලැබිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසි;

(ආ) තැන්පත් කරන ලද සුරැකුම්පත් ගනුදෙනු කිරීම් සැකසුම් කිරීම;

(ඇ) තැන්පත් කරන ලද සුරැකුම්පත් නිරවුල් කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඈ) ගිණුම්හිමියන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සහ තැන්පත් කරන ලද සුරැකුම්පත් පිළිබඳ තොරතුරු සහ ඒවායේ ගනුදෙනු කිරීම්වල ආරක්ෂාව සහ පාලනය;

(ඉ) තැන්පතුගාර සහභාගිකයන් ඇතුළත් කර ගැනීම සඳහා වන විනිවිදභාවයෙන් යුක්ත සහ වෙනස් ලෙස නොසලකන සුලු උපමාන සහ තැන්පතුගාර සහභාගික වර්ග;

(ඊ) තැන්පතුගාර සහභාගිකයන් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ ඉල්ලුම්කාර සමාගමේ රීති බලාත්මක කිරීම;

(උ) මධ්‍යම තැන්පතුගාරයේ රීතීවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් තැන්පතුගාර සහභාගිකයන් ඉවත් කිරීම, ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම, ඔවුන්ට දණ්ඩන නියම කිරීම හෝ ඔවුන් විනය පාලනයට යටත් කිරීම;

(ඌ) මධ්‍යම තැන්පතුගාරය සහ තැන්පතුගාර සහභාගිකයන් අතර සහ තැන්පතුගාර සහභාගිකයන් අතර වන ආරාවුල් නිරවුල් කිරීම; සහ

(එ) ආයෝජකයන්ට අයත් සුරැකුම්පත් තැන්පතුගාර සහභාගිකයන්ට අයත් සුරැකුම්පත්වලින් වෙන්ව තබා ගැනීම සහතික කිරීම,

සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන ඇති රීති සාදනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලුම්කරුවකු විසින්, ඉල්ලීමට අදාළව අවශ්‍ය වන්නේ යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(5) සෑමවිට දී ම යෝජිත මධ්‍යම තැන්පතුගාරය සතුව-

(අ) එහි ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රමාණවත් සහ නිසි පරිදි සූදානම් කර ඇති පරිශ්‍රයක්;

(ආ) එහි ව්‍යාපාර කටයුතු සඳහා දක්ෂ සේවක පිරිසක්; සහ

(ඇ) අවදානම් අවම කිරීම සඳහා සහ හදිසි අවස්ථාවලට මුහුණදීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවක්, ආරක්ෂක සැලසුම් සහ පහසුකම් සහිත ස්වයංක්‍රීය පද්ධතීන්,

සැපයීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍යමය, මානව සහ අනෙකුත් සම්පත් තිබිය යුතු ය.

(6) මහජන සුබසිද්ධිය උදෙසා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි පරිදි නියාමනය කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, එය විසින් සුදුසු යැයි සිතනු ලබන නියම හෝ කොන්දේසිවලට යටත්ව මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා, කොමිෂන් සභාව විසින් ඉල්ලුම්කරුට බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(7) (6) වන උපවගන්තියේ සඳහන් බලපත්‍රයට අදාළ නියම සහ කොන්දේසිවල ව්‍යාප්තිය සීමා නොකොට, කොමිෂන් සභාව විසින්, ආයෝජකයන්ගේ සුබසිද්ධිය උදෙසා හෝ මධ්‍යම තැන්පතුගාරයක් නිසි පරිදි නියාමනය කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම්, කොමිෂන් සභාව විසින්, පනවන ලද යම් නියම සහ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ අලුත් නියම සහ කොන්දේසි පැනවීම සිදු කරනු ලැබිය හැකි ය.

මධ්‍යම තැන්පතුගාරයක කාර්ය

**56.** (1) මධ්‍යම තැන්පතුගාරයක් විසින්-

(අ) සුරැකුම්පත් හැසිරවීම සඳහා සුරක්ෂිත, ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම;

(ආ) එහි ව්‍යාපාර සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම; සහ

(ඇ) ගිණුම්හිමියන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ගිණුම්හිමියන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා සෑමවිට දී ම කටයුතු කිරීම මධ්‍යම තැන්පතුගාරයක අධ්‍යක්ෂවරයකුගේ කාර්යය විය යුතු අතර එම කාර්යය සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ වන අධ්‍යක්ෂවරයකුගේ කාර්ය අතර සම්මතයක් ඇති වන අවස්ථාවක, මේ පනත යටතේ වන කාර්යය බලපැවැත්විය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරයක බලපත්‍රයක් අවලංගු කිරීම

**57.** (1) කොමිෂන් සභාව විසින්, ලිඛිත දැන්වීමක් මගින්-

(අ) එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි 55 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති යම් පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම නතර කරන ලෙස හෝ යම් සේවාවන් සැපයීම නතර කරන ලෙස මධ්‍යම තැන්පතුගාරයට විධාන කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක් උද්ගත වන අවස්ථාවක, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුබසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි පරිදි නියාමනය කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වුවහොත් මිස, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම කරනු නොලැබිය යුතු යː-

(අ) මධ්‍යම තැන්පතුගාරය විසින් සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීම සඳහා වන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම නතර කරනු ලැබීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත මධ්‍යම තැන්පතුගාරය ගණන් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(ඇ) මධ්‍යම තැන්පතුගාරය විසින්, එහි බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකර තිබීම හෝ මේ පනත යටතේ වන යම් වරදකට චෝදනා ලැබීම;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද කොන්දේසියකට, නියමයකට හෝ විධානයකට අනුකූලව කටයුතු කිරීමට මධ්‍යම තැන්පතුගාරය අපොහොසත් වීම;

(ඉ) 55 වන වගන්තියේ කාර්ය සඳහා ලබාදෙන ලද යම් තොරතුරක වැදගත් කරුණක් අසත්‍ය ලෙස හෝ නොමඟ යවනසුලු ලෙස ලබා දී තිබීම හෝ එමගින් වැදගත් තොරතුරක් ලබාදීම පැහැර හැර තිබීම;

(ඊ) මධ්‍යම තැන්පතුගාරයට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොතිබීම;

(උ) මධ්‍යම තැන්පතුගාරයේ යම් දේපළකට අදාළ හෝ යම් දේපළක් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන තැනැත්තකු පත්කර තිබීම;

(ඌ) මධ්‍යම තැන්පතුගාරය විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, එහි ණය හිමියන් සමඟ සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට එළඹී තිබීම; හෝ

(එ) මධ්‍යම තැන්පතුගාරය විසින් එහි සිය මෙහෙයවීම යටතේ, එයට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබීම සහ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සිතීම.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා, මධ්‍යම තැන්පතුගාරය විසින් කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන, සති දෙකක් ඉක්ම වූ කාලසීමාවකට සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීම සඳහා වන ක්‍රමය ක්‍රියාත්මක කිරීම නතර කර ඇති අවස්ථාවක, මධ්‍යම තැන්පතුගාරය විසින් සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීම සඳහා වන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් සිදු වුව ද, එය නොතකා-

(අ) මධ්‍යම තැන්පතුගාරයේ මෙහෙයුම් නවතා දැමීමේ හෝ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් සැපයීම නතර කිරීමේ කාර්යය සඳහා;

(ආ) තැන්පතුකරුවන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා; හෝ

(ඇ) මහජන සුබසිද්ධිය සඳහා,

දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එම අවලංගු කිරීම හෝ විධානය මගින් බලපෑමට ලක් වී ඇති යම් ක්‍රියාකාරකම්, එම අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දින සිට හෝ එම දිනට පසු දිගටම කරගෙන යාමට කොමිෂන් සභාව විසින් මධ්‍යම තැන්පතුගාරයට අවසර දෙනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, එය විසින්, එසේ කිරීම අවශ්‍ය යැයි සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින් අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරනු ලබන තෙක් මධ්‍යම තැන්පතුගාරයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා මාස හයක කාලසීමාවකට අතුරු අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකි අතර, එකී කාලසීමාව වසරක කාලයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දිගටම කටයුතු කරගෙන යාමට මධ්‍යම තැන්පතුගාරයට අවසරය ප්‍රදානය කර ඇති අවස්ථාවක, එම අවසරය අනුව එහි කටයුතු කරගෙන යාම හේතුවෙන්, මධ්‍යම තැන්පතුගාරය විසින්, (1) වන උපවගන්තිය කඩකර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) මධ්‍යම තැන්පතුගාරයට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණයකින් අතෘප්තියට පත් මධ්‍යම තැන්පතුගාරයක් විසින්, එම තීරණය පිළිබඳව එම මධ්‍යම තැන්පතුගාරයට දැනුම් දුන් දිනෙන්

පසු දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ගොනු කර ඇති වුව ද, එය නොතකා, අමාත්‍යවරයාගේ තීරණය ලබාදෙන තෙක්, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් දිගටම බලාත්මක විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබූ විට දී අමාත්‍යවරයා විසින් -

(අ) එම අභියාචනයට අවසර දී එම බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය අහෝසි කරන ලෙස කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම අභියාචනයට අවසර නොදෙනු ලැබිය හැකි ය.

(11) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ තීරණය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(12) (11) වන උපවගන්තියට යටත්ව කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ සිදු කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරයක බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම

**58.** 57 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක්-

(අ) මධ්‍යම තැන්පතුගාරය විසින් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ 57 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානය නිකුත් කිරීමට පෙරාතුව වුව ද, 57 වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක, බලපත්‍රය අවලංගු කළ හෝ විධානය නිකුත් කළ පසුව වුව ද, එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැනනගින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

සුරැකුම්පත් ගිණුම

**59.** මධ්‍යම තැන්පතුගාරයක් විසින් විවිධ වර්ගයන්හි සුරැකුම්පත් ගිණුම් පිහිටුවනු ලැබිය හැකි අතර, මධ්‍යම තැන්පතුගාරයේ විවෘත කරන ලද එවැනි සෑම සුරැකුම්පත් ගිණුමක්ම තැන්පත් කරන ලද සුරැකුම්පත්හි අර්ථලාභී හිමිකරුගේ නමින් හෝ නාමිකයකුගේ නමින් තිබිය යුතු ය. සුරැකුම්පත් ගිණුමක් නාමිකයකුගේ නමින් විවෘත කරනු ලබන විට දී, එම ගිණුම විවෘත කරන තැනැත්තා විසින් එහි අර්ථලාභී හිමිකරුගේ නම මධ්‍යම තැන්පතුගාරයට හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරයේ ගොනු කරන ලද සුරැකුම්පත්වල පොත් සටහන්

**60.** මධ්‍යම තැන්පතුගාරය විසින් දරනු ලබන සියලු සුරැකුම්පත් සම්බන්ධයෙන් වන ගනුදෙනු, කොටස්පත්‍ර භෞතිකව භාර නොදී, මධ්‍යම තැන්පතුගාරයේ ගිණුම්වල පොත් සටහන් යෙදීම මගින් සිදු කරනු ලැබිය යුතු ය.

තැන්පතුකරුගේ ගිණුමේ යොදන ලද සටහන්

**61.** මධ්‍යම තැන්පතුගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමක යොදන ලද සටහනක් එම කාරණයේ සත්‍යතාව සම්බන්ධයෙන් වන බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරය විසින් භාරයක් ලෙස දරනු ලබන සුරැකුම්පත්වල බලපෑම

**62.** (1) මධ්‍යම තැන්පතුගාරය විසින් එහි සුරැකුම්පත් දරන්නන් වෙනුවෙන් භාරයක් ලෙස සුරැකුම්පත් දරනු ලබන අවස්ථාවක, එම සුරැකුම්පත් භාරයක් ලෙස දරනු ලබන්නේ යම් තැනැත්තකුගේ අර්ථලාභය සඳහා ද, එම තැනැත්තා-

(අ) එකී සුරැකුම්පත් දරන්නා ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) ඔහු එම සුරැකුම්පත් දරන්නා වූවාක් මෙන්, අවස්ථාචෝචිත පරිදි, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ එම සුරැකුම්පත් සම්බන්ධයෙන් වන සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාදයන් භුක්ති විඳිය යුතු අතර, එම සුරැකුම්පත් සම්බන්ධයෙන් වන හෝ එම සුරැකුම්පත් මගින් පැන නගින සියලු වගකීම් සහ බැඳීම්වලට යටත් විය යුතු ය.

(2) නාමිකයකු විසින් දරනු ලබන මධ්‍යම තැන්පතුගාරයේ ගිණුම්වල පවත්වාගෙන යනු ලබන සුරැකුම්පත්වලට අදාළ අයිතිවාසිකම් සහ වගකීම්, මධ්‍යම තැන්පතුගාරයේ අදාළ ගිණුමෙහි හඳුනාගෙන ඇති අර්ථලාභී හිමිකරු විසින් ඔහු එම සුරැකුම්පත් දරන්නා වූවාක් මෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) තැන්පතුගාර සහභාගිකයකුගේ යම් බුන්වත්භාවය හෝ වස්තුභංගත්වයක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තකට අදාළව භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන තැනැත්තකු පත්කිරීම මගින් මධ්‍යම තැන්පතුගාරය විසින් භාරයක් ලෙස දරන එම තැන්පතුගාර සහභාගිකයාගේ සුරැකුම්පත් දරන්නන්ගේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුතු ය.

**63.** මේ පනත පැනවීමට පෙරාතුව මධ්‍යම තැන්පතුගාරය විසින් සිදු කරන ලද යම් සුරැකුම්පත් ලියාපදිංචි කිරීමක්, මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූල නොවන ලෙස සිදු කර තිබීම යන හේතුව මත පමණක් අවලංගු නොවිය යුතු ය. වලංගු කිරීම

4 වන පරිච්ඡේදය

**සාමාන්‍ය විධිවිධාන**

**64.** (1) වෙළෙඳපොළ ආයතනයක රීති, කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරන ලද රීති- වෙළෙඳපොළ ආයතනයක රීති

(අ) වෙළෙඳපොළ ආයතනය සහ එක් එක් සුරැකුම්පත් නිකුත් කරන්නා;

(ආ) වෙළෙඳපොළ ආයතනය සහ අවස්ථාවෝචිත පරිදි, එක් එක් වෙළෙඳ සහභාගිකයා, නිෂ්කාශන සාමාජිකයා හෝ තැන්පතුගාර සහභාගිකයා අතර;

(ඇ) එක් එක් සුරැකුම්පත් නිකුත්කරන්නකු සහ එක් එක් වෙළෙඳ සහභාගිකයා අතර; සහ

(ඈ) වෙළෙඳ සහභාගිකයන්, නිෂ්කාශන සාමාජිකයන් හෝ තැන්පතුගාර සහභාගිකයන් අතර,

වන අනුගම්‍ය ගිවිසුමක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(2) පිළිවෙළින් වෙළෙඳපොළ ආයතනය, එක් එක් සුරැකුම්පත් නිකුත්කරන්නා, එක් එක් වෙළෙඳ සහභාගිකයා, නිෂ්කාශන සාමාජිකයා සහ තැන්පතුගාර සහභාගිකයා විසින් එම රීතිවල විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි, එම වෙළෙඳපොළ ආයතනයට, සුරැකුම්පත් නිකුත්කරන්නාට, වෙළෙඳ සහභාගිකයාට, නිෂ්කාශන සාමාජිකයාට හෝ තැන්පතුගාර සහභාගිකයාට අදාළ වන තාක් දුරට එම රීතිවල විධිවිධාන යටතේ වන එම බැඳීම් පිළිපැදීම හෝ ඉටු කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති තාක් දුරට, වෙළෙඳපොළ ආයතනයක රීති, කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොමැතිව සංශෝධනය කරනු, වෙනස් කරනු හෝ පරිච්ඡින්න කරනු නොලැබිය යුතු ය.

(4) වෙළෙඳපොළ ආයතනයක් විසින් එහි රීති සංශෝධනය කිරීමට යෝජනා කරනු ලබන අවස්ථාවක, එම වෙළෙඳපොළ ආයතනය විසින් එම යෝජිත සංශෝධනය කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් එම වෙළෙඳපොළ ආයතනයට සවන් දීමෙන් පසු, යෝජිත සංශෝධනය ලැබී දින අනූවක් ඇතුළත, එම රීතිවලට කරනු ලබන සංශෝධන සඳහා–

(අ) අවසර දෙන්නේ ද;

(ආ) අවසර නොදෙන්නේ ද; හෝ

(ඇ) සංශෝධන, වෙනස් කිරීම් හෝ මද වශයෙන් වෙනස් කිරීම් සහිතව අවසර දෙන්නේ ද,

යන්න පිළිබඳව එම වෙළෙඳපොළ ආයතනය වෙත ලිඛිත දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

(6) යෝජිත සංශෝධනය සඳහා ඉඩ ලබා නොදෙන විට, කොමිෂන් සභාව විසින්, එකී අනනුමතය සඳහා හේතු ලබා දෙනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින් දින අනූවක් ඇතුළත වෙළෙඳපොළ ආයතනය වෙත ප්‍රත්‍යාවර්තනය කිරීමට අපොහොසත් වන අවස්ථාවක එකී දින අනූව අවසන් වූ වහාම (4) වන උපවගන්තිය යටතේ එකී රීතිවලට කිරීමට යෝජිත සංශෝධන බලාත්මක විය යුතු ය.

(8) (5) වන උපවගන්තිය යටතේ වන දැන්වීම ලැබුණු පසු, වෙළෙඳපොළ ආයතනය විසින් වහාම එකී රීතිය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(9) (5) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් ඕනෑම විටක දී යම් වෙළෙඳපොළ ආයතනයක රීතී සංශෝධනය කරනු ලැබිය හැකි අතර එකී රීතී වහාම බලාත්මක වන පරිදි ක්‍රියාත්මක විය යුතු ය. නැතහොත් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් දිනක සිට බලාත්මක විය යුතු ය.

**65.** (1) වෙළෙඳපොළ ආයතනයක රීතින්වලට අනුකූල කටයුතු කිරීම, එම රීති පිළිපැදීම, බලාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමකට යටත් යම් තැනැත්තකු එසේ කිරීමට අපොහොසත් වන අවස්ථාවක, එම වෙළෙඳපොළ ආයතනය විසින් එම කරුණ කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබූ පසු, කොමිෂන් සභාව විසින්, එම රීතිවලට අනුකූලව කටයුතු කරන ලෙස හෝ එසේ කිරීමට අපොහොසත්වීම සඳහා හේතු දක්වන ලෙස හෝ එම තැනැත්තාට විධාන කරනු ලැබිය යුතු ය.

වෙළෙඳපොළ ආයතනවල රීති පිළිපදින ලෙස හෝ බලාත්මක කරන ලෙස ආඥා කිරීමට අධිකරණයට ඇති බලය

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් දක්වනු ලැබූ හේතු පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවන අවස්ථාවක, එම රීතිවලට සහ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන්නා වූ ද කොමිෂන් සභාව විසින් ලබාදෙනු ලබන්නා වූ ද වෙනත් යම් විධානයකට අනුකූලව කටයුතු කරන ලෙස කොමිෂන් සභාව විසින් එම තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද කොමිෂන් සභාවේ විධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානයකට අනුකූලව කටයුතු කිරීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් , (2) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඉදිරියට කටයුතු කිරීම හෝ (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) අධිකරණය විසින්, වෙළෙඳපොළ ආයතනයක රීතිවලට අනුකූලව කටයුතු කරන ලෙස, එම රීති පිළිපදින ලෙස, බලාත්මක කරන ලෙස හෝ ක්‍රියාත්මක කරන ලෙස ඉහත සඳහන් තැනැත්තාට විධාන කර ආඥාවක් කරනු ලැබිය හැකි ය.

වෙළෙඳපොළ ආයතනයක සැලකිය යුතු කොටස්කරුවන් පාලනය

**66.** (1) රජයේ නියෝජිතයකු නොවන යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන, තනිව හෝ ඔහු සමඟ එක්ව ක්‍රියා කිරීමට සම්මුතියකට එළඹී ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තකු සමඟ හෝ යම් වෙළෙඳපොළ ආයතනයක මුළු ඡන්දබලය හිමි කොටස්වල එකතුවෙන් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන, යම් ඡන්දබලය හිමි කොටස් ප්‍රමාණයක් ලබාගැනීම සඳහා යම් ගිවිසුමකට හෝ සැලසුමකට එළඹෙනු නොලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නිශ්චිත සම්බන්ධතාවක් නියෝජනය කරනු ලබන තැනැත්තන් කණ්ඩායමක් විසින් ඍජුව හෝ වක්‍රව දරනු ලැබිය හැකි උපරිම ඡන්දබලය හිමි කොටස් සමානුපාතිකය පිළිබඳව කොමිෂන් සභාව විසින් සීමා පනවනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් ඕනෑම විටක දී ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කිරීම මගින් සුරැකුම්පත් වෙළෙඳපොළ වර්ධනයේ අදියර හෝ මහජන සුබසිද්ධිය පිළිබඳ සැලකිල්ලට ගැනීමෙන් පසු, (1) වන උපවගන්තියේ සඳහන් සීමාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන අනුමතය ලබා ගැනීමේ කාර්යය සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, මෙහි සඳහන් ඡන්දබලය හිමි කොටස් අත්කර ගැනීමට අදහස් කරන තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු

ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් කොමිෂන් සභාව වෙත එම ඉල්ලුම් පත්‍රය යවනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් -

(අ) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබා දෙන ලෙස; සහ

(ආ) ඉල්ලුම් පත්‍රයක් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් ඉල්ලුම්කරුගේ වියදමින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට අනුව සහ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් තැනැත්තන් මගින් සත්‍යායනය කරන ලෙස,

ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, පැනවීමට සුදුසු යැයි එය අදහස් කරන යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, එහි අනුමතය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

තහනමක් පැනවීමට මූලික නියෝගයක් කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය

**67.** (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ හෝ වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, එහෙත් මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් 66 වන වගන්තියේ විධිවිධාන කඩකරනු ලැබ ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, යම් කොටස්වලට අදාළව, එම කඩකිරීමේ අවස්ථානුගත කරුණු අනුව අදාළ විය හැකි හෝ සුදුසු විය හැකි පහත දැක්වෙන තහනම් කිරීම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පනවමින් විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය:-

(අ) එකී ඡන්දබලය හිමි කොටස් මිල දී ගැනීම හෝ මිල දී ගැනීම සඳහා වන ගිවිසුමක් හෝ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම හෝ නිකුත් නොකළ කොටස් සම්බන්ධයෙන් වන විට, නිකුත් නොකළ කොටස් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම මිල දී ගැනීම සඳහා වන ගිවිසුමක් හෝ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම හෝ එම අයිතිවාසිකම මිල දී ගැනීම තහනම් කිරීම;

(ආ) එකී කොටස්වලට අදාළව යම් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම තහනම් කිරීම;

(ඇ) එකී කොටස්වල අයිතිවාසිකම් අනුව හෝ එම කොටස් දරන්නන් වෙත සිදුකරනු ලැබූ යම් අර්පණයක් ප්‍රකාරව යම් වැඩිදුර කොටස් නිකුත් කිරීම තහනම් කිරීම; හෝ

(ඈ) ඈවර කිරීමේ දී හැර, ප්‍රාග්ධනය හෝ ලාභාංශ සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් එම කොටස් සඳහා, වෙළෙඳපොළ ආයතනය විසින් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම තහනම් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධානයක්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් (1) වන උපවගන්තිය කඩකරන ලද තැනැත්තා වෙත භාර දෙනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් සුදුසු යැයි අදහස් කරන ආකාරයකින් එය ප්‍රසිද්ධ කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධානයක් (1) වන උපවගන්තිය කඩකරන තැනැත්තකු, ඒ නියෝගය අදාළ වන ඡන්දහිමි කොටස් තත්කාලයේ දරන යම් තැනැත්තකු සහ එම විධානයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් තැනැත්තකු සඳහා අනුගම්‍ය විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කර ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද, එම තැනැත්තා විසින් හෝ එම විධානයේ අගතිගාමීව බලපෑමට ලක්වූ වෙනත් යම් තැනැත්තෙක් විසින්, එම විධානය භාර දී නිකුත් කරනු ලැබූ දින සිට දින දාහතරක් ඇතුළත, එම විධානය නිකුත් කර ඇත්තේ යම් විධිවිධානවලට අදාළව ද, එම විධිවිධාන තමා විසින් කඩ නොකළේය යන හේතුව මත එම විධානය අවලංගු කරන ලෙස හෝ එකී අභියාචනයේ නිශ්චිතව දක්වන හේතු මත එම විධානය වෙනස් කිරීම සාධාරණ සහ යෝග්‍ය වන්නේය යන හේතුවෙන් එම විධානය වෙනස් කරන ලෙස ඉල්ලා කොමිෂන් සභාව වෙත ලිඛිතව අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින්, එම ඉල්ලීම මගින් කරන ලද අභියාචනය සලකා බැලීමෙන් පසු, (4) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් ලැබුණු දින සිට දින හතලිස් පහක් ඇතුළත, එම

විධානය ස්ථිර කිරීම, අවලංගු කිරීම, හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානය ස්ථිර කරන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම විධානය අදාළ වන කොටස් දරන්නාට එම කොටස් බැහැර කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

(7) කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින්, ලබා දෙන ලද යම් තීරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ එම තීරණයට ආනුෂංගික, උපසේවී හෝ ආනුෂංගික විය හැකි යම් උපදෙසක් හෝ විධානයක් වෙළෙඳපොළ ආයතනයේ අධ්‍යක්ෂවරුන්ට හෝ නිලධරයන් වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(8) කොමිෂන් සභාව විසින් (5) වන උපවගන්තිය යටතේ නිකුත් කර ලද යම් විධානයක් හෝ ලබාදෙන ලද යම් තීරණයක් හෝ (7) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද යම් උපදෙසක් හෝ නිකුත් කරන ලද යම් විධානයක් කඩකරන්නා වූ යම් කොටස්වලට අදාළ ගිවිසුමක් හෝ සැලැසුමක් ඇතුළු යම් ගනුදෙනුවක් නීතිය අනුව බලරහිත වන්නේ ය.

(9) (5) වන උපවගන්තිය යටතේ ලබාදුන් යම් විධානයක් හෝ තීරණයක් හෝ (7) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද යම් උපදෙසක් හෝ නිකුත් කරන ලද යම් විධානයක් කඩකරන යම් තැනැත්තකු, වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වෙළෙඳපොළ ආයතනයකට අධ්‍යක්ෂවරුන් පත්කිරීම

**68.** (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ඇතිව මිස, යම් තැනැත්තකු විසින්, වෙළෙඳපොළ ආයතනයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු ලෙස කරන ලද පත්කිරීමක්, නැවත පත් කිරීමක්, තෝරා පත්කර ගැනීමක් හෝ නැවත තෝරා පත්කර ගැනීමක් භාර ගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ අනුමතය අවශ්‍ය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි-

(අ) යම් යෝජිත අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිදහස් නොකළ වස්තුභංගත්වයට පත්වූවකු නම්;

(ආ) යෝජිත අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායක නිලධරයාට හෝ ප්‍රධාන නියාමන නිලධරයාට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොමැති නම්;

(ඇ) යෝජිත අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන නියාමන නිලධරයා-

(i) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී වංචාවක් හෝ වංකභාවයක් සම්බන්ධයෙන් වන වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම් හෝ එම වරදකට වරදකරු කරනු ලැබීමට ඔහු වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියාකර ඇති බවට වූ තීරණයක් ඇතුළත්ව ඇත්නම් ;

(ii) මේ පනත යටතේ වන වරදකට වරදකරුවකු කරනු ලැබ ඇත්නම්;

(iii) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් පරිපාලන ක්‍රියාමාර්ගයකට යටත්ව ඇත්නම්;

(iv) චරිත දූෂණය සම්බන්ධයෙන් වූ වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්; හෝ

(v) සම්බන්ධතා අතර ගැටුමක් ඇති වීමට ඉඩ ඇත්නම්;

(ඈ) වෙළෙඳපොළ ආයතනයක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු වීමට, (3) වන උපවගන්තියේ අර්ථ නිරූපණය කර ඇති

පරිදි යෝජිත අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන නියාමන නිලධරයා විශ්වසනීයත්වය හෝ කීර්තිය ඇති තැනැත්තකු බවට ද, සුදුසු සහ යෝග්‍ය බවට ද කොමිෂන් සභාව සෑහීමට පත් නොවන්නේ නම්,

කොමිෂන් සභාව විසින් එම අනුමතය ලබා දෙනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනයක යෝජිත අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකුගේ පත් කිරීම අනුමත කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, වෙනත් කරුණු අතර පහත සඳහන් උපමාන සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුගිය කාර්ය සාධනයක් හෝ නිපුණතාවක් එම තැනැත්තා සතුවීම;

(ආ) කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන ක්‍රියා අවබෝධ කරගැනීමට, මෙහෙයවීමට සහ කළමනාකරණය කිරීමට සුදුසු කුසලතා පරාසයක් සහ පළපුරුද්දක් එම තැනැත්තා සතුවීම; සහ

(ඇ) පිළිගත් වෘත්තීය සුදුසුකම් සහ අදාළ වෘත්තීය ආයතනයන්හි සාමාජිකත්වය ඇතුළුව ඔවුන් නියැලෙන නිශ්චිත කාර්ය සිදු කිරීමට තාක්ෂණික දැනුම සහ හැකියාව එම තැනැත්තා සතුවීම.

(4) යම් තැනැත්තකු විසින්, මේ පනතේ යම් විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකර ඇත්නම්, එම තැනැත්තා විසින් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු ලෙස ධුරය දරනු නොලැබිය යුතු ය.

(5) (2) වන සහ (3) වන උපවගන්තිවල අධ්‍යක්ෂවරුන් පත් කිරීම සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති උපමාන කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනයක කළමනාකරුවකු හෝ පාලකවරයකු පත් කිරීම සඳහා, අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කර ගත යුතු ය.

වෙළෙඳපොළ ආයතනයක වැදගත් තොරතුරු වෙනස් කිරීම

**69.** යම් වෙළෙඳපොළ ආයතනයක් විසින් එහි සාංගමික ව්‍යවස්ථාවලිය හෝ ඒ වන විට සපයා ඇති වෙනත් යම් වැදගත් තොරතුරු වෙනස් කිරීමට යෝජනා කරනු ලබන්නා වූ හෝ ඉල්ලුම් පත්‍රයෙහි හෝ බලපත්‍රය අලුත් කිරීමෙහි නිශ්චිතව දක්වා ඇති තත්ත්වයේ වෙනසක් සිදු කරනු ලබන්නා වූ හෝ වෙනසක් සිදු කිරීමට අදහස් කරනු ලබන්නා වූ  අවස්ථාවක, එම වෙනස් කිරීම හෝ වෙනස සිදු කිරීමට පෙරාතුව එම වෙළෙඳපොළ ආයතනය විසින් ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

විනිමය ස්ථානයක හෝ නිෂ්කාශනාගාරයක අයිතිවාසිකම්

**70.** ගිවිසුම්වලට අදාළ යම් ලිඛිත නීතියක සඳහන් කිසිවක් මගින්, එය මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට අනනුකූල වන තාක්දුරට-

(අ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග, රීති හෝ විධාන යටතේ සුරැකුම්පත්වලට අදාළව විනිමය ස්ථානයක් හෝ නිෂ්කාශනාගාරයක් වෙත පැවරෙන යම් අයිතිවාසිකම්;

(ආ) අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ, ඒ යටතේ සාදනු ලබන යම් නියෝග, රීති හෝ විධාන යටතේ හෝ විනිමය ස්ථානයක හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක හෝ බලපත්‍රලත් මධ්‍යම තැන්පතුගාරයක රීතී යටතේ විනිමය ස්ථානයක් විසින් එළඹෙන ලද සුරැකුම්පත් ගනුදෙනුවක පාර්ශ්වයක් වෙත පැවරෙන යම් අයිතිවාසිකම්; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන  ලද යම් නියෝග, රීති හෝ විධාන යටතේ විනිමය ස්ථානයක් විසින් හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් හෝ බලපත්‍රලත් මධ්‍යම තැන්පතුගාරයක් විසින් එළඹෙනු ලැබූ සුරැකුම්පත් ගනුදෙනුවක් යටතේ හෝ ඊට අදාළව කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක්,

සඳහා බලපෑමක් නොවිය යුතු ය.

අපරාධ හෝ සිවිල් වගකීමෙන් ආරක්ෂාව

**71.** (අ) විනිමය ස්ථානයක් විසින්; හෝ

(ආ) (i) විනිමය ස්ථානයක යම් අධ්‍යක්ෂවරයෙක්; හෝ

(ii) විනිමය ස්ථානයක් විසින් පිහිටුවනු ලැබූ යම් කමිටුවක යම් සාමාජිකයෙක්,

ඇතුළුව විනිමය ස්ථානයක් වෙනුවෙන් ක්‍රියාකරන යම් තැනැත්තෙක් විසින්,

සිදු කරන ලද හෝ නොකරන හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් වන අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී, එම විනිමය ස්ථානය විසින් හෝ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තා විසින් මේ පනත යටතේ, ඒ යටතේ සාදන ලද නියෝග, රීතී හෝ විධාන යටතේ හෝ එකී විනිමය ස්ථානයේ රීතී යටතේ වන එහි බැඳීම් ඉටුකිරීම හෝ කරන ලදැයි කියනු ලබන එහි බැඳීම් ඉටු කිරීමක් අතරතුර හෝ ඒ හා සම්බන්ධයෙන් සියලු සාධාරණ සැලකිල්ල දක්වනු ලැබූ බව ද, සද්භාවයෙන් ක්‍රියා කරනු ලැබූ බව ද ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

කොමිෂන් සභාවට සහාය ලබා දීම

**72.** (1) වෙළෙඳපොළ ආයතනයක් විසින්, කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව වෙනුවෙන් කටයුතු කරන තැනැත්තකුට හෝ කොමිෂන් සභාවේ අධිකාරී බලය සහිත තැනැත්තකුට, මේ පනතේ මනා පරිපාලනය උදෙසා කොමිෂන් සභාවට හෝ එකී තැනැත්තාට අවශ්‍ය විය හැකි වෙළෙඳපොළ ආයතනයේ මෙහෙයුම්වලට අදාළ යම් වාර්තා ඉදිරිපත් කිරීම සහ යම් තොරතුරු සැපයීම ඇතුළුව කොමිෂන් සභාවට හෝ එකී තැනැත්තාට සාධාරණව අවශ්‍ය යම් සහායක් ලබා දෙනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින් බලය ලබාදෙනු ලැබූ තැනැත්තකු මේ පනතේ යම් කාර්යයක් සඳහා විනිමය ස්ථානයක ව්‍යාපාර පහසුකමට සියලු සාධාරණ වේලාවන් හී දී සම්පූර්ණ ලෙස සහ නිදහස් ලෙස ප්‍රවේශවීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) නීත්‍යනුකූල අවසරයක් නොමැතිව කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියා කරන හෝ කොමිෂන් සභාව විසින් බලය ලබාදෙනු ලැබූ තැනැත්තකුට (2) වන උපවගන්තියට අනුකූලව විනිමය ස්ථානයක ව්‍යාපාර වෙළෙඳ පහසුකමට, ප්‍රවේශවීමට, ඉඩලබාදීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ කිරීමට අපොහොසත් වන තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

**73.** (1) වෙළෙඳපොළ ආයතනයක් විසින්, එහි ශේෂ පත්‍රයේ දිනයේ සිට මාස පහක් ඇතුළත පහත සඳහන් කරුණු ඇතුළත් වාර්ෂික වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:- වාර්ෂික වාර්තා

(අ) වෙළෙඳපොළ ආයතනයේ සංස්ථාමය පාලන ප්‍රතිපත්ති පිළිබඳ වාර්තාවක් සහ කොමිෂන් සභාව විසින් නියම කරන ලද වෙනත් යම් තොරතුරක්;

(ආ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සාදන ලද විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ රීතිවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි එවැනි වෙනත් අවශ්‍යතාවන්; සහ

(ඇ) සුදුසු විට දී, වෙළෙඳපොළ ආයතනය පාලක සමාගමක් හෝ පාලිත සමාගමක් වන අවස්ථාවක දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්ෂික වාර්තාවක ඇතුළත් විය යුතු මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) බලයලත් නිෂ්කාශනාගාරයක සහ මධ්‍යම තැන්පතුගාරයක වාර්ෂික වාර්තාවට අවදානම් කළමනාකරණ කාර්යපටිපාටිය සහ ඒවා අදාළ කරගැනීම, සහ කොමිෂන් සභාව විසින් නියම කරන ලද වෙනත් යම් තොරතුරු ද ඇතුළත් විය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ වාර්ෂිත වාර්තාවකට ඇතුළත් කරනු ලැබිය යුතු තොරතුරු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නියම කරන ලද තොරතුරුවලට අමතරව විය යුතු ය.

**74.** (1) වෙළෙඳපොළ ආයතනයක විගණකවරයකුට ඔහුගේ කාර්ය සාමාන්‍ය පරිදි ඉටු කිරීමේ දී - වෙළෙඳපොළ ආයතනයක විගණකවරයකුගේ කාර්ය

(අ) ඔහුගේ මතයට අනුව, වෙළෙඳපොළ ආයතනයේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු ප්‍රමාණයකට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑ හැකි යම් කරුණක්;

PL 012486
WS 1 -
3



(ආ) ඔහුගේ මතයට අනුව, මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් සංයුක්ත වන හෝ කඩකිරීමක් සංයුක්ත විය හැකි, ලැබිය හැකි හෝ සැලකිය යුතු ප්‍රමාණයකට වෙළෙඳපොළ ආයතනයේ මූල්‍ය ස්ථායීතාවට බලපාන වංචාව හෝ වංචනිකභාවය හා සම්බන්ධ වූ යම් වරදක් සංයුක්ත වන හෝ සංයුක්ත විය හැකි යම් කරුණක්; හෝ

(ඇ) සුරැකුම්පත්වල ආයෝජකයන්ගේ අරමුදල් හෝ දේපළවලට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑ හැකි යම් අක්‍රමිකතාවක් ඇතුළුව වෙළෙඳපොළ ආයතනයක ගිණුම්වලට සැලකිය යුතු බලපෑමක් ඇති හෝ ඇති විය හැකි යම් අක්‍රමිකතාවක්,

පිළිබඳ දැනගැනීමට ලැබුණු විට, එම විගණකවරයා විසින් වහාම එම කාරණය පිළිබඳ හෝ අක්‍රමිකතාව පිළිබඳ ලිඛිත වාර්තාවක්, කොමිෂන් සභාවට පිටපතක් සහිතව, අධ්‍යක්ෂ මණ්ඩලයට නොපමාව යවනු ලැබිය යුතු ය.

(2) වෙළෙඳපොළ ආයතනයක විගණකවරයෙක්, සද්භාවයෙන් ක්‍රියාකරනු ලැබ ඇත්නම්, එම විගණකවරයා (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ වාර්තාව තුළ සිදු කරන ලද යම් ප්‍රකාශයකට අදාළව යම් තැනැත්තෙක් විසින් පවරනු ලබන යම් සිවිල් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය මගින්, මේ වගන්තියට පරිබාහිරව, වෙළෙඳපොළ ආයතනය විගණකවරයාට අපහාස නඩුවක විත්තිකරු වශයෙන් තිබිය හැකි යම් අයිතිවාසිකමක්, වරප්‍රසාදයක් හෝ මුක්තියක් සීමා නොවිය යුතු ය. ඊට බලපෑමක් නොවිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනයක විගණකවරයා වෙත පහත දැක්වෙන කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් නියම කරනු ලැබිය හැකි ය:-

(අ) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන විගණකවරයාගේ විගණනයට අදාළ යම් අමතර තොරතුරු සහ වාර්තා ඉදිරිපත් කිරීමේ කාර්යය;

(ආ) වෙළෙඳපොළ ආයතනයේ ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් වන ඔහුගේ විගණනයේ විෂයපථය විශාලනය කිරීමේ, දීර්ඝ කිරීමේ හෝ වෙනස් කිරීමේ කාර්යය;

(ඇ) යම් විශේෂ අවස්ථාවක දී වෙනත් යම් විභාගයක් ක්‍රියාවට නැංවීමේ හෝ යම් කාර්යපටිපාටියක් පිහිටුවීමේ කාර්යය; හෝ

(ඈ) (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන්, ඔහුගේ විගණනය, විභාගය හෝ කාර්යපටිපාටිය පිහිටුවීමෙන් පැන නගින යම් කරුණක් සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදීමේ කාර්යය සහ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ස්වාධීන මතයක් නිකුත් කිරීම සඳහා වන ඔහුගේ සාමාන්‍ය විගණන විෂය පථය දීර්ඝ කිරීමක් ලෙස විගණකවරයා විසින් එකී කාර්ය ක්‍රියාවට නංවනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් ඔහු විසින් ඉටුකිරීමට අදාළව, කොමිෂන් සභාව විසින් පළකරනු ලබන ගාස්තු උපලේඛනය ප්‍රකාරව, වෙළෙඳපොළ ආයතනය විසින් විගණකවරයාට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර වැඩිදුර විමර්ශනයක් සිදු කිරීම අවශ්‍ය වන අවස්ථානුගත කරුණුවල දී කොමිෂන් සභාවේ අරමුදලින් විගණකවරුන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

කාලානුරූපී වාර්තා ඉදිරිපත් කිරීමට ඇති වගකීම

**75.** වෙළෙඳපොළ ආයතනයක් විසින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකෘතියකට, ආකාරයකට සහ වාර ගණනකට අනුව කළමනාකරණ විගණනයක් ඇතුළු යම් වාර්තා කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද, කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කරනු ලබන විධාන, මේ පනතේ විධිවිධාන, රීති හා නියෝග සම්බන්ධයෙන් අනුකූල වීම නිශ්චය කර ගැනීම සඳහා, කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනය, සුපරීක්ෂාවට සහ වාර්ෂික විගණනයට යටත් කළ යුතු ය.

වාර්ෂික ගාස්තු ගෙවීම

**76.** වෙළෙඳපොළ ආයතනයක් විසින්, නියම කරනු ලැබිය හැකි යම් වාර්ෂික ගාස්තුවක් කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

පෙනී සිටීම සම්බන්ධයෙන් වන තහනම

**77.** (1) යම් තැනැත්තකු විසින් කොටස් විනිමය ස්ථානයක්, ව්‍යුත්පන්න විනිමය ස්ථානයක්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් ලෙස පෙනී සිටිනු නොලැබිය යුතු අතර "කොටස් විනිමය ස්ථානය", "ව්‍යුත්පන්න විනිමය ස්ථානය", "අනාගතයන් විනිමය ස්ථානය", "කොටස් වෙළෙඳපොළ", "ව්‍යුත්පන්න වෙළෙඳපොළ", "අනාගතයන් වෙළෙඳපොළ", "බලපත්‍රලත් නිෂ්කාශනාගාරය", "නිෂ්කාශන පහසුකම", "මධ්‍යම තැන්පතුගාරය", "සුරැකුම්පත් ව්‍යාපාර වෙළෙඳපොළ", "ව්‍යුත්පන්න ව්‍යාපාර වෙළෙඳපොළ" හෝ "අනාගතයන් ව්‍යාපාර වෙළෙඳපොළ" යන නාමය, ශීර්ෂය හෝ විස්තරය ලබාගැනීම හෝ භාවිත කිරීම හෝ සඳහනකින් යොදාගැනීම කරනු නොලැබිය යුතු අතර, එම තැනැත්තා, කොටස් විනිමය ස්ථානයක්, ව්‍යුත්පන්න විනිමය ස්ථානයක්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් වන්නේය යන අදහස අඟවන හෝ එම අදහස ඇති කිරීමට නැඹුරු කරවන යම් නාමයක්, ශීර්ෂයක් හෝ විස්තරයක්, ලබාගැනීම හෝ භාවිත කිරීම හෝ යම් ස්ථානයක ඇලවීම හෝ ප්‍රදර්ශනය කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

එහි තීරණයක් සමාලෝචනය කිරීමට කොමිෂන් සභාව සතු බලය

**78.** (1) කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඔහුට එම තීරණය පිළිබඳ දැනුම් දුන් දිනෙන් පසු දින තිහක් ඇතුළත එම තීරණය සමාලෝචනය කරන ලෙස කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) එම ඉල්ලීම ලැබුණු දින සිට දින අනූවක් නොඉක්මවන කාලසීමාවක දී කොමිෂන් සභාව විසින් එහි තීරණය ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

## III වන කොටස

## සුරැකුම්පත් නිකුත් කිරීම

මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ

**79.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ -

(අ) මහජන අර්පණ මගින් සුරැකුම්පත් නිකුත් කිරීම නියාමනය කිරීම;

(ආ) ලැයිස්තුගත පොදු සමාගම් විසින් මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සහතික කිරීම;

(ඇ) ලැයිස්තුගත පොදු සමාගම්වල මූල්‍ය අක්‍රමිකතා හෙළිදරව් කරන ලෙස විගණකවරුන්ට නියම කිරීම;

(ඈ) වෙළෙඳපොළ අතරමැදියන්ට බලපත්‍ර ලබාදීම සහ ඔවුන්ගේ නියෝජිතයන් ලියාපදිංචි කිරීම; සහ

(ඉ) සේවාලාභීන්ගේ වත්කම් ආරක්ෂා කිරීම,

විය යුතු ය.

I වන පරිච්ඡේදය

**සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණය**

සුරැකුම්පත් සම්න්ධයෙන් වන මහජන අර්පණය සහ ඇතැම් සුරැකුම්පත් සම්බන්ධයෙන් වන මහජන අර්පණ වර්ග නිදහස් කිරීම

**80.** (1) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තකු විසින් එය අනුමත කර ඇත්නම් මිස, ලැයිස්තුගත කළ හෝ ලැයිස්තුගත නොකළ සංස්ථාමය ආස්ථිතායක් විසින්, මහජනයාගෙන් අරමුදල් ඉල්ලීමේ කාර්ය සඳහා සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් මගින් හෝ අන්‍යාකාරයකින් කෙලින්ම හෝ තුන්වන පාර්ශ්වයක් මගින් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, සුරැකුම්පත් ප්‍රමාණය, සුරැකුම්පත් පන්තිය, ආයෝජකයන් සංඛ්‍යාව සහ වර්ගය, නිකුත්කරන්නාගේ ස්වභාවය, සුරැකුම්පත් වෙළෙඳපොළේ ස්වභාවය හෝ එකී අර්පණය බලයලත් ආයෝජකයකුට පමණක් සිදු කරන්නේය යන්න හෝ එකී නිකුත් කිරීම තුලනාත්මක නියාමකයක් විසින් නියාමනය කරනු ලබන්නේය යන්න සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින්, ඉහතින් වූ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ වීමෙන් ඇතැම් මහජන අර්පණ වර්ග නිදහස් කරනු ලැබිය හැකි ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "තුලනාත්මක නියාමනය" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

හෝ කොමිෂන් සභාව හා සමාන බලතල ඇති වෙනත් යම් විදේශීය නියාමන අධිකාරියක් අදහස් වේ.

(2) කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ අතුරු විධානයේ සඳහන් බලයලත් ආයෝජකයකු විසින් එම සුරැකුම්පත් පසුව මහජනයාට විකිණීමක් සිදු කරනු ලැබීම තහනම් වන්නේ ය.

(4) මහජන සුබසිද්ධිය උදෙසා එසේ කිරීම අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන විට දී, (1) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම ප්‍රසිද්ධ දැන්වීමක් මගින් ඕනෑම විටක දී ඉවත් කරනු ලැබිය හැකි ය.

සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වන කොමිෂන් සභාවේ අනුමතය

**81.** (1) 80 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිදහස් කරන ලද තැනැත්තකු නොවන යම් තැනැත්තකු විසින් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කිරීමේ දී, එම තැනැත්තා විසින්, ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමතය හෝ එම අනුමතය ලබාදීම සඳහා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) ලැයිස්තුගත පොදු සමාගමක් විසින් -

(අ) යම් නව නිකුත් කිරීමක් හෝ විකිණීම සඳහා වන අර්පණයක් මහජන අර්පණයක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ වුව ද, එම නව නිකුත් කිරීම් හෝ මහජනයා වෙත සුරැකුම්පත් විකිණීම සඳහා අර්පණ;

(ආ) සුරැකුම්පත් පිළිබඳ පෞද්ගලික ස්ථානගත කිරීම්;

(ඇ) සුරැකුම්පත් පිළිබඳ හිමිකම් නිකුත් කිරීම්;

(ඈ) සුරැකුම්පත් පිළිබඳ ප්‍රසාද නිකුත් කිරීම්; හෝ

(ඉ) සකස් කිරීම පිළිබඳ යෝජනා ක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම, අත්කර ගැනීමේ යෝජනා ක්‍රම, කොටස් මනාප යෝජනා ක්‍රම සහ සුරැකුම්පත් නිකුත් කිරීම මගින් වත්කම් අත් කර ගැනීම,

සම්බන්ධයෙන්, කොමිෂන් සභාවේ අනුමතය හෝ එම අනුමතය ලබා දීම සඳහා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ අනුමතය හෝ ලබා ගනු ලැබිය යුතු ය.

(3) අන්‍යාකාරයෙන් ලිඛිතව දන්වා ඇත්නම් මිස, එකී සුරැකුම්පත් අර්පණය සම්බන්ධයෙන් වන අනුමතයක් යම් ලිත් දින විස්සක් නොඉක්මවන කාලසීමාවක් ඇතුළත දන්වනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමක් ඉල්ලා සිටින ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක් විසින්, සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කිරීමට අනුමතය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(5) සෑම ලැයිස්තුගත පොදු සමාගමකම සහ සෑම ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එම සමාගම හෝ ආස්ථිත්‍යය ලැයිස්තුගත කර ඇත්තේ යම් විනිමය ස්ථානයක ද එම විනිමය ස්ථානයේ එය ලැයිස්තුගතව සිටින තාක් කල්, සෑම විට දී ම එම විනිමය ස්ථානයේ රීති සහ නියමයන්ට අනුකූලව එම සමාගම හෝ ආස්ථිත්‍යය විසින් කටයුතු කරනු ලබන බවට වගබලා ගනු ලැබිය යුතු ය.

සංස්ථා ප්‍රකාශය හෝ ඒ හා සමාන ලේඛනය

**82.** (1) මහජනයාට අර්පණයක් සිදු කරන තැනැත්තකු විසින් සාදනු ලබන සංස්ථා ප්‍රකාශය හෝ ඒ හා සමාන ලේඛනය, 2007 අංක 7 දරන සමාගම් පනතේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට සහ කොමිෂන් සභාව විසින් සහ විනිමය ස්ථානයක රීතිවල නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් නියමයන්ට අනුකූල විය යුතු ය.

(2) මහජනයාට සුරැකුම්පත් නිකුත් කිරීමක් සිදු කරන තැනැත්තකු විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නියම කර ඇති පරිදි සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කිරීමට පෙරාතුව, එම සංස්ථා ප්‍රකාශයේ හෝ ඒ හා සමාන ලේඛනයක පිටපතක් කොමිෂන් සභාව වෙත හෝ තත්කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මහජනයාගෙන් අරමුදල් ඉල්ලීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කරනු

ලබන විට දී කොමිෂන් සභාව විසින් යම් සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාව විසින් තහනම් නියෝග නිකුත් කරනු ලැබිය යුතු බව

**83.** (1) (අ) එහි ලැයිස්තුගත කිරීමේ රීති යටතේ හෝ 80 වන වගන්තිය යටතට ගැනෙන මහජන අර්පණවලට අදාළව බලපත්‍රලත් කොටස් විනිමය ස්ථානයක් වෙත ඉදිරිපත් කරන ලද සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ හෝ විනිමය ස්ථානයේ රීතිවලට අනුකූල නොවන බව හෝ ඊට අනුකූලව පිළියෙල කර නොමැති බව;

(ආ) සංස්ථා ප්‍රකාශයක හෝ ඒ හා සමාන ලේඛනයක අසත්‍ය හෝ නොමඟ යවන සුලු හෝ වැදගත් කරුණක් සැපයීම පැහැර හැර ඇති යම් ප්‍රකාශයක් හෝ තොරතුරක් අන්තර්ගත වන බව; හෝ

(ඇ) නිකුත් කරන්නකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකර ඇති බව හෝ මේ පනත යටතේ පනවන ලද අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බව,

කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, තවදුරටත් මහජන අර්පණවලට අදාළ සුරැකුම්පත් විභජනය කිරීම, නිකුත් කිරීම, අර්පණය කිරීම හෝ දායකත්වය සඳහා ආරාධනාවක් කිරීම හෝ මිල දී ගැනීම හෝ සිදු නොකරන ලෙස නිකුත් කරන්නා වෙත නියමයක් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු ද යන්න සම්බන්ධයෙන් යම් බලපෑමකට ලක්වූ තැනැත්තකුට කරුණු දැක්වීමට සාධාරණ අවස්ථාවක් කොමිෂන් සභාව විසින් ලබා දී ඇත්නම් මිස, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3) කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීම මගින්, (1) වන උපවගන්තිය යටතේ වන නියෝගයක් නිකුත් කිරීමේ දී යම් ප්‍රමාදයක් ඇති වීම ආයෝජකයන්ගේ සුබසිද්ධියට අගතිගාමී වන බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නේ නම්, කරුණු දැක්වීම

සඳහා අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින් අතුරු නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අතුරු නියෝගයක්, කලින් ප්‍රත්‍යාදිෂ්ට කර ඇත්නම් මිස, එම අතුරු නියෝගය නිකුත් කරන ලද දිනය හෝ (2) වන උපවගන්තිය යටතේ වන කරුණු ඉදිරිපත් කිරීම අවසන් වන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන කවර හෝ දිනෙන් පසු දින විසිඑකක් අවසන් වන තෙක් බලාත්මක විය යුතු ය.

(5) එම නියෝගය නිකුත් කිරීමට හේතු වූ අවස්ථානුගත කරුණු තවදුරටත් නොපවතින බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයක් හෝ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අතුරු නියෝගයක් විධානයක් මගින් කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(6) සංස්ථා ප්‍රකාශය හෝ ඒ හා සමාන ලේඛනය අදාළ වන සුරැකුම්පත් සඳහා දායකත්වය ලබා ගැනීම හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍ර (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් නිකුත් කිරීමට පෙරාතුව,-

(අ) එහෙත් ඉල්ලුම්කරුවන් වෙත එම සුරැකුම්පත් නිකුත් කිරීමට පෙර නිකුත් කර ඇති අවස්ථාවක, එම ඉල්ලුම් පත්‍ර ඉල්ලා අස්කරගෙන ඇති ලෙස සහ අවලංගු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, නිකුත් කරන්නා හෝ මුදල් ලබා ගත් වෙනත් යම් තැනැත්තකු විසින් ඉල්ලුම්කරුවන්ගෙන් ලබාගත් සියලු මුදල් පොලී රහිතව වහාම ආපසු ගෙවනු ලැබිය යුතු ය. එම නියෝගය නිකුත් කළ දින සිට දින දාහතරක් ඇතුළත එම මුදල් ආපසු ගෙවනු නොලැබුවහොත්, එම කාලසීමාව අවසන් වූ පසු කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පොලියක් ද සමඟ එම මුදල් ආපසු ගෙවීමට නිකුත්කරන්නා යටත් විය යුතු ය; හෝ

(ආ) ඉල්ලුම්කරුවන් වෙත එම සුරැකුම්පත් විභජනය කර ඇති අවස්ථාවක, එම සුරැකුම්පත් විභජනය කිරීම බල රහිත ලෙස සලකනු ලැබිය යුතු අතර, නිකුත්කරන්නා හෝ මුදල් ලබාගත් වෙනත් යම් තැනැත්තකු විසින්

ඉල්ලුම්කරුවන්ගෙන් ලබාගත් සියලු මුදල් පොලී රහිතව වහාම ආපසු ගෙවනු ලැබිය යුතුය. එම බාර දුන් දින සිට දින දාහතරක් ඇතුළත එම මුදල් ආපසු ගෙවනු නොලැබුවහොත්, එම කාලසීමා අවසන් වූ පසු කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අනුප්‍රමාණයක පොලියක් ද සමඟ එම මුදල් ආපසු ගෙවීමට නිකුත්කරන්නා යටත් විය යුතු ය.

(7) සංස්ථා පත්‍රය හෝ ඒ හා සමාන ලේඛනය අදාළ වන සුරැකුම්පත්වලින් කිසිවක් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඒවායේ වෙළෙඳාම ආරම්භ කර ඇත්නම් මේ වගන්තියේ විධිවිධාන යම් නිකුත්කරන්නකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම හෝ පැවරීම

84. (1) විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ සමාගමක සුරැකුම්පත් දරන තැනැත්තකු විසින් එම බලපත්‍රලත් විනිමය ස්ථානය විසින් යොදාගනු ලැබූ වෙළෙඳ කාර්යපටිපාටියට අනුකූලව එම සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම, තෑගි දීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම විනිමය ස්ථානය විසින් කිසිම නිශ්චිත වෙළෙඳ කාර්යපටිපාටියක් යොදා ගෙන නොමැති විට දී, ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් යෝජිත ත්‍යාගයට අදාළ විස්තර පිළිබඳ කොමිෂන් සභාවට සහ බලපත්‍රලත් විනිමය ස්ථානයට පූර්ව දැන්වීමක් ලබා දෙනු ලැබුවහොත්, එම තැනැත්තා විසින් එම වෙළෙඳ කාර්යපටිපාටියට අනුකූල නොවන වෙනත් යම් ආකාරයකින් ඥාතියකුට එවැනි සුරැකුම්පත් තෑගි කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ "ඥාතියා" යන්නෙන්, ඒ තැනැත්තාගේ මව හෝ පියා, කලත්‍රයෙක්, සුළු දරුවකු ඇතුළු දරුවකු, සුළු සහෝදරයකු හෝ සුළු සහෝදරියක ඇතුළු සහෝදරයකු හෝ සහෝදරියක හෝ ඒ දරුවකුගේ කලත්‍රයකු අදහස් වේ.

ලේඛන ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට කොමිෂන් සභාවට ඇති බලය

**85.** (1) මහජනයාට කරන ලද හෙළිදරව් කිරීම්වලින්-

(අ) ලැයිස්තුගත පොදු සමාගමක ව්‍යාපාර කටයුතු-

(i) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති, විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක රීති කඩ වන ආකාරයකින්; හෝ

(ii) ආයෝජකයන්ගේ සුබසිද්ධියට අගතිගාමී ආකාරයකින්,

සිදු කර ඇති බවට වූ අවස්ථානුගත කරුණු පවතින බව;

(ආ) වංචාකාරී හෝ නීතිවිරෝධී කටයුත්තක් සඳහා සමාගමක් ලැයිස්තුගත කරන ලද බව පෙන්නුම් කරන අවස්ථානුගත කරුණු පවතින බව;

(ඇ) සමාගමක් ලැයිස්තුගත කිරීමට හෝ ලැයිස්තුගත කිරීමට අදාළ කටයුතු කළමනාකරණයට සම්බන්ධ තැනැත්තන්, වංචාවකට, නීතිවිරෝධී චර්යාවකට හෝ වෙනත් විෂමාචාරයකට වරදකරු වී ඇති බව පෙන්නුම් කරන අවස්ථානුගත කරුණු පවතින බව; හෝ

(ඈ) ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරයා හෝ කළමනාකාරීත්වය, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ සැපයීමට නියම කරන ලද හෝ මහජනයාට සාධාරණ ලෙස මුදාහැරිය යුතු බවට අපේක්ෂා කළ හැකි සමාගමේ කටයුතු සම්බන්ධයෙන් වන තොරතුරු සිතාමතාම යටපත් කර ඇති බව පෙන්නුම් කරන අවස්ථානුගත කරුණු පවතින බව,

කොමිෂන් සභාවට පෙනී යන විට දී, කොමිෂන් සභාව විසින්, ඉහතින් වූ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පැවැත්වීම පිණිස, නිශ්චිත වෙලාවක දී සහ ස්ථානයක දී එකී විධානයේ නිශ්චිතව දක්වා ඇති ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස නියම කරමින් එම ලැයිස්තුගත පොදු සමාගමට විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් තොරතුරු ඉදිරිපත්

කරන ලෙස නියම කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ එය සතු අධිකාරි බලය පවරනු ලැබිය හැකි ය.

(3) පරීක්ෂණයක හෝ විමර්ශනයක විෂයවස්තුව වන්නා වූ ලැයිස්තුගත පොදු සමාගමට අදාළ යම් ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා සන්තකයේ ඇති යම් තැනැත්තකුට එම ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ඉදිරිපත් කරන ලෙස ද කොමිෂන් සභාව හෝ බලයලත් තැනැත්තකු විසින් නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා ඉදිරිපත් කරනු ලැබූ විට, කොමිෂන් සභාව හෝ බලයලත් තැනැත්තා විසින් -

(අ) එම ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස එම තැනැත්තාට හෝ එම ලැයිස්තුගත පොදු සමාගමේ වර්තමාන හෝ අතීත නිලධරයකු වන හෝ එම ලැයිස්තුගත පොදු සමාගම විසින් යම් කාලයක දී සේවයේ යොදවන ලද වෙනත් තැනැත්තකුට නියම කරන ලෙස;

(ආ) එම වාර්තා සහ ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඒවා ඉදිරිපත් කිරීමට නියම කරන ලද තැනැත්තාට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම පිළිබඳව හේතු දක්වන ලෙස; හෝ

(ඇ) එම ලේඛන හා ඉලෙක්ට්‍රොනික වාර්තා ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඒවා ඉදිරිපත් කිරීමට නියම කරන ලද තැනැත්තාට ඔහුගේ දැනුමට හා අවබෝධයට අනුව ඒවා ඇති ස්ථානය හෙළිදරව් කරන ලෙස,

එම ලැයිස්තුගත පොදු සමාගමට නියම කරනු ලැබිය යුතු ය.

(5) යම් ලැයිස්තුගත පොදු සමාගමක් මේ වගන්තියට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, මේ පනතේ 86 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එම ලැයිස්තුගත පොදු සමාගමට විධානයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

ලැයිස්තුගත පොදු සමාගම්වලට විධාන නිකුත් කිරීමට කොමිෂන් සභාව සතු බලය

**86.** නිසි පරීක්ෂණයකින් හෝ විමර්ශණයකින් පසු, යම් ලැයිස්තුගත පොදු සමාගමක් විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකර ඇති බවට හෝ ඒවාට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බවට හෝ අසත්‍ය, වැරදි හෝ නොමඟ යවනසුලු තොරතුරු කොමිෂන් සභාවට සපයා ඇති බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක කොමිෂන් සභාව විසින්, සුදුසු යැයි සලකනු ලබන පරිදි මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති යම් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් නොකර සිටීමේ වගකීම

**87.** (1) මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ කොමිෂන් සභාවට තොරතුරු සපයන හෝ තොරතුරු සැපයීමට කටයුතු සලස්වන යම් තැනැත්තකු විසින්, එම තොරතුරුවල යම් වැදගත් කරුණක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු ලෙස සපයා නොමැති බවට වගබලා ගැනීමට ඒ පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(2) (අ) කොමිෂන් සභාවේ ගොනු කර තබා ඇති යම් ලේඛනයක් අත්සන් කරන; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් ඔහුට පවරන ලද යම් හඳුනාගැනීමේ හෝ වෙනත් සහතික කිරීමේ ක්‍රමයක් හෝ කාර්යපටිපාටියක් යොදාගෙන ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික මාර්ගයකින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන,

යම් තැනැත්තකු විසින් එම ලේඛනයේ යම් වැදගත් කරුණක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු ලෙස සපයා නොමැති බවට වගබලා ගැනීමට ඒ පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති කඩකරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

වෙළෙඳපොළ ආයතනවලට අසත්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් නොකිරීමේ වගකීම

**88.** රැවටීමේ අදහසින්, මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ ලැයිස්තුගත පොදු සමාගමක් විසින් සැපයිය යුතු යම් තොරතුරකට අදාළව, මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද වෙළෙඳපොළ ආයතනයකට යම් නොමඟ යවනසුලු ප්‍රකාශයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන හෝ සපයන

හෝ දැන දැනම සහ හිතාමතාම එවැනි ප්‍රකාශයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීමට හෝ සැපයීමට බලය දෙන හෝ අවසර දෙන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධරයා පත්කිරීම

**89.** (1) සෑම ලැයිස්තුගත පොදු සමාගමකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එම සමාගම එය ලැයිස්තුගත කර ඇති විනිමය ස්ථානයේ ලැයිස්තුගතව සිටින තාක් කල් එහි අධ්‍යක්ෂවරුන් විසින් එම විනිමය ස්ථානයේ රීති සහ නියමයන්ට අනුකූලව අඛණ්ඩව කටයුතු කරන බවට වගබලා ගනු ලැබිය යුතු ය.

(2) ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින්, රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විනිමය ස්ථානයේ රීතිවල නිශ්චිතව දක්වන ලද නිසි සහ සුදුසු උපමානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයකුගේ කාර්ය

**90.** (1) ස්වකීය කාර්ය සාමාන්‍ය පරිදි ඉටු කිරීමේ දී ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයකුට -

(අ) මේ පනතේ යම් නියමයක් හෝ විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් හෝ විනිමය ස්ථානයක යම් රීතියක් කඩකිරීමක් හෝ වංචාව හෝ වංකභාවය හා සම්බන්ධ යම් වරදක්; හෝ

(ආ) ඔහුගේ මතය අනුව ලැයිස්තුගත පොදු සමාගමේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු මට්ටමකට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් කරුණක්; හෝ

(ඇ) යම් සුරැකුම්පත්හි ආයෝජකයකුගේ අරමුදල්වලට හෝ දේපළවලට බලපාන හෝ එම අරමුදල් හෝ දේපළ අනතුරට හෙළන හෝ එම අරමුදල්වලට හෝ දේපළවලට බලපෑ හැකි හෝ ඒවා අනතුරට හෙළිය හැකි යම් අක්‍රමිකතාවක් ඇතුළු ලැයිස්තුගත පොදු සමාගමක ගිණුම් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරන හෝ සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි යම් අක්‍රමිකතාවක්,

පිළිබඳව දැන ගැනීමට ලැබුණු අවස්ථාවක, එම විගණකවරයා විසින් වහාම (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් එම කරුණු නිවැරදි කිරීම සඳහා ඒවා පිළිබඳව විගණන කමිටුව වෙත ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු අතර, එතැන් සිට සති දෙකක් ඇතුළත කිසිම නිවැරදි කිරීමේ පියවරක් ගෙන නොමැති නම්, එම කරුණු නිවැරදි කිරීම සඳහා හෝ කඩකිරීමක් තවමත් සිදු වී නොමැති අවස්ථාවක එම කඩකිරීම සිදුවීම වැළැක්වීම සඳහා හෝ එම කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිඛිතව යොමු කරනු ලැබිය යුතු ය.

(2) සති දෙකක් ඇතුළත (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් එම කරුණු නිවැරදි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ කිසිම පියවරක් ගෙන නොමැති නම්, විගණකවරයා විසින්, වහාම එම කරුණු පිළිබඳ ලිඛිත වාර්තාවක් -

(අ) මේ පනතේ යම් නියමයක් හෝ විධිවිධානයක් හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් හෝ වංචාව හෝ වංකභාවය සම්බන්ධ යම් වරදක් සම්බන්ධයෙන් වන විට, කොමිෂන් සභාව වෙත; හෝ

(ආ) යම් විනිමය ස්ථානයක රීති කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් සම්බන්ධයෙන් වන විට, අදාළ විනිමය ස්ථානය සහ කොමිෂන් සභාව වෙත,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එකී විගණකවරයා විසින් මේ වගන්තිය යටතේ එකී විගණකවරයාට නියම කරන ලද යම් කාර්යයක් ඉටු කිරීමේ දී සද්භාවයෙන් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් කිසිම විගණකවරයකු යම් අධිකරණයක නඩු පැවරීමකට යටත් නොවිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, විගණනයක් අතරතුර හෝ විගණනයකින් පසු ඕනෑම විටක දී -

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ඔහුගේ විගණනයට අදාළව යම් අමතර තොරතුරු ඉදිරිපත් කරන ලෙස;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් හෝ යම් ප්‍රමාණයකින් ලැයිස්තුගත පොදු සමාගමේ ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් වන ඔහුගේ විගණනයේ විෂයපථය විශාලනය කරන ලෙස හෝ වැඩි කරන ලෙස;

(ඇ) යම් විශේෂිත අවස්ථාවක දී යම් නිශ්චිත විභාගයක් ක්‍රියාවට නංවන ලෙස හෝ යම් කාර්යපටිපාටියක් පිහිටුවන ලෙස; හෝ

(ඈ) (අ) සිට (ඇ) දක්වා ඡේදවල සඳහන් යම් කරුණක් පිළිබඳ අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස,

ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයකුට, නියම කරනු ලැබිය හැකි අතර එකී විගණකවරයා විසින් එකී නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු කාලසීමාව කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(5) විගණකවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර, මේ වගන්තිය යටතේ ඔහු විසින් ඉටුකරනු ලබන සියලු අමතර කාර්යයන්ට අදාළව කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන අනුප්‍රමාණ අනුව ලැයිස්තුගත පොදු සමාගම විසින් විගණකවරයාට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(6) ලැයිස්තුගත පොදු සමාගම විසින්, මේ වගන්තිය යටතේ විගණකවරයා විසින් ඉටුකරනු ලබන සියලු අමතර කාර්යයන්ට අදාළව විගණකවරයාට අවශ්‍ය වන යම් තොරතුරු සහ එම තොරතුරු සඳහා ප්‍රවේශය ලබා දෙනු ලැබිය යුතු ය.

අනිසි බලපෑමට එරෙහි තහනම

**91.** (1) යම් තැනැත්තකු විසින් -

(අ) ලැයිස්තුගත පොදු සමාගමක හෝ එහි සම්බන්ධිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ සැදීමේ; හෝ

(ආ) ලැයිස්තුගත පොදු සමාගමක හෝ එහි සම්බන්ධිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ,

නිරත වන යම් තැනැත්තකුට මූල්‍ය ප්‍රකාශ හෝ විගණනය කරන

ලද මූල්‍ය ප්‍රකාශවල වැදගත් කරුණක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු වීමට හේතු විය හැකි බවට ඔහු දන්නා හෝ සාධාරණ ලෙස දැනගත හැකි විය යුතු වූ යම් දෙයක් කිරීම සඳහා එම තැනැත්තාට බලපෑම් කිරීම, බල කිරීම, එම තැනැත්තා නොමඟ යැවීම හෝ එම තැනැත්තාට බලය පැවරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

2 වන පරිච්ඡේදය

**වෙළෙඳපොළ අතරමැදියන්**

**වෙළෙඳපොළ අතරමැදියකු ලෙස පෙනී සිටීමට එරෙහි තහනම**

**92.** (1) කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව තැනැත්තකු විසින් වෙළෙඳපොළ අතරමැදියකු ලෙස පෙනී සිටිනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**කොමිෂන් සභාවේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන නියමය**

**93.** (1) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් තැනැත්තකු විසින්, තත්කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට දී රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වෙළෙඳපොළ අතරමැදියකු ලෙස බලපත්‍රයක් ලබාගැනීම සඳහා හෝ බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම

**94.** (1) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගැනීමේ හෝ මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අලුත් කිරීමේ කාර්ය සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව සහ යම් ලේඛන සහ නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමඟ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් -

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සපයන ලෙස; සහ

(ආ) ඉල්ලුම් පත්‍රයේ කරුණු තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලද යම් තොරතුරු, ඉල්ලුම්කරුගේ වියදමින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට අනුව සහ යම් තැනැත්තන් මගින් නිවැරදි දැයි පරීක්ෂා කරන ලෙස,

ඉල්ලුම්කරුවකුට නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමට මාස තුනකට පෙරාතුව නියම කරනු ලැබිය හැකි අලුත් කිරීමේ ගාස්තුවක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමෙන් පසු බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, බලපත්‍රය අලුත් කිරීම සිදු කරනු ලබන තෙක් ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම නියම කරනු ලැබිය හැකි බලපත්‍ර දීමේ ගාස්තුවෙන් සියයට පහකට නොවැඩි, ප්‍රමාද ගාස්තුවක් බලපත්‍රය අලුත් කිරීමේ ගාස්තුවට අමතරව පනවනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන යම් කොන්දේසි හෝ පරිසීමාවලට යටත්ව, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

**95.** (1) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම හෝ එවැනි බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන හේතු කිසිවක් මත එම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය:-

(අ) මේ පරිච්ඡේදයට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර නොමැති වීම;

(ආ) ඉල්ලුම්කරු මේ පරිච්ඡේදයේ යම් නියමයකට හෝ ඒ යටතේ සාදන ලද නියෝග සහ රීතිවලට අනුකූලව ක්‍රියාකිරීමට අපොහොසත් වී තිබීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් කොමිෂන් සභාවට සපයන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු වීම හෝ ඉන් යම් වැදගත් කරුණක් සැපයීම පැහැර හැර තිබීම;

(ඈ) ඉල්ලුම්කරු ගණන් බේරා වසා දැමීමේ හෝ අන්‍යාකාරයකින් විසුරුවා හැරීමේ ක්‍රියාවලියක පැවතීම හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වීම;

(ඉ) විනිශ්චිත ණයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට එරෙහිව නිකුත් කරන ලද ඇස්කීසි නියෝගයක් අනුව එම ණය සම්පූර්ණයෙන් හෝ එම ණයෙන් කොටසක් ගෙවා තෘප්ත කර ගැනීමට නොහැකිව එය ආපසු එවා තිබීම;

(ඊ) ඉල්ලුම්කරුගේ යම් දේපළකට අදාළව ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඇවරකරුවකු හෝ භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු හෝ ඒ හා සමාන තැනැත්තකු පත් කරනු ලැබ තිබීම;

(උ) ඉල්ලුම්කරු එහි ණය හිමියන් සමඟ දැනට ක්‍රියාත්මක වන සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී හෝ එළඹ තිබීම;

(ඌ) ඉල්ලුම්කරු හෝ එහි යම් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා, කළමනාකරුවන් හෝ පාලකවරයා-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වංචාව හෝ වංකභාවය සම්බන්ධයෙන් වන වරදකට වරදකරු කරනු ලැබ තිබීම හෝ එකී වරදට වරදකරු කරනු ලැබීමට ඔහු වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියාකර ඇති බවට වූ තීරණයක් ඇතුළත්ව තිබීම;

(ii) මේ පනත යටතේ යම් පරිපාලනමය දණ්ඩනයකට යටත් වී තිබීම;

(iii) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සුරැකුම්පත් පාලනය වන නීති යටතේ ඔහු චෝදනා ලැබ ඇත්තේ යම් වරදකට ද එම වරදට වරදකරු කරනු ලැබ තිබීම හෝ ඊට සංසාධනය කර තිබීම;

(iv) මූල්‍ය සේවාවන් සැපයීමේ හෝ සමාගම් කළමනාකරණයේ නියුතු තැනැත්තන්ගේ වංකභාවය, අශක්නුතාව හෝ අයථා ක්‍රියා හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් හෝ නිදහස් කළ හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තන් හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් මහජනයා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ පනවන ලද යම් නීතියක් යටතේ සාදන ලද යම් විධිවිධානයක් කඩකර තිබීම;

(v) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වීම;

(එ) ඉල්ලුම්කරුගේ හෝ එහි යම් අධ්‍යක්ෂවරයකුගේ, ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ පාලකවරයාගේ කීර්තිය, චරිතය, මූල්‍යමය විශ්වසනීයත්වය සහ විශ්වාස කළ හැකි බව සැලකිල්ලට ගැනීමේ දී ඔවුන්ට ගනුදෙනුකරුවන්ගේ උපරිම යහපත උදෙසා ක්‍රියා කිරීමට නොහැකි විය හැකි බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු තිබීම;

(ඒ) ඉල්ලුම්කරුගේ මූල්‍ය තත්ත්වය හෝ ඉල්ලුම්කරුගේ ව්‍යාපාරය සිදු කිරීමට නියමිත ආකාරය පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඔ) බලපත්‍රය දැරීමට අදාළව ඉල්ලුම්කරු විසින් කරගෙන යනු ලැබිය හැකි ව්‍යාපාරයේ ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී, ඉල්ලුම්කරුගේ පසුගිය කාර්යසාධන වාර්තාව හෝ විශේෂඥතාව පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම, සහ -

(i) ඉල්ලුම්කරු විසින් හෝ එහි යම් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ පාලකවරයා විසින් අනුචිත ලෙස ව්‍යාපාර කටයුතු සිදු කිරීමට හේතු වීමට; හෝ

(ii) ඉල්ලුම්කරු විසින් ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන ආකාරය පිළිබඳව අවිශ්වාසයක් පිළිබිඹු කිරීමට,

ඉඩ ඇති අවස්ථානුගත කරුණු පැවතීම; හෝ

(ඕ) බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ආයෝජකයන්ගේ සුබසිද්ධීන්ට පටහැනි වන බව කොමිෂන් සභාවේ මතය වීම.

(2) ඉල්ලුම්කරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

අවම මූල්‍ය අවශ්‍යතා

**96.** යම් වෙළෙඳපොළ අතරමැදියකු කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි හෝ විනිමය ස්ථානයක රීති මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි අවම මූල්‍ය අවශ්‍යතා සපුරා නොමැති නම්, එම වෙළෙඳපොළ අතරමැදියා විසින් කොමිෂන් සභාවේ ලිඛිත කැමැත්ත නොමැතිව මේ පරිච්ඡේදය යටතේ එයට බලපත්‍ර දී ඇත්තේ යම් ව්‍යාපාරයක් කරගෙන යාමට ද එම ව්‍යාපාරය කරගෙන යනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම සඳහා වන නියමය

**97.** (1) වෙළෙඳපොළ අතරමැදියකු සඳහා හෝ වෙළෙඳපොළ අතරමැදියකු වෙනුවෙන් ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කරන්නා වූ යම් තැනැත්තකු කොමිෂන් සභාවේ ලියාපදිංචි වනු ලැබිය යුතු අතර, ඔහු එම කාර්යය සඳහා ලියාපදිංචි තැනැත්තා ලෙස හඳුන්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය බලාපොරොත්තු වීමේ කාර්ය සඳහා, යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් (මෙහි මින් මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා වෙනුවෙන් කොමිෂන් සභාව වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි වීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම

**98.** (1) 97 වන වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස ලියාපදිංචි වී හෝ ලියාපදිංචිය අලුත් කිරීමේ කාර්යය සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, කොමිෂන් සභාව විසින්, රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකින් සහ යම් ලේඛන සහ නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමග කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් -

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සපයන ලෙස; සහ

(ආ) ඉල්ලුම් පත්‍රයේ කරුණු තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලද යම් තොරතුරු ඉල්ලුම්කරුගේ වියදමින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයකින් සහ යම් තැනැත්තන් මගින් නිවැරදි දැයි පරීක්ෂා කරන ලෙස,

ඉල්ලුම්කරුවකුට නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචිය අවලංගු වීමට මාස තුනකට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එහි ලියාපදිංචියේ වලංගු කාලය ඉකුත් වීමෙන් පසුව, ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, අලුත් කිරීමේ ගාස්තුවට අමතරව, කොමිෂන් සභාව විසින්, ලියාපදිංචිය අලුත් කිරීම සිදු කරනු ලබන තෙක් ප්‍රමාද වන්නා වූ සෑම දිනයක් සඳහා ම නියම කරනු ලැබිය හැකි ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙන් සියයට පහක් නොඉක්මවන ප්‍රමාද ගාස්තුවක් පනවනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන යම් කොන්දේසි හෝ පරිසීමාවලට යටත්ව, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් ලියාපදිංචියක් ප්‍රදානය කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු

**99.** (1) මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස ලියාපදිංචිය ප්‍රදානය කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන යම් හේතු කිසිවක් මත එම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය:-

(අ) 98 වන වගන්තියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර නොතිබීම;

(ආ) ඉල්ලුම්කරු, 98 වන වගන්තියේ යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වී තිබීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් කොමිෂන් සභාවට සපයන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු වීම හෝ ඉන් යම් වැදගත් කරුණක් සැපයීම පැහැර හැර තිබීම;

(ඈ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිදහස් නොකළ බුන්වත් තැනැත්තකු හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වීම;

(ඉ) විනිශ්චිත ණයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට එරෙහිව නිකුත් කරන ලද ඇස්කීසි නියෝගයක් අනුව එම ණය සම්පූර්ණයෙන් හෝ එම ණයෙන් කොටසක් ගෙවා තෘප්ත කර ගැනීමට නොහැකිව එය ආපසු එවා තිබීම;

(ඊ) ඉල්ලුම්කරු-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වංචාව හෝ වංකභාවය සම්බන්ධයෙන් වන වරදකට වරදකරු කරනු ලැබ තිබීම හෝ ඔහු වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියාකර ඇති බවට වූ තීරණයක් එකී වරදකරු කරනු ලැබීමට ඇතුළත් වන යම් වරදකට වරදකරු කරනු ලැබ තිබීම;

(ii) මේ පනත යටතේ යම් පරිපාලනමය දණ්ඩනයකට යටත් වී තිබීම;

(iii) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සුරැකුම්පත් පාලනය වන නීති යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ තිබීම හෝ සමථයකට පැමිණ තිබීම; හෝ

(iv) මූල්‍ය සේවාවන් සැපයීමේ හෝ සමාගම් කළමනාකරණයේ නියුතු තැනැත්තන්ගේ වංකභාවය, අශක්නුතාව හෝ අයථා ක්‍රියා හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් හෝ නිදහස් කළ හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තන් හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් මහජනයා ආරක්ෂා කිරීම සඳහා පනවනු ලැබූ බවට කොමිෂන් සභාවට පෙනී යන්නා වූ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ලිඛිත නීතියක් යටතේ සාදන ලද යම් විධිවිධානයක් කඩකර තිබීම;

(උ) වෙළෙඳපොළ අතරමැදියා සඳහා සහ වෙළෙඳපොළ අතරමැදියා වෙනුවෙන් ඉටු කරනු ලැබිය යුතු කාර්යයන්හි ස්වභාවය සැලකිල්ලට ගැනිමේ දී ඉල්ලුම්කරුගේ අධ්‍යාපනික හෝ වෙනත් සුදුසුකම් හෝ පළපුරුද්ද සම්බන්ධයෙන් කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඌ) කීර්තිය, චරිතය, මූල්‍යමය විශ්වසනීයත්වය සහ විශ්වාස කළ හැකි බව සැලකිල්ලට ගැනීමේ දී ඉල්ලුම්කරුට ගනුදෙනුකරුවන්ගේ උපරිම යහපත උදෙසා ක්‍රියා කිරීමට නොහැකි විය හැකි බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු තිබීම;

(එ) වෙළෙඳපොළ අතරමැදියා සඳහා සහ වෙළෙඳපොළ අතරමැදියා වෙනුවෙන් ඉටු කරනු ලැබිය යුතු කාර්යයන්ගේ ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී, ඉල්ලුම්කරුගේ අතීත කාර්යසාධන වාර්තාව හෝ විශේෂඥතාව පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඒ) ඉල්ලුම්කරු විසින් අවංක ලෙස හෝ සාධාරණ ලෙස කටයුතු කර නොමැති බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු තිබීම; හෝ

(ඔ) ලියාපදිංචිය ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ආයෝජකයන්ගේ සුබසිද්ධීන්ට පටහැනි වන බව කොමිෂන් සභාවේ මතය වීම.

(2) කොමිෂන් සභාව විසින්, කරුණු දැක්වීම සඳහා ඉල්ලුම්කරුට අවස්ථාවක් ලබා දීමෙන් තොරව, ලියාපදිංචිය ප්‍රදානය කිරීම අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

කොන්දේසි හෝ පරිසීමා වෙනස් කිරීමේ බලය

**100.** කොමිෂන් සභාව විසින් ඕනෑම අවස්ථාවක දී වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලියාපදිංචි තැනැත්තකුට ලිඛිත දැන්වීමක් ඉදිරිපත් කිරීම මගින් ආයෝජකයින්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය යැයි එය විසින් සලකනු ලබන යම් කොන්දේසියක් හෝ පරිසීමාවක් වෙනස් කිරීම හෝ යම් වැඩිදුර කොන්දේසියක් හෝ පරිසීමාවක් පැනවීම කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයේ හෝ ලියාපදිංචියේ කාලසීමාව

**101.** (1) මේ කොටස යටතේ ප්‍රදානය කරනු ලැබූ බලපත්‍රයක් එකී බලපත්‍රය නිකුත් කළ දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් දක්වා වලංගු විය යුතු ය.

(2) එම අලුත් කිරීම සිදු නොවූයේ නම්, එම බලපත්‍රයේ කාලය ඉකුත් වන්නා වූ දිනයෙන් ආරම්භ වී මාස දොළහක වැඩිදුර කාලසීමාවක් දක්වා හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි යම් පසු දිනයක් දක්වා මේ කොටස යටතේ අලුත් කරනු ලැබූ යම් බලපත්‍රයක් දිගමට බලාත්මකව පැවතිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව, මාස දොළහකට වැඩි කාලසීමාවක් සඳහා යම් බලපත්‍රයක් අලුත් කරනු ලබන අවස්ථාවක, වෙළෙඳපොළ අතරමැදියා විසින් නියමිත බලපත්‍ර ගාස්තුව කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) සිට (3) දක්වා වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචියේ කාලසීමාව සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමිෂන් සභාවට අසත්‍ය සහ නොමඟ යවන සුලු ප්‍රකාශ ඉදිරිපත් කිරීම

**102.** (1) මේ කොටස යටතේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින්-

(අ) අසත්‍ය හෝ නොමඟ යවන සුලු බව දන්නා හෝ දන්නා බවට සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි යම් ප්‍රකාශයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම හෝ එසේ ඉදිරිපත් කිරීමට සැලැස්වීම; හෝ

(ආ) යම් කරුණක් කොමිෂන් සභාවට ප්‍රකාශ කිරීම පැහැර හැරීම හේතුවෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශය යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් නොමඟ යවන සුලු වන බව දන්නා හෝ දන්නා බවට සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි අවස්ථාවක කොමිෂන් සභාවට එම කරුණ ප්‍රකාශ කිරීම පැහැර හැරීම,

කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

කොමිෂන් සභාවට දැනුම් දීමේ කාර්යය

103. (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක දැනටමත් සපයා ඇති වැදගත් විස්තර වෙනස් කිරීමට යෝජනා කරනු ලබන හෝ එහි නිශ්චිතව දක්වා ඇති විස්තර වෙනස් කරනු ලබන හෝ වෙනස් කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එකී වෙනස් කිරීම හෝ මාරු කිරීම සිදු කිරීමට පෙරාතුව ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දන්වා එහි පූර්ව කැමැත්ත ලබා ගැනීම එකී වෙළෙඳපොළ අතරමැදියාගේ කාර්යය විය යුතු ය.

(2) ලියාපදිංචි තැනැත්තකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක දැනටමත් සපයා ඇති යම් විස්තර වෙනස් කිරීමට යම් ලියාපදිංචි තැනැත්තකු විසින් යෝජනා කරනු ලබන හෝ එහි නිශ්චිතව දක්වා ඇති තත්ත්වය මාරු කිරීමට හෝ වෙනස් කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එකී වෙනස් කිරීම හෝ මාරු කිරීම පිළිබඳව කොමිෂන් සභාව වෙත වහාම දැනුම් දීම එකී ලියාපදිංචි තැනැත්තාගේ සහ එකී ලියාපදිංචි තැනැත්තා ක්‍රියා කරන්නේ හෝ සේවය කරන්නේ යම් වෙළෙඳපොළ අතරමැදියකු සඳහා ද එකී වෙළෙඳපොළ අතරමැදියාගේ කාර්යය විය යුතු ය.

අනුයෝජිතයකු වශයෙන් පෙනී සිටීමට එරෙහි තහනම

104. කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් එකී තැනැත්තාට එම කටයුත්ත කරගෙන යාමට නිසි ලෙස බලය පවරනු ලැබ ඇත්නම් මිස, යම් තැනැත්තකු විසින් බලපත්‍රලත් වෙළෙඳපොළ අතරමැදියකුගේ ව්‍යාපාරයක් කරගෙන යාමේ දී අනුයෝජිතයකු වශයෙන් කටයුතු කිරීම හෝ තමා විසින් එසේ කටයුතු කරන මෙන් පෙනී සිටීම සිදු කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රයක් හෝ ලියාපදිංචියක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම

**105.** (1) (අ) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ යම් ඉල්ලුම් පත්‍රයක් කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි යම් හේතුවක් පවතින බවට;

(ආ) වෙළෙඳපොළ අතරමැදියාගේ බලපත්‍රය සම්බන්ධයෙන් වන යම් කොන්දේසියක් හෝ පරිසීමාවක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් එකී තැනැත්තාට නිකුත් කරන ලද යම් විධානයක් වෙළෙඳපොළ අතරමැදියා විසින් කඩකර ඇති බවට; හෝ

(ඇ) වෙළෙඳපොළ අතරමැදියා විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඔහුට අනුගම්‍ය වන යම් රීතියක් කඩකර ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, මේ කොටස යටතේ යම් වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාරව, වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට පෙර, එකී වෙළෙඳපොළ අතරමැදියාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරන ලද අවස්ථාවක, තම බලපත්‍රය වහාම කොමිෂන් සභාව වෙත භාර දීම එම වෙළෙඳපොළ අතරමැදියාගේ කාර්යය විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමෙන්, මේ පනත යටතේ එකී වෙළෙඳපොළ අතරමැදියාට එරෙහිව යම් නඩුවක් පැවරීම හෝ නඩුවක් පවත්වාගෙන යාමට බලපෑමක් හෝ එයට අගතියක් සිදු නොවිය යුතු ය.

(5) පහත දැක්වෙන හේතු මත මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචියක් අත්හිටුවීම හෝ අවලංගු කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය:—

(අ) ඔහුගේ ලියාපදිංචිය අහිමි කිරීම සඳහා යම් හේතුවක් පවතින බව පෙනී යාම;

(ආ) ඔහුගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් වන යම් කොන්දේසියක් හෝ පරිසීමාවක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ඔහු වෙත නිකුත් කරන ලද යම් විධානයක් ලියාපදිංචි තැනැත්තා විසින් කඩකර තිබීම; හෝ

(ඇ) ලියාපදිංචි තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඔහුට අනුගම්‍ය වන යම් රීතියක් කඩකර තිබීම.

(6) මේ වගන්තියේ (2) සිට (4) දක්වා වන උපවගන්තිවල විධිවිධාන මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචියක්, අවස්ථාවෝචිත පරිදි, අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් සඳහා සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

වෙළෙඳපොළ අතරමැදියන් විසින් සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම

**106.** යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින්-

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොමැතිව, තමා වෙළෙඳ සහභාගිකයකු වන්නා වූ විනිමය ස්ථානයෙන් බාහිරව සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම;

(ආ) කොමිෂන් සභාවේ රීති හෝ වෙළෙඳපොළ ආයතනයක රීති කඩ වන ආකාරයට සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම;

(ඇ) තමා වෙළෙඳ සහභාගිකයකු වන්නා වූ වෙළෙඳපොළ ආයතනයක් විසින් දක්වා ඇති නියමයන්ට පටහැනි ආකාරයට ආන්තික ගිණුමක යම් ගනුදෙනු සිදු කිරීම; හෝ

(ඈ) යම් සුරැකුම්පත් මිලට ගැනීමට හෝ විකිණීමට පෙලඹවීම පිණිස හෝ පෙලඹවීමට තැත් කිරීම පිණිස යම් වංචාකාරී, රවටනසුලු හෝ වෙනත් යම් වංචනික උපක්‍රමයක් නැතහොත් ප්‍රයෝගයක් මගින් යම් ගනුදෙනුවක් සිදු කිරීම,

කරනු නොලැබිය යුතු ය.

**107.** වෙළෙඳපොළ අතරමැදියකු විසින් ගනුදෙනුකරුගේ ලිඛිත කැමැත්ත නොමැතිව එකී ගනුදෙනුකරුගේ ගිණුමෙහි පවතින යම් සුරැකුම්පත් ණයට දීම හෝ ණයට දීමට කටයුතු සැලැස්වීම කරනු නොලැබිය යුතු අතර, එකී ගනුදෙනුකරුගේ ලිඛිත කැමැත්ත නොමැතිව සමපාර්ශ්වීය ඇපය ලෙස යම් ගනුදෙනුකරුවකුගේ ගිණුමෙහි පවතින සුරැකුම්පත් භාවිතයෙන් ණයට ගැනීම හෝ ණයට ගැනීමට කටයුතු සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

ගනුදෙනුකරුගේ කැමැත්ත නොමැතිව සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

**108.** (1) විගණකවරයකු ලෙස ස්වකීය කාර්යය සාමාන්‍ය පරිදි ඉටු කිරීමේ දී මේ පනතේ යම් විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් හෝ ඒවාට අනුකූලව කටයුතු නොකිරීමක් හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් කඩකිරීමක් හෝ වෙළෙඳපොළ අතරමැදියාගේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු ප්‍රමාණයකට අහිතකර ලෙස බලපානු ලැබිය හැකි යම් කරුණක් පවතින බව වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයකුගේ මතය වේ නම්, එම විගණකවරයා විසින් වෘත්තීය මතයක් දරන්නේ නම් විගණකවරයා විසින් අදාළ කරුණ පිළිබඳ ලිඛිත වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී ලිඛිත වාර්තාවේ පිටපතක්-

වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයාගේ කාර්යය

(අ) මේ පනතේ යම් විධිවිධානයක්, ඒ යටතේ සාදන ලද නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකරනු ලැබීමක් හෝ ඒවාට අනුකූලව කටයුතු නොකිරීමක් සම්බන්ධයෙන් වන විට කොමිෂන් සභාවට;

(ආ) වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් කඩකරනු ලැබීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් සම්බන්ධයෙන් වන විට, අදාළ වෙළෙඳපොළ ආයතනයට සහ කොමිෂන් සභාවට; හෝ

(ඇ) වෙළෙඳපොළ අතරමැදියාගේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු ප්‍රමාණයකට අහිතකර ලෙස බලපානු ලබන වෙනත් යම් අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට අදාළ වෙළඳපොළ ආයතනයට සහ කොමිෂන් සභාවට,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කිසිම විගණකවරයකු, එකී විගණකවරයා විසින් මේ වගන්තිය යටතේ ඔහු වෙත නියම කරන ලද යම් කාර්යයක් ඉටු කිරීමට අදහස් කිරීමේ දී සද්භාවයෙන් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක නඩු පැවරීමකට යටත් නොවිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, විගණනයක් අතරතුර දී හෝ ඉන් පසුව ඕනෑම අවස්ථාවක දී -

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි ඔහුගේ විගණනය සම්බන්ධයෙන් යම් අතිරේක තොරතුරු ඉදිරිපත් කරන ලෙස;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් හෝ යම් ප්‍රමාණයකින් වෙළෙඳපොළ අතරමැදියාගේ ව්‍යාපාරය සහ කටයුතු සම්බන්ධයෙන් වන ස්වකීය විගණනයේ විෂයපථය විශාලනය කරන ලෙස හෝ දීර්ඝ කරන ලෙස;

(ඇ) යම් නිශ්චිත අවස්ථාවක දී, යම් නිශ්චිත පරීක්ෂණයක් සිදු කරන ලෙස හෝ යම් කාර්ය පටිපාටියක් පිහිටුවන ලෙස; හෝ

(ඈ) (අ) සිට (ඇ) දක්වා වූ ඡේදවල සඳහන් යම් කරුණක් පිළිබඳව අවස්ථාවෝචිත පරිදි, වාර්තාවක් හෝ අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස,

යම් වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයකුට නියම කරනු ලැබිය හැකි අතර, විගණකවරයා විසින් එකී නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු කාලය කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(4) විගණකවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර, වෙළෙඳපොළ අතරමැදියා විසින් මේ වගන්තිය යටතේ විගණකවරයා විසින් ඉටු කරනු ලබන්නා වූ සියලු අතිරේක කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන අනුප්‍රමාණවලින් විගණකවරයා වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(5) වෙළෙඳපොළ අතරමැදියා විසින්, මේ වගන්තිය යටතේ විගණකවරයකු විසින් ඉටු කරනු ලබන්නා වූ සියලු අතිරේක කාර්ය සම්බන්ධයෙන් විගණකවරයාට අවශ්‍ය වන්නා වූ යම් තොරතුරු සපයනු ලැබීම සහ එම තොරතුරුවලට ප්‍රවේශ වීම සඳහා ඉඩ සලසනු ලැබීම සිදු කරනු ලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

## ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීම

අර්ථ නිරූපණය

**109.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා,-

"ගනුදෙනුකරු" යන්නෙන්, වෙළෙඳපොළ අතරමැදියකු සම්බන්ධයෙන් වන විට, වෙළෙඳපොළ අතරමැදියා වෙළෙඳාම් කරන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද එම තැනැත්තා හෝ සුරැකුම්පත් ගනුදෙනු කිරීම සඳහා වෙළෙඳපොළ අතරමැදියා විසින් උපදෙස් ගනු ලබන්නේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා අදහස් වේ.

"මුදල් හෝ වෙනත් වත්කම්" යන්නෙන්, වෙළෙඳපොළ අතරමැදියකු විසින් ඒ වෙනුවෙන් එහි ගනුදෙනුකරුට වගකීමට යටත් වන්නා වූ ද එය විසින් එම ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී භාර ගනු ලබන්නා වූ හෝ රඳවා තබා ගනු ලබන්නා වූ මුදල් හෝ එහි තැන්පත් කරනු ලබන්නා වූ වෙනත් යම් වත්කමක් ද ඉන් උපචය වන යම් මුදල් හෝ වෙනත් වත්කම් ද අදහස් වේ.

ගනුදෙනුකරුගේ වත්කම් ආරක්ෂා කිරීම

**110.** (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් ගනුදෙනුකරුවකුගේ ගිණුමෙන් හෝ ගිණුමට මුදල් හෝ වෙනත් වත්කම් භාරගනු ලබන තාක්දුරට එම වෙළෙඳපොළ අතරමැදියා විසින්-

(අ) එම මුදල් හෝ වෙනත් වත්කම් භාර ගන්නා විට හෝ භාර ගැනීමට පෙර ගනුදෙනුකරු විසින් එකඟ වනු ලැබිය හැකි යම් කාර්යයක් සඳහා පමණක් එම මුදල් හෝ වෙනත් වත්කම් යොදා ගනු ලැබිය යුතු බවට වන පදනමින් එය සිදු කරනු ලැබිය යුතු ය;

(ආ) ගනුදෙනුකරුවකු ගනුදෙනුකරුගේ ගිණුමට භාරගත් මුදල් හෝ වෙනත් වත්කම් එම අර්ථලාභය සඳහා භාරයක් ලෙස දරනු ලැබිය යුතු ය;

(ඇ) ගනුදෙනුකරුවකුගේ ගිණුමට භාරගත් මුදල්, එහි අරමුදල් සමඟ සම්මිශ්‍රණය කිරීම හෝ ගනුදෙනුකරු නොවන

වෙනත් යම් තැනැත්තකුගේ යම් ගනුදෙනුවක් සුරක්ෂිත කිරීම සඳහා හෝ එම තැනැත්තාගේ ණය දීර්ඝ කිරීම සඳහා ආන්තිකයක් හෝ ඇපයක් ලෙස එම මුදල් භාවිත කිරීම කරනු නොලැබිය යුතු ය; සහ

(ඈ) මේ කොටසේ විධිවිධානවලට හෝ (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් රීතිවලට අනුකූලව එම ගනුදෙනුකරුගේ මුදල් හෝ වෙනත් වත්කම්වලට අදාළව එක් එක් ගනුදෙනුකරුවකු සඳහා වෙන වෙනම පොත් සටහනක් වාර්තා කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් සිදු කරනු ලබන මුදල් හෝ වෙනත් වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීම ඇතුළුව, (1) වන උපවගන්තියේ වන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ හෝ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතිවල හෝ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලින් හෝ ගිණුම්වලට භාරගත් හෝ වෙළෙඳපොළ අතරමැදියකු වෙත තැන්පත් කරන ලද සියලු මුදල් හෝ වෙනත් වත්කම් -

(අ) එකී වෙළෙඳපොළ අතරමැදියාගේ ණය පියවීම සඳහා යොදවා ගැනීමට සලස්වනු නොලැබිය යුතු ය; සහ

(ආ) එකී වෙළෙඳපොළ අතරමැදියාගේ යම් ණයකට අදාළ යම් අධිකරණ නියෝගයක් හෝ ක්‍රියාවලියක් යටතේ ගෙවනු ලැබීමට හෝ ඇස්කීසි කර ලබා ගැනීමට යටත් වනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය, (3) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීතියක් කඩ කරනු ලබන යම් වෙළෙඳපොළ අතරමැදියකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

ව්‍යාපාර කටයුතු පිළිබඳ රීති

**111.** (1) කොමිෂන් සභාව විසින්, ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහ වෙළෙඳපොළ අතරමැදියකුගේ සහ ලියාපදිංචි තැනැත්තකුගේ වෘත්තීය ප්‍රමිතීන් ඉහළ නැංවීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි

කොමිෂන් සභාව විසින් සලකනු ලබන පරිදි, වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලියාපදිංචි තැනැත්තකුගේ ව්‍යාපාර කටයුතු නියාමනය කිරීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති කඩකරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

අසාධාරණ නිර්දේශ සම්බන්ධයෙන් වන වගකීම

**112.** (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් එකී ගනුදෙනුකරුට එකී නිර්දේශය ඉදිරිපත් කිරීම සඳහා වෙළෙඳපොළ අතරමැදියාට හෝ ලියාපදිංචි තැනැත්තාට සාධාරණ පදනමක් නොමැති නම්, එකී නිර්දේශය පිළිබඳව විශ්වාසය තබන බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි යම් ගනුදෙනුකරුවකුට සුරැකුම්පත් සම්බන්ධයෙන් යම් නිර්දේශයක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු අතර, සුරැකුම්පත්වල අගය උච්ඡාවචනය විය හැකි බවට ද අනතුරු හඟවනු ලැබිය යුතු ය.

(2) (අ) ඔහු විසින්, එම නිර්දේශය සුදුසු බවට නිශ්චය කර ගැනීමේ කාර්ය සඳහා, ගනුදෙනුකරුගේ ආයෝජන අරමුණු, මූල්‍ය තත්ත්වය සහ විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, සියලු අවස්ථානුගත කරුණුවල දී සාධාරණ වන්නා වූ පරිදි එම නිර්දේශයේ විෂය කරුණ පිළිබඳව සලකා බලා ඒ පිළිබඳව විශ්ලේෂණ හෝ විමර්ශන සිදු කර ඇත්නම්; සහ

(ආ) ඔහු විසින් (අ) ඡේදයේ සඳහන් සලකා බැලීම, විශ්ලේෂණය හෝ විමර්ශනය මත පදනම්ව එම නිර්දේශ කර ඇත්නම්,

මිස, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, ගනුදෙනුකරුවකුට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලියාපදිංචි තැනැත්තකුට සාධාරණ පදනමක් නොමැත්තේ ය.

(3) වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය කඩකරනු ලබන අවස්ථාවක, -

(අ) යම් ගනුදෙනුකරුවකු විසින් එකී නිර්දේශය මත විශ්වාසය තබා යම් නිශ්චිත ක්‍රියාවක් සිදු කරනු ලබන හෝ යම් නිශ්චිත ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළකී සිටිනු ලබන;

(ආ) එකී නිර්දේශය සහ අදාළ වන්නා වූ අනෙකුත් සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී, යම් ගනුදෙනුකරුවකු විසින් එකී නිර්දේශය මත විශ්වාසය තබා, අවස්ථාවෝචිත පරිදි, එකී ක්‍රියාව සිදු කිරීම හෝ එකී ක්‍රියාව සිදු කිරීමෙන් වැළකී සිටීම යුක්ති සහගත වන; සහ

(ඇ) යම් ගනුදෙනුකරුවකුට අදාළ කරගත හැකි වෙනත් යම් ප්‍රතිකර්මයකට අගතියක් නොමැතිව, අවස්ථාවෝචිත පරිදි, එකී ක්‍රියාව සිදු කිරීමේ හෝ සිදු කිරීමෙන් වැළකී සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් ගනුදෙනුකරුවකුට පාඩුවක් හෝ හානියක් විඳීමට සිදු වන,

විටදී, එකී ගනුදෙනුකරුට සිදුවන යම් ඍජු පාඩුවක් හෝ හානියක් වෙනුවෙන් වන්දි ගෙවීමට එකී වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචි තැනැත්තා යටත් විය යුතු ය.

(4) තත්කාර්ය සඳහා සාදන ලද රීති හෝ විධාන මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසි යටතේ, කොමිෂන් සභාව විසින්, යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ වෙළෙඳපොළ අතරමැදියන් පන්තියක් මේ වගන්තිය අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(5) ගනුදෙනුකරු විසින් (1) වන උපවගන්තිය යටතේ යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශය නොසලකා, එකී අවස්ථානුගත කරුණු යටතේ එකී ක්‍රියාව සිදු කරනු ඇති බවට හෝ එකී ක්‍රියාව සිදු නොකර හරිනු ඇති බවට ඔප්පු කරනු ලැබුවහොත්, එකී වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචි තැනැත්තා (3) වන උපවගන්තිය යටතේ එකී ගනුදෙනුකරුට වන්දි ගෙවීමට යටත් නොවිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය කඩකිරීමක් සම්බන්ධයෙන් වන විට, යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් නිර්දේශයක් ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී, එකී ගනුදෙනුකරුගේ ආයෝජන අරමුණු, මූල්‍ය තත්ත්වය සහ විශේෂ අවශ්‍යතා සම්බන්ධයෙන් එකී වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචි

තැනැත්තා සන්තකයේ වූ තොරතුරු සැලකිල්ලට ගැනීමේ දී, සියලු අවස්ථානුගත කරුණු යටතේ එකී නිර්දේශය සුදුසු වන බවට ඔප්පු කරනු ලැබුවහොත්, එකී වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචි තැනැත්තා එකී ගනුදෙනුකරුට වන්දි ගෙවීමට යටත් නොවිය යුතු ය.

**සුරැකුම්පත්වල ඇතැම් සම්බන්ධතා හෙළිදරව් කිරීම**

**113.** (1) වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් යම් සුරැකුම්පත් පිළිබඳ නිර්දේශයක් ඉදිරිපත් කරමින් චක්‍රලේඛයක් හෝ ඒ හා සමාන වෙනත් යම් ලිඛිත සන්නිවේදනයක් යවනු ලබන අවස්ථාවක, එකී චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යවනු ලැබූ දිනය වන විට ඔහුට හෝ ඔහුට සම්බන්ධයක් ඇති හෝ ඔහුට බැඳීමක් ඇති යම් තැනැත්තකුට එම සුරැකුම්පත් පිළිබඳව ඇති යම් සම්බන්ධතාවක හෝ එම සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳව ඇති යම් සම්බන්ධතාවක ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක්, ඔහු විසින්, එම චක්‍රලේඛයේ හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයේ ඉතිරි කොටසේ භාවිත කර ඇති අකුරුවලට වඩා අපැහැදිලි නොවන අයුරින් මුද්‍රණය කර චක්‍රලේඛයට හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු (1) වන උපවගන්තිය කඩකිරීමක් සම්බන්ධයෙන් වන වරදකට චෝදනා ලැබූ අවස්ථාවක, එකී චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යවනු ලැබූ අවස්ථාව වන විට -

(අ) ඔහුට සුරැකුම්පත් පිළිබඳ සම්බන්ධතාවක් හෝ සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳ සම්බන්ධතාවක් ඔහුට තිබූ බව; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, සුරැකුම්පත් පිළිබඳ හෝ සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳ සම්බන්ධතාව ඔහුට සම්බන්ධයක් ඇති හෝ ඔහුට බැඳී ඇති තැනැත්තාට තිබූ බව,

ඔහු විසින් නොදැන සිටි බව සහ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ නොහැකි බව ඔප්පු කිරීම එකී වෙළෙඳපොළ අතරමැදියාට හෝ ලියාපදිංචි තැනැත්තාට විත්තිවාචකයක් විය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල කාර්ය සඳහා -

(අ) සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳව යම් තැනැත්තකුට ඇති සම්බන්ධතාව යන්නට, එම සුරැකුම්පත් අත්කර ගැනීමෙන් හෝ බැහැර කිරීමෙන් පසු හෝ එමගින් යම් තැනැත්තකුට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් උපචය වන්නා වූ හෝ උපචය විය හැකි යම් මූල්‍යමය අර්ථලාභයක් හෝ වාසියක් ඇතුළත් වේ;

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තිය සීමා කිරීමක් නොකර, යම් සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකුට එම සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳව යම් සම්බන්ධතාවක් ඇති බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ඇ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය නොතකා චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යැවීමට අදාළව, එකී තැනැත්තා සහ වෙනත් තැනැත්තා හවුලේ ක්‍රියා කරන්නේ නම් හෝ අන්‍යාකාරයකින් ඔවුන් දෙදෙනා අතර ඇති කර ගන්නා ලද වැඩපිළිවෙළක් යටතේ හෝ එයට අනුකූලව ක්‍රියා කරන්නේ නම් මිස, යම් තැනැත්තකු වෙනත් තැනැත්තකු සමඟ බැඳීමක් නොමැති විය යුතු ය; නැතහොත් සම්බන්ධයක් නොමැති විය යුතු ය.

(4) වෙළෙඳපොළ අතරමැදියකු විසින් (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ යම් චක්‍රලේඛයක් හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයක් යම් තැනැත්තකුට යවනු ලබන අවස්ථාවක, එකී වෙළෙඳපොළ අතරමැදියා විසින් එකී චක්‍රලේඛයේ හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයේ පිටපතක් එකී චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යැවූ දින සිට අවුරුදු හයක් දක්වා ආරක්ෂා කර තබා ගනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකුට යවන ලද චක්‍රලේඛයක් හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයක්, වෙළෙඳපොළ අතරමැදියකුගේ නිලධරයකු විසින් අත්සන් කර ඇත්තේ නම්, එය වෙළෙඳපොළ අතරමැදියා විසින් යවනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය කඩකරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

**අභ්‍යන්තර කාර්යපටිපාටි සහ ක්‍රියාවලි**

**114.** යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින්, මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූලව එම වෙළෙඳපොළ අතරමැදියා හෝ එහි සේවානියුක්තයන් කටයුතු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීමේ කාර්ය සඳහා එහි ව්‍යාපාරයකට ඇති අවදානම අධීක්ෂණය කිරීමට එකී වෙළෙඳපොළ අතරමැදියාට ඉඩ සලස්වන්නා වූ කාර්යපටිපාටි සහ ක්‍රියාවලි පිහිටුවා පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

**වෙළෙඳපොළ අතරමැදියන් සහ ලියාපදිංචි තැනැත්තන්ගේ නාමලේඛනය**

**115.** (1) කොමිෂන් සභාව විසින්, වෙළෙඳපොළ අතරමැදියන්ගේ සහ ලියාපදිංචි තැනැත්තන්ගේ නාමලේඛනයක් එය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් හා ආකාරයකින් තබා ගනු ලැබිය යුතු අතර, එය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් එම නාමලේඛනය මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා ඉඩ සලස්වනු ලැබිය යුතු ය.

(2) නාමලේඛනය ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් විය යුතු අතර කොමිෂන් සභාව විසින් සෑම විට දීම එම නාමලේඛනය යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

(3) වෙළෙඳපොළ අතරමැදියා සහ ලියාපදිංචි තැනැත්තා සඳහා වන නාමලේඛනයෙහි-

(අ) වෙළෙඳපොළ අතරමැදියාගේ හෝ ලියාපදිංචි තැනැත්තාගේ නම;

(ආ) වෙළෙඳපොළ අතරමැදියාගේ හෝ ලියාපදිංචි තැනැත්තාගේ ව්‍යාපාරයේ ලිපිනය;

(ඇ) වෙළෙඳපොළ අතරමැදියා විසින් දරනු ලබන බලපත්‍ර වර්ගය හෝ ලියාපදිංචි තැනැත්තා විසින් දරනු ලබන ලියාපදිංචියේ වර්ගය;

(ඈ) වෙළෙඳපොළ අතරමැදියාට බලපත්‍රය ප්‍රදානය කරන ලද දිනය හෝ ලියාපදිංචි තැනැත්තාට ලියාපදිංචිය ප්‍රදානය කරන ලද දිනය;

(ඉ) වෙළෙඳපොළ අතරමැදියා වෙනුවෙන් ක්‍රියාකරන හෝ වෙළෙඳපොළ අතරමැදියා විසින් සේවයෙහි යොදවනු ලබන ලියාපදිංචි තැනැත්තන්ගේ නම්; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් යම් කරුණක්,

අඩංගු විය යුතු ය.

(4) මේ පනත යටතේ වෙළෙඳපොළ අතරමැදියකු විසින් දරනු ලබන බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ අවස්ථාවක හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් දරනු ලබන ලියාපදිංචියක් අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචි තැනැත්තා සම්බන්ධයෙන් එම නාමලේඛනයට අවශ්‍ය සංශෝධන කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම

මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ

**116.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ:-

(අ) දේශීය සහ විදේශීය ආයෝජකයන්ට, ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විනිවිදභාවයෙන් යුතු ආකාරයකින් විකිණීම සහ මිල දී ගැනීම සඳහා පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු මාර්ගයෙන් වේදිකාවක් සැපයීම; සහ

(ආ) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු මාර්ගයෙන් විනිවිදභාවයෙන් යුතු ආකාරයකින් ලැයිස්තුගත නොකළ සුරැකුම්පත්වලට අදාළ තොරතුරු දේශීය සහ විදේශීය ආයෝජකයන්ට හෙළිදරව් කිරීම සඳහා පහසුකම් සැලසීම,

විය යුතු ය.

### 1 වන පරිච්ඡේදය

### **පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු පිහිටුවීම**

පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු පිහිටුවීම

**117.** එකී තැනැත්තා කොමිෂන් සභාවෙහි ලියාපදිංචි වී ඇත්නම් හෝ කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කිරීමෙන් එකී තැනැත්තා නිදහස් කර ඇත්නම් මිස, යම් තැනැත්තකු වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස කටයුතු කරනු නොලැබිය යුතු ය.

**වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලියාපදිංචි කිරීම සඳහා වන නියමය**

**118.** (1) 117 වන වගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින්, යම් තැනැත්තකු විසින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් නියම සහ කොන්දේසිවලට යටත් ව එම තැනැත්තා පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම හෝ එසේ ලියාපදිංචි කිරීමෙන් එකී තැනැත්තා නිදහස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, 119 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති උපමාන සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලියාපදිංචි කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද යම් නියම සහ කොන්දේසි, කොමිෂන් සභාව විසින්, කලින් කල, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබූව ද, එය නොතකා ආයෝජකයන්ගේ සුබසිද්ධිය උදෙසා එසේ කිරීම අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින් එම නිදහස් කිරීම ඉවත් කර එම තැනැත්තාට ලියාපදිංචි වන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

**ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම**

**119.** (1) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ලේඛන සහ තොරතුරු ද සමග රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකෘතියකින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා එකී තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මගින් කොමිෂන් සභාව සෑහීමට පත් වන පරිදි වේදිකාවක් මත සිදු කරන වෙළෙඳාම් පිළිබඳව එකී තැනැත්තාට අත්දැකීම් ඇති බව ඔප්පු කරන ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචිය සඳහා එකී තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මගින් කොමිෂන් සභාව සෑහීමට පත් වන පරිදි එම වේදිකාව මත සිදු කරනු ලබන

වෙළෙඳාම් නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහා එම වේදිකාව මගින් වැඩපිළිවෙළ යොදා ඇති බව ඔප්පු කරන ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

**පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කාර්යභාරය**

පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කර්තව්‍ය සහ කාර්ය

**120.** පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කර්තව්‍ය සහ කාර්ය-

(අ) ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීම සහ මිල දී ගැනීම සඳහා වේදිකාවක් සැපයීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධ තොරතුරු දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රජාවට සැපයීම;

(ඇ) එහි වෙළෙඳ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සඳහා සහ නියාමනය කිරීම සඳහා වූ උපමාන සැපයීම;

(ඈ) කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ ස්වභාවයකින් වන යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම; සහ

(ඉ) කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාවේ අධිකාරි බලය මත ක්‍රියාකරන තැනැත්තකුට, කොමිෂන් සභාවට හෝ එකී තැනැත්තාට සාධාරණව අවශ්‍ය වන යම් සහායක් ලබා දීම,

විය යුතු ය.

වේදිකාවක් මත වෙළෙඳාම් කිරීම

**121.** වේදිකාවක් මත සුරැකුම්පත් මිල දී ගැනීම සහ විකිණීම සිදු කරන යම් තැනැත්තකු එකී වේදිකාව විසින් ඇතුළත් කරගනු ලැබූ වෙළෙඳ සාමාජිකයන් මාර්ගයෙන් ඔවුන්ගේ ඇණවුම් සිදු කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව හෝ වෙළෙඳපොළ මෙහෙයුම්කරු විසින් රීති සාදනු ලැබිය යුතු බව

**122.** කොමිෂන් සභාව විසින්,-

(අ) වේදිකාවක් මත වෙළෙඳාම් කළ හැකි ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වර්ගය නිශ්චය කිරීම;

(ආ) වෙළෙඳාම් කිරීම පිළිබඳව වේදිකාවකට වාර්තා කළ හැකි නිකුත්කරන්නන් වර්ගය නිශ්චය කිරීම;

(ඇ) වේදිකාව මත වෙළෙඳාම් කළ හැකි ආයෝජකයන් වර්ගය නිශ්චය කිරීම;

(ඈ) වේදිකාව මත වෙළෙඳාම් කළ හැකි වෙළෙඳපොළ සාමාජිකයන් වර්ගය නිශ්චය කිරීම;

(ඉ) වේදිකාවට වෙළෙඳ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම;

(ඊ) වේදිකාව විසින් කරනු ලැබිය යුතු හෙළිදරව් කිරීම් මට්ටම නිශ්චය කිරීම; සහ

(උ) ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වන ව්‍යාපාර කටයුතු පිළිබඳ ප්‍රමිතිය නිශ්චය කිරීම,

සඳහා රීති සෑදීම හෝ කොමිෂන් සභාවේ අනුමතයට යටත්ව එවැනි රීති සාදන ලෙස වෙළෙඳපොළ මෙහෙයුම්කරුට නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචිය අවලංගු කිරීම

**123.** (1) (3) වන උපවගන්තියට යටත්ව, ආයෝජකයන්ගේ සුබසිද්ධිය සඳහා හෝ විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් පවත්වාගෙන යාම සඳහා එසේ කිරීම සුදුසු යයි කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එකී දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයක සිට බලාත්මක වන පරිදි, ලිඛිත දැන්වීමක් මගින්, පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීමෙහි එකී ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා වූ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කිරීමක් සිදු වුව ද, එය නොතකා,-

(අ) ලියාපදිංචිය අවලංගු කිරීම අදාළ වන පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුගේ මෙහෙයුම් නවතා දැමීමේ; හෝ

(ආ) ආයෝජකයන්ගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීමේ,

කාර්යය සඳහා හෝ කොමිෂන් සභාව විසින් දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි එම ලියාපදිංචිය අවලංගු කිරීමෙන් බලපෑමට

ලක් වූ යම් ක්‍රියාකාරකම් එම ලියාපදිංචිය අවලංගු කිරීම බලාත්මක වන දින සිට හෝ ඉන්පසුව අඛණ්ඩව කරගෙන යාමට කොමිෂන් සභාව විසින් එම තැනැත්තාට අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට අවසර ලබා දී ඇති අවස්ථාවක, එම අවසරයට අනුකූලව එහි තම කටයුතු කරගෙන යාම හේතුවෙන්, එම තැනැත්තා මේ පනතේ යම් විධිවිධානයක් කඩ කර ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් එකී පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දී ඇත්නම් මිස, කොමිෂන් සභාව විසින්, පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුට අදාළව (1) වන උපවගන්තිය යටතේ වූ එහි බලය ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ කරන ලද යම් ලියාපදිංචිය අවලංගු කිරීමක්-

(අ) එම පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරු විසින් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කිරීමට පෙරාතුව වුව ද, (3) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක, ඉන්පසුව වුව ද, එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැන නඟින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම

**124.** (1) කොමිෂන් සභාව විසින්, කලින් කල, මේ කොටස යටතේ වන පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කාර්ය සාධනය සමාලෝචනය කරනු ලැබිය හැකි ය.

(2) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමේ දී කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය හැකි ය:-

(අ) වේදිකාවට ආවේණික සංස්ථානික අවදානම;

(ආ) මහජන සුබසිද්ධිය;

(ඇ) වේදිකාවේ ප්‍රමාණය සහ ව්‍යුහය;

(ඈ) වේදිකාව මත වෙළෙඳාම් කරන ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් පන්තිය; සහ

(ඉ) වේදිකාව භාවිත කරන ආයෝජකයන්ගේ සහ සහභාගිකයන්ගේ ස්වභාවය.

(3) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නොදී කොමිෂන් සභාව විසින් (1) වන වගන්තිය යටතේ වන එහි බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

පනතේ විධිවිධාන ලැයිස්තුගත නොකළ සුරැකුම්පත්වලට අදාළ වීම

**125.** (1) මේ පනතේ විධිවිධාන 80 වන වගන්තිය ප්‍රකාරව නිදහස් කර ඇති ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීමකට, මිල දී ගැනීමකට හෝ පැවරීමකට අදාළ නොවිය යුතු ය.

(2) මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරු විසින් සාදනු ලබන මේ වෙළෙඳ වේදිකාවට අදාළ වන ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධයෙන් වන රීති, ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධයෙන් වන වෙනත් යම් රීති අභිබවා බලපැවැත්විය යුතු ය.

## V වන කොටස

### වෙළෙඳපොළ විෂමාචාරය

මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ

**126.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ විය යුත්තේ, සාධාරණ, විධිමත් සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීමේ අදහස ඇතිව-

(අ) ව්‍යාජ වෙළෙඳාම් කිරීම, වෙළෙඳපොළ මිල ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීම් සහ සුරැකුම්පත් වංචා ඇතුළු සියලු ආකාරයේ වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම්; සහ

(ආ) අභ්‍යන්තරික තැනැත්තන් විසින් ගනුදෙනු කිරීම,

අධෛර්යමත් කිරීම සහ ඊට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම වන්නේ ය.

මේ කොටස අදාළ වීම

**127.** එහි අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වා ඇත්නම් මිස, මේ කොටස-

(අ) සුරැකුම්පත් සම්බන්ධයෙන් වන විට-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන 80 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කර ඇති යම් ලැයිස්තුගත සංස්ථාමය ආස්ථිත්‍යයක හෝ වෙනත් යම් ආස්ථිත්‍යයක සුරැකුම්පත්වලට අදාළව ශ්‍රී ලංකාව තුළ සිදු වන ක්‍රියා හෝ නොකර හැරීම් සඳහා;

(ii) 81 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදුකර ඇති ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් ලැයිස්තුගත සංස්ථාමය ආස්ථිත්‍යක හෝ වෙනත් යම් ආස්ථිත්‍යයක සුරැකුම්පත්වලට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන ක්‍රියා හෝ නොකර හැරීම් සඳහා; හෝ

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත යම් රජයක් විසින් නිකුත් කරනු ලබන්නා වූ ද, කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක පහසුකම් භාවිත කර වෙළෙඳාම් කරනු ලබන්නා වූ ද, සුරැකුම්පත්වලට අදාළව සිදුවන ක්‍රියා හෝ නොකර හැරීම් සඳහා; සහ

(ආ) ව්‍යුත්පන්න සම්බන්ධයෙන් වන විට-

(i) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක් මත වෙළෙඳාම් කරන ව්‍යුත්පන්නවලට අදාළව ශ්‍රී ලංකාව තුළ සිදුවන ක්‍රියා; සහ

(ii) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක් මත වෙළෙඳාම් කරන ව්‍යුත්පන්නවලට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන ක්‍රියා,

සඳහා අදාළ විය යුතු ය.

**1** වන පරිච්ඡේදය

## තහනම් හැසිරීම්

**128.** (1) යම් තැනැත්තකු විසින්-

වංචනික වෙළෙඳාම් කිරීමේ සහ වෙළෙඳපොළ මිල ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීමේ ගනුදෙනු

(අ) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක් මත වෙළෙඳාම් කරන සුරැකුම්පත් සම්බන්ධයෙන් සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදුවන බවට ව්‍යාජ හෝ නොමඟ යවනසුලු පෙනුමක්; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් සුරැකුම්පත් සඳහා වන වෙළෙඳපොළ හෝ එම සුරැකුම්පත්වල මිල සම්බන්ධයෙන් ව්‍යාජ හෝ නොමඟ යවනසුලු පෙනුමක්,

ඇති කිරීම හෝ ඇති කිරීමට සැලැස්වීම හෝ ඇති කිරීමේ අදහසින් වූ යම් දෙයක් කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින්-

(අ) එකී සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් ඇති නොකරන යම් සුරැකුම්පතක් මිල දී ගැනීම හෝ විකිණීම මගින්; හෝ

(ආ) යම් ව්‍යාජ ගනුදෙනුවක් හෝ උපක්‍රමයක් මගින්,

යම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ මිල පවත්වාගෙන යාම, ඉහළ දැමීම හෝ පහත හෙළීම හෝ ඉහළ දැමීමට සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව,

(අ) එකී සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් ඇති නොකරන්නා වූ යම් සුරැකුම්පත් විකිණීමක් හෝ මිල දී ගැනීමක් පිළිබඳ ගනුදෙනුවක් ඍජුවම හෝ අන්‍යාකාරයකින් සිදු කරන, ඊට සහභාගී වන හෝ ඒ හා සම්බන්ධ වන හෝ එම ගනුදෙනුව සිදු කරන; හෝ

(ආ) පෙර සඳහන් මිලට සැලකිය යුතු ලෙස සමාන මිලකට, එම සුරැකුම්පත් එම ප්‍රමාණයම හෝ එම ප්‍රමාණයට

සැලකිය යුතු ලෙස සමාන ප්‍රමාණයක් හෝ මිල දී ගැනීම සඳහා අර්පණයක් සිදු කිරීමට ඔහු විසින් වෙනත් තැනැත්තකු සමඟ දුස්සන්ධානගත වී හෝ වෙනත් තැනැත්තකු සමඟ එවැනි දුස්සන්ධානයක් ඇති කර ගැනීමට කටයුතු සලස්වා හෝ ඔහු හා සම්බන්ධ තැනැත්තකු එවැනි අර්පණයක් ඔහු සමඟ සිදු කර ඇති බව හෝ ඔහු සමඟ සිදු කිරීමට කටයුතු සලස්වා ඇති බව දැන දැනම, යම් සුරැකුම්පත් ප්‍රමාණයක් යම් නිශ්චිත මිලකට මිල දී ගැනීම හෝ විකිණීම සඳහා අර්පණයක් සිදු කරන හෝ සිදු කිරීමට කටයුතු සලස්වන,

යම් තැනැත්තකු එම සුරැකුම්පත් පිළිබඳව සම්බන්ධයෙන් සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදු වන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය කඩ කිරීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, ඔහු විසින් එම සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ අරමුණ හෝ අරමුණු වූයේ එම සුරැකුම්පත් සඳහා වන වෙළඳපොළ හෝ එම සුරැකුම්පත්වල මිල සම්බන්ධයෙන් ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කිරීමේ අරමුණ නොවූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එය ඔහුට විත්තිවාචකයක් වන්නේ ය.

(5) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකු විසින්-

(අ) ඔහු එම ක්‍රියාව සිදු කළ අරමුණ වූයේ විනිමය ස්ථානයක සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදුවන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කිරීමේ අරමුණ නොවූ බව හෝ ඔහු එම ක්‍රියාව සිදු කළ අරමුණට විනිමය ස්ථානයක සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදුවන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කිරීමේ අරමුණ ඇතුළත් නොවූ බව; සහ

(ආ) විනිමය ස්ථානයක සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදුවන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඔහු විසින් ඇති කරනු ලැබුව ද, නොලැබුව ද, ඔහු නොසැලකිලිවන්තව ක්‍රියා නොකළ බව,

ඔප්පු කිරීම ඔහුට විත්තිවාචකයක් වන්නේ ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකුට හෝ ඔහු හා සම්බන්ධ යම් තැනැත්තකුට එම මිල දී ගැනීමට හෝ විකිණීමට පෙර එම සුරැකුම්පත් පිළිබඳව සම්බන්ධතාවක් තිබුණි නම් ද, එම

මිල දී ගැනීමෙන් හෝ විකිණීමෙන් පසුව ද එම සුරැකුම්පත් පිළිබඳව සම්බන්ධතාවක් දිගටම තිබේ නම් ද, එවැනි යම් සුරැකුම්පත් මිල දී ගැනීමක් හෝ විකිණීමක් මගින් එම සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් ඇති නොවන්නේ ය.

(7) (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සුරැකුම්පත් විකිණීමක් හෝ මිල දී ගැනීමක් පිළිබඳ ගනුදෙනුවකට කර ඇති සඳහනට-

(අ) සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වූ අර්පණයක් කිරීම; සහ

(ආ) සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා අර්පණය කරන ලෙස ප්‍රකාශිතව හෝ ව්‍යංගව යම් තැනැත්තකුට ආරාධනය කරන්නා වූ, යම් ආරාධනයක් සිදු කිරීම,

ඇතුළත් වන්නේ ය.

කොටස් වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම්

**129.** (1) එකී සමාගමේ හෝ සම්බන්ධිත සමාගමක සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ බැහැර කිරීමට එකී තැනැත්තා සැබැවින්ම පෙලඹවුණ ද නොවුණ ද වෙනත් යම් තැනැත්තන් ඒ සඳහා පෙලඹවීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක වෙළෙඳාම් කරන, එම සමාගමේ සුරැකුම්පත්වල මිල හෝ ප්‍රමාණය කෘත්‍රිම ලෙස-

(අ) ඉහළ නැංවීමේ;

(ආ) අඩු කිරීමේ; හෝ

(ඇ) සවි කිරීමේ, නියම කිරීමේ, පවත්වාගෙන යාමේ හෝ ස්ථාවර කිරීමේ,

බලපෑම ඇති හෝ එම බලපෑම ඇති කිරීමට ඉඩ ඇති ගනුදෙනු වන්නා වූ, යම් සමාගමක සුරැකුම්පත් පිළිබඳ එක් ගනුදෙනුවක් හෝ ඊට වැඩි ගනුදෙනු සංඛ්‍යාවක් යම් තැනැත්තකු විසින් සෘජුව සිදු කිරීම හෝ සිදු කිරීමට, සම්බන්ධ වීම කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක වෙළෙඳාම් කරන, යම් සමාගමක සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට කර ඇති සඳහනකට-

(අ) එම සමාගමේ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වූ අර්පණයක් කිරීම; සහ

(ආ) එම සමාගමේ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා අර්පණය කරන ලෙස ප්‍රකාශිතව හෝ ව්‍යංගව යම් තැනැත්තකුට ආරාධනයක් කරන්නා වූ, යම් ආරාධනයක් කිරීම, ඇතුළත් වන්නේ ය.

අසත්‍ය හෝ නොමඟ යවනසුලු ප්‍රකාශ

**130.** යම් තැනැත්තකු විසින්-

(අ) එකී ප්‍රකාශයේ හෝ තොරතුරේ නිරවද්‍යභාවය පිළිබඳව පරීක්ෂා කිරීමට සාධාරණ සැලැකිල්ලක් නොදක්වා; හෝ

(ආ) එකී ප්‍රකාශය හෝ තොරතුර යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවනසුලු බව ඔහු දන්නේ නම් හෝ දැනගත යුතුව තිබූ බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්,

යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවනසුලු වන්නා වූ ද කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක වෙළෙඳාම් කරන සුරැකුම්පත්වල වෙළෙඳපොළ මිල හෝ ප්‍රමාණය ඉහළ නැංවීමේ, අඩු කිරීමේ, පවත්වාගෙන යාමේ හෝ ස්ථාවර කිරීමේ බලපෑම ඇති කිරීමට ඉඩ ඇත්තා වූ ද ප්‍රකාශයක් කිරීම හෝ එවැනි තොරතුරක් බෙදා හැරීම කරනු නොලැබිය යුතු ය.

සුරැකුම්පත් ගනුදෙනු කිරීමට වංචනික ලෙස තැනැත්තන් පෙලඹවීම

**131.** (1) යම් තැනැත්තකු විසින්-

(අ) නොමඟ යවනසුලු, අසත්‍ය හෝ රැවටිලි සහගත බවට තමන් දන්නා ප්‍රකාශයක් කිරීම හෝ පළ කිරීම මගින් හෝ එවැනි අනාවැකියක් සිදු කිරීම මගින්;

(ආ) යම් වැදගත් කරුණු වංක ලෙස සැඟවීමක් මගින්;

(ඇ) නොමඟ යවනසුලු, අසත්‍ය හෝ රැවටිලි සහගත යම් ප්‍රකාශයක් හෝ අනාවැකියක් වංක ලෙස හෝ අන්‍යාකාරයකින් නොසැලකිලිමත්ව කිරීම හෝ පළකිරීම මගින්; හෝ

(ඈ) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවන සුලු බවට තමන් දන්නා යම් තොරතුරක් යාන්ත්‍රික, විද්‍යුත් හෝ වෙනත් උපකරණයක් මගින් වාර්තාගත කිරීම හෝ ගබඩා කිරීම මගින්,

කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක වෙළෙඳාම් කරන සුරැකුම්පත් වෙළෙඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකු පෙලඹවීම හෝ පෙලඹවීමට තැත් කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කාර්ය සඳහා, එහි සඳහන් තැනැත්තා විසින්, අදාළ තොරතුර වාර්තාගත කළ හෝ ගබඩා කළ අවස්ථාවේ දී, වෙනත් යම් තැනැත්තකුට එම තොරතුර ලබාගත හැකි බවට විශ්වාස කිරීමට එම තැනැත්තාට කිසිම සාධාරණ හේතුවක් නොතිබුණ බව ඔප්පු කරනු ලැබුවහොත්, එය ඔහුට විත්තිවාචකයක් වන්නේ ය.

අයුතු ලෙස හැසිර වීමේ සහ රැවටිලි සහගත උපක්‍රම භාවිත කිරීම

**132.** යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක වෙළෙඳාම් කරන සුරැකුම්පත්වලට දායක වීම, එම සුරැකුම්පත් මිල දී ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් කෙලින්ම හෝ අන්‍යාකාරයකින්-

(අ) වංචා කිරීම සඳහා යම් උපක්‍රමයක්, යෝජනා ක්‍රමයක් හෝ ප්‍රයෝගයක් භාවිත කිරීම;

(ආ) යම් තැනැත්තකුට වංචාවක් හෝ රැවටීමක් සිදු කිරීමක් ලෙස ක්‍රියාත්මක වන හෝ ක්‍රියාත්මක වනු ඇති යම් ක්‍රියාවක, පරිචයක හෝ ව්‍යාපාර කටයුත්තක යෙදීම; හෝ

(ඇ) එකී ප්‍රකාශයේ අසත්‍ය හෝ නොමඟ යවන සුලු ප්‍රකාශයක් බවට පත් කිරීමට හේතු වන්නා වූ වැදගත් කරුණක් සම්බන්ධයෙන් යම් අසත්‍ය ප්‍රකාශයක් කිරීම හෝ යම් ප්‍රකාශයක් තුළ වැදගත් කරුණක් පිළිබඳ හෙළිදරව් කිරීම පැහැර හැරීම,

කරනු නොලැබිය යුතු ය.

## 2 වන පරිච්ඡේදය

### අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම

තොරතුරු

**133.** අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පරිච්ඡේදයේ, "තොරතුරු" යන්නට-

(අ) මහජනතාවට දැනගැනීමට සැලැස්වීමට සුදුසු වන තරම් ප්‍රමාණවත් නිශ්චිතභාවයකින් යුතු නොවන්නා වූ, ලැයිස්තුගත පොදු සමාගම්වලට අදාළ තොරතුරු;

(ආ) යම් තැනැත්තකු විසින් ගන්නා ලදැයි කියනු ලබන තීරණවලට අදාළ කරුණු;

(ඇ) (i) වාණිජමය ගනුදෙනු; හෝ

(ii) සුරැකුම්පත් ගනුදෙනු හෝ

සම්බන්ධයෙන් වන සාකච්ඡාවලට හෝ යෝජනාවලට අදාළ කරුණු;

(ඈ) සමාගමක මූල්‍ය කාර්ය සාධනයට අදාළ තොරතුරු;

(ඉ) යම් තැනැත්තකු විසින් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට එළඹීමට යෝජනා කරනු ලබන බවට හෝ එළඹ ඇති බවට හෝ එම සුරැකුම්පත්වලට අදාළව ප්‍රකාශයක් නිකුත් කිරීමට සූදානම්ව ඇති බවට හෝ නිකුත් කිරීමට යෝජනා කරනු ලබන බවට වූ තොරතුරු; සහ

(ඊ) අනාගතයේ දී ක්‍රියාත්මක කළ යුතු බවට තීරණය කර ඇති ලැයිස්තුගත පොදු සමාගමට අදාළ කරුණු,

ඇතුළත් වේ.

තොරතුරු සාමාන්‍යයෙන් ලබා ගත හැකි බවට පත්වීම

**134.** (1) මේ පරිච්ඡේදයේ, සාමාන්‍යයෙන් ලබාගත හැකි තොරතුරු යන්නෙන්-

(අ) එම තොරතුරු මගින් එහි මිලට හෝ වටිනාකමට බලපෑමක් විය හැකි ආකාරයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන හෝ වෙළෙඳාම් කරන සාධාරණ තැනැත්තකුගේ

අවධානය යොමුවන හෝ අවධානය යොමු වීමට නැඹුරු වන ආකාරයකින් පළ කර ඇති හෝ දැනගැනීමට සලස්වා ඇති; සහ

(ආ) එම තොරතුරු දැන ගැනීමට සැලැස්වූ දින සිට එම තොරතුරු යම් තැනැත්තන් අතර බෙදා හැරීම සඳහා සාධාරණ කාලසීමාවක් ගත වී ඇති,

යම් තොරතුරු අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරුවලට එම තොරතුරුවලින් සිදු කරන ලද හෝ ලබාගත් නිගමන හෝ තීරණවලින් සමන්විත වන තොරතුරු ඇතුළත් වේ.

සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑම

**135.** මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා, සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති තොරතුරු යන්නෙන්, එකී තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට, සුරැකුම්පත්වල ආයෝජනය කරන සාධාරණ තැනැත්තකුට එකී සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම සිදු කළ යුතු ද නැද්ද යන්න නැතහොත් එම සුරැකුම්පත් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහසින් ගිවිසුමකට එළඹිය යුතු ද නැද්ද යන්න පිළිබඳව තීරණය කිරීම සඳහා බලපෑම් කරන යම් තොරතුරු අදහස් වේ.

"කටයුතු සැලැස්වීම" පිළිබඳ සඳහන

**136.** 137 වන වගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකු විසින් යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කිරීමට හෝ නොකර හැරීමට වෙනත් යම් තැනැත්තකු පොලඹවන්නේ නම්, උපදෙස් දෙන්නේ නම්, කැමති කරවා ගන්නේ නම්, දිරිමත් කරන්නේ නම් හෝ මඟපෙන්වන්නේ නම්, එකී මුලින් සඳහන් කරන ලද තැනැත්තා විසින් එකී අනෙක් තැනැත්තා ලවා එකී ක්‍රියාව හෝ නොකර හැරීම සිදු කිරීමට කටයුතු සලස්වනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාන්‍යයෙන් ලබාගත නොහැකි තොරතුරු තම සන්තකයේ ඇති යම් තැනැත්තන් විසින් සිදු කිරීමට තහනම් ක්‍රියා

**137.** (1) මේ කොටසේ කාර්යය සඳහා, "අභ්‍යන්තරික තැනැත්තා" යන්නෙන්, එකී තැනැත්තා අදාළ සමාගමට සම්බන්ධ වුව ද සම්බන්ධ නොවුව ද-

(අ) සාමාන්‍යයෙන් ලබා ගත නොහැකි වන්නා වූ ද සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට, එමඟින් සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම කෙරෙහි සැලකිය

යුතු බලපෑමක් සිදුවන බවට යම් සාධාරණ තැනැත්තකු අපේක්ෂා කරන්නා වූ ද තොරතුරු තම සන්තකයේ ඇති; සහ

(ආ) එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත නොහැකි බව දන්නා හෝ ඒ බව දන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි,

යම් තැනැත්තකු අදහස් වේ.

(2) අභ්‍යන්තරික තැනැත්තකු විසින්, (1) වන උපවගන්තියේ තොරතුරු අදාළ වන යම් සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රධානයා හෝ අනුයෝජිතයා ලෙස-

(අ) එම සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම හෝ එම සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා ගිවිසුමකට හෝ ගනුදෙනුවකට එළඹීම; හෝ

(ආ) එම සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීම හෝ එම සුරැකුම්පත් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට හෝ ගනුදෙනුවකට එළඹීම සඳහා ඍජුව හෝ වක්‍රව හෝ කටයුතු සැලැස්වීම,

කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ තොරතුරු අදාළ වන සුරැකුම්පත් යම් විනිමය ස්ථානයක සුරැකුම්පත් වෙළෙඳපොළක වෙළෙඳාම් කිරීම සඳහා අවසර දී ඇති අවස්ථාවක, එකී අනෙක් තැනැත්තා විසින්-

(අ) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු අදාළ වන යම් සුරැකුම්පත් අත් කරගනු, බැහැර කරනු හෝ එම සුරැකුම්පත් අත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට එළඹෙනු ඇති බව හෝ එසේ කිරීමට නැඹුරු වනු ඇති බව; හෝ

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු අදාළ වන යම් සුරැකුම්පත් තුන්වන පාර්ශ්වයක් ලවා අත්කර ගැනීමට, බැහැර කිරීමට හෝ එම සුරැකුම්පත් අත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට එළඹීමට කටයුතු සලස්වනු ඇති බව හෝ එසේ කිරීමට එම තුන්වන පාර්ශ්වයට මඟ පෙන්වනු ඇති බව හෝ එසේ කටයුතු සැලැස්වීමට හෝ මඟ පෙන්වීමට නැඹුරු වනු ඇති බව, එම අභ්‍යන්තරික තැනැත්තා දන්නේ නම් හෝ ඔහු ඒ බව

දන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්, එම අභ්‍යන්තරික තැනැත්තා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු ඍජුව හෝ වක්‍රව හෝ වෙනත් යම් තැනැත්තකුට සන්නිවේදනය කිරීම හෝ සන්නිවේදනය කිරීමට සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

සමාගමක නිලධරයකු සන්තකයේ ඇති තොරතුරු

**138.** (1) මේ පරිච්ඡේදයේ-

(අ) එම සමාගමේ නිලධරයකු-

(i) සන්තකයේ දරා සිටින්නා වූ සහ එම සමාගමේ නිලධරයකු වශයෙන් තම කාර්ය ඉටු කරන අතරතුර දී තම සන්තකයට පත් වූ; හෝ

(ii) ඔහු එම සමාගමේ නිලධරයකු වීම හේතුවෙන් දැන සිටින හෝ දැන සිටිනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි;

(ආ) එම සමාගමේ නිලධරයකු විසින් සන්තකයේ දරා සිටින්නා වූ සහ පළමුවෙන් සඳහන් කළ සමාගමේ සම්බන්ධිත සමාගමක නිලධරයකු වශයෙන් තම කාර්ය ඉටු කරන අතරතුර දී-

(i) එම තොරතුරු සන්තකයේ තබා ගැනීමේ හේතුව මත එම නිලධරයා අභ්‍යන්තරික තැනැත්තකු වන;

(ii) පළමුවෙන් සඳහන් කළ සමාගම විසින් කරනු ලබන සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීම සඳහා වන තීරණවලට, ගනුදෙනුවලට හෝ ගිවිසුම්වලට එළඹීමට අදාළ නිලධරයා සම්බන්ධ වී ඇති සහ එම නිලධරයා ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තරික තැනැත්තකු වන හෝ එම සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීම සඳහා යම් ගිවිසුමකට එළඹෙන, නැතහොත් 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් අවස්ථානුගත කරුණුවල දී එම සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීමට හෝ එසේ කිරීම සඳහා වන ගිවිසුමකට එළඹීමට වෙනත් යම් තැනැත්තකු ලවා කටයුතු සලස්වනු ලබන නැතහොත් එම තොරතුරු සන්නිවේදනය කරනු ලබන; හෝ

(iii) එම තොරතුරු ඇත්ත වශයෙන්ම සන්නිවේදනය නොකළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එම නිලධරයා විසින් එසේ තම තනතුරේ කටයුතු කිරීමේ දී පළමුවෙන් සඳහන් කළ සමාගමේ තවත් නිලධරයකුට එම තොරතුරු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කිරීම සාධාරණ වන අවස්ථාවක තම සන්තකයට පත් වූ,

යම් තොරතුරු යම් සමාගමක් විසින් සන්තකයේ දරනු ලබන ලෙස සලකනු ලබන්නේ ය.

(2) මේ වගන්තියේ "තොරතුරු" යන්නෙන්, සමාගමක් විසින් සන්තකයේ දරනු ලබන ලෙස සලකනු ලබන තොරතුරු අදහස් වන අතර, "අභ්‍යන්තරික තැනැත්තා" යන්නෙන්, එම තොරතුරු සන්තකයෙහි ඇති තැනැත්තකු අදහස් වේ.

(3) ගනුදෙනුවකට හෝ ගිවිසුමකට එළඹීම මගින් 137 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්ති කඩ කළ බවට චෝදනා ලැබූ සමාගමක් විසින්-

(අ) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය එම තොරතුරු සන්තකයේ ඇති සමාගමේ නිලධරයකු නොවන වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සමාගම වෙනුවෙන් ගනු ලැබූ බව;

(ආ) එම අවස්ථාවේ දී-

(i) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය ගැනීමට සම්බන්ධ වූ හෝ එම තීරණය ගනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ගෙන් එක් අයෙකුට එම තොරතුරු සන්නිවේදනය නොකළ බවට;

(ii) එම තොරතුරු සන්තකයේ තිබූ තැනැත්තා විසින් එම තැනැත්තාට එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය සම්බන්ධයෙන් කිසිදු උපදෙසක් නොදුන් බවට; හෝ

(iii) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය ගැනීමට එම තොරතුරු සන්තකයේ තිබූ තැනැත්තා සම්බන්ධ නොවන බවට, වගබලා ගන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වැඩපිළිවෙළවල් එම සමාගම තුළ ක්‍රියාත්මකව තිබුණු බව; සහ

(ඇ) එම තොරතුරු සන්නිවේදනය නොකළ බව, එවැනි කිසිම උපදෙසක් ලබා නොදුන් බව සහ එම තොරතුරු සන්තකයේ දරන තැනැත්තා එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වන තීරණයට සම්බන්ධ නොවූ බව,

ඔප්පු කරනු ලැබුවහොත්, එය එම සමාගමට විත්තිවාචකයක් වන්නේ ය.

**හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු, සේවානියුක්තයකු සන්තකයේ ඇති තොරතුරු**

**139.** (1) මේ පරිච්ඡේදයේ-

(අ) එකී හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකුගේ සන්තකයෙහි එම තොරතුරු තිබුණේ නම් සහ එම තොරතුරු එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වීමේ තත්ත්වය හේතු කොටගෙන වෙනත් හවුල්කරුවකු සන්තකයට පත් වූයේ නම්;

(ආ) එම හවුල් ව්‍යාපාරයේ සේවානියුක්තයකුගේ සන්තකයේ එම තොරතුරු තිබුණේ නම් සහ එම කාර්ය ඉටු කරන අතරතුර දී එම තොරතුරු එම සේවානියුක්තයා සන්තකයට පත් වූයේ නම්; හෝ

(ඇ) එම තොරතුර දන්නා හෝ සන්තකයේ ඇති වෙනත් යම් හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු හේතුවෙන් එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු යම් කරුණක් හෝ දෙයක් දැන සිටින්නේ නම් හෝ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්, පටහැනිව ඔප්පු කළහොත් මිස, එම කරුණ හෝ දෙය එම හවුල් ව්‍යාපාරයේ සියලු හවුල්කරුවන් දන්නා බව හෝ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බවට උපකල්පනය කරනු ලැබිය හැකි නම්,

එවැනි යම් තොරතුරු හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සන්තකයේ දරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 137 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්ති කඩ කරමින් ගනුදෙනුවකට එළඹෙනු ලැබූ බවට චෝදනා ලැබූ හවුල් ව්‍යාපාරයක් විසින්-

(අ) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය-

(i) එම තොරතුරු සන්තකයේ නොතිබුණු හවුල්කරුවකු; හෝ

(ii) එම තොරතුරු සන්තකයේ නොතිබුණු, එම හවුල් ව්‍යාපාරයේ සේවානියුක්තයකු,

විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ගනු ලැබූ බව;

(ආ) එම අවස්ථාවේ දී-

(i) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය ගැනීමට සම්බන්ධ වූ හෝ එම තීරණය ගනු ලැබූ හවුල්කරු හෝ සේවානියුක්තයා එම තොරතුරු සන්නිවේදනය නොකරන ලද බවට;

(ii) එම තොරතුරු සන්තකයේ තිබූ හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු විසින් එම හවුල්කරුට හෝ සේවානියුක්තයාට එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය සම්බන්ධයෙන් කිසිදු උපදෙසක් නොදුන් බවට; හෝ

(iii) එම තොරතුරු සන්තකයේ ඇති හවුල්කරු හෝ සේවානියුක්තයා එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණයට සම්බන්ධ නොවන බවට,

වගබලා ගන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි ගිවිසුම් එම හවුල් ව්‍යාපාරය තුළ පැවතුණ බව; සහ

(ඇ) එම තොරතුරු සන්නිවේදනය නොකළ බව, එවැනි කිසිම උපදෙසක් ලබා නොගත් බව සහ එම තොරතුරු සන්තකයේ දරන හවුල්කරු හෝ සේවානියුක්තයා එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය ගැනීමට සම්බන්ධ නොවූ බව,

ඔප්පු කිරීම එම හවුල් ව්‍යාපාරයට විත්තිවාචකයක් වන්නේ ය.

(3) හුදෙක්ම එකී හවුල් ව්‍යාපාරයේ වෙනත් යම් හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු සන්තකයේ ඇති තොරතුරු එකී හවුල්කරු විසින් සන්තකයේ දරනු ලබන බවට සලකනු ලැබීම හේතුවෙන්ම පමණක් එකී හවුල් ව්‍යාපාරය වෙනුවෙන් නොවන ආකාරයකින් එකී උපවගන්තියේ සඳහන් ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම මගින් යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(4) මේ වගන්තියේ "තොරතුරු" යන්නෙන්, එම තොරතුරු සන්තකයේ ඇති එකී හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු අභ්‍යන්තරික තැනැත්තකු වන අවස්ථාවක දී හවුල් ව්‍යාපාරයක් විසින් සන්තකය දරනු ලබන ලෙස සලකනු ලබන තොරතුරු අදහස් වේ.

ප්‍රතිරක්ෂණයට සහ උපප්‍රතිරක්ෂණයට අදාළ ව්‍යතිරේක

**140.** (1) 137 වන වගන්තියේ (2) උපවගන්තිය-

(අ) ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උපප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත් වීම සම්බන්ධයෙන්; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් ගිවිසුමක තත්කාර්ය සඳහා වූ බැඳීමක් යටතේ සුරැකුම්පත් අත්කර ගැනීම සම්බන්ධයෙන්,

අදාළ නොවිය යුතු ය.

(2) 137 වන වගන්තියේ (3) වන උපවන්තිය, එකී තැනැත්තා ලවා, හුදෙක්ම-

(අ) එම සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උපප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත් වීමට; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් ගිවිසුමක තත්කාර්ය සඳහා වූ බැඳීමක් යටතේ එම සුරැකුම්පත් අත්පත් කර ගැනීමට,

කටයුතු සැලැස්වීමේ කාර්ය සඳහා පමණක් යම් තැනැත්තකුට යම් සුරැකුම්පත්වලට අදාළ තොරතුරු සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

සකස් කිරීම පිළිබඳ යෝජනා ක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම සහ සමාගම් අත්කර ගැනීමට අදාළ ව්‍යතිරේක

**141.** (1) සකස් කිරීම පිළිබඳ යෝජනා ක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම සහ සමාගම් අත්කර ගැනීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සිදු කරනු ලබන සුරැකුම්පත් අත්කර ගැනීමක් හෝ බැහැර කිරීමක් නැතහොත් තොරතුරු සන්නිවේදනය කිරීමක් සඳහා 137 වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

(2) එකී සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීතිවලට අනුකූලව සිදු කරනු ලබන අවස්ථාවක වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමේ කාර්ය සඳහා හෝ වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමට අදාළව යම් නඩු කටයුත්තකට හෝ වෙනත් යම් ක්‍රියාමාර්ගයකට අදාළව සුරැකුම්පත් අත්කර ගන්නා හෝ බැහැර කරන නිෂ්කාශනාගාරයක් සඳහා 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(3) එකී විනිමය ස්ථානය හෝ මධ්‍යම තැන්පතුගාරය විසින්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක උපදෙසක් මත ක්‍රියාකරන අවස්ථාවක, සුරැකුම්පත් විකිණීමට හෝ මිල දී ගැනීමකට අදාළව එවැනි යම් විනිමය ස්ථානයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් සඳහා 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

දැන සිටින සමාගමක් සඳහා වන ව්‍යතිරේකය

**142.** (1) හුදෙක්ම එම සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට එය විසින් ඇතුළත් වීමට යෝජනා කරනු ලබන බව හෝ එය විසින් කලින් ඇතුළත් වී ඇති බව එකී සමාගම දැනසිටීම හේතුවෙන්ම පමණක්, එකී සමාගමේ සුරැකුම්පත් නොවන වෙනත් යම් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් යම් සමාගමක් විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(2) (3) වන උපවගන්තියට යටත්ව, හුදෙක්ම එම සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට එකී සමාගම යෝජනා කරන බව හෝ එකී සමාගම කලින් ඇතුළත් වී ඇති බව එකී සමාගමේ නිලධරයකු දැන සිටීම හේතුවෙන්ම පමණක් එකී සමාගමේ සුරැකුම්පත් නොවන වෙනත් යම් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් යම් සමාගමක් විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(3) එකී උපවගන්තියේ සඳහන් කරුණ පිළිබඳව එම සමාගමේ නිලධරයාට ඔහුගේ කාර්ය කරන අතරතුර දී දැන ගැනීමට ලැබුණේ නම් මිස (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(4) (5) වන උපවගන්තියට යටත්ව, හුදෙක්ම එකී සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට එකී සමාගම යෝජනා කරන බව නැතහොත් එකී සමාගම කලින් ඇතුළත් වී ඇති බව එකී තැනැත්තා දැන සිටීම හේතුවෙන්ම පමණක් යම් සමාගමක සුරැකුම්පත් නොවන වෙනත් යම් සුරැකුම්පත්වලට අදාළව යම් සමාගමක් වෙනුවෙන් ගනුදෙනුවකට හෝ ගිවිසුමට ඇතුළත් වීම මගින් යම් තැනැත්තකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(5) එකී උපවගන්තියේ සඳහන් කරුණු පිළිබඳව එම තැනැත්තාට පළමුව සඳහන් සමාගමේ නිලධරයකු වශයෙන් තම කාර්ය කරන අතරතුර දී නැතහොත් පළමුව සඳහන් සමාගමේ අනුයෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීමේ දී දැන ගැනීමට ලැබුණේ නම් මිස, (4) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

පුද්ගලයකුට අදාළ ව්‍යතිරේකය

**143.** හුදෙක්ම එකී, සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට තමා යෝජනා කරන බව හෝ තමා කලින් ඇතුළත් වී ඇති බව එම පුද්ගලයා දැන සිටීම හේතුවෙන්ම පමණක් එම සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් යම් පුද්ගලයකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

වෙළෙඳපොළ අතරමැදියන් විසින් සිදු කරන ඉල්ලා නොසිටි ගනුදෙනුව

**144.** (1) (අ) එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වූයේ එකී අනෙක් තැනැත්තාගේ නිශ්චිත උපදෙසක් යටතේ නම් සහ එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වන ලෙස සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන එකී වෙළෙඳපොළ අතරමැදියා විසින් හෝ එහි නියෝජිතයා විසින් ඉල්ලා සිටිනු නොලැබුණි නම්; හෝ

(ආ) සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන එකී වෙළෙඳපොළ අතරමැදියා හෝ එහි නියෝජිතයා විසින් එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට

අදාළව එකී අනෙක් තැනැත්තාට යම් උපදෙසක් ලබා දී නැත්නම් හෝ අන්‍යාකාරයකින් එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වීම සඳහා එකී අනෙක් තැනැත්තාගෙන් උපදෙස් ඉල්ලා නොමැති නම්; සහ

(ඇ) සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන එකී වෙළෙඳපොළ අතරමැදියා සමඟ හෝ ඔහුගේ නියෝජිතයා සමඟ එකී අනෙක් තැනැත්තා සම්බන්ධ වී නොමැති නම්,

විනිමය ස්ථානයක සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් ඇතුළත් වූ ගනුදෙනුවක් හෝ ගිවිසුමක් වන්නා වූ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් අනුයෝජිතයකු වශයෙන් ඇතුළත් වීම මගින් ආයෝජකයන් වෙනුවෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ එහි නියෝජිතයකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(2) ප්‍රධානයා වශයෙන් ස්වකීය තත්ත්වයෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ වගන්තියේ (1) වන උපවගන්තියට අදාළ වෙළෙඳපොළ අතරමැදියකුගේ වගකීම්වලට මේ වගන්තියේ සඳහන් කිසිවකින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවලට අදාළ ව්‍යතිරේකය

**145.** පාදක වූ වත්කම්වල වටිනාකමින් සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒකක අදාළ වන්නා වූ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ බැරකම් අඩු කිරීමෙන් පසු සහ එම සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒකක මිල දී ගැනීම සඳහා වන සාධාරණ ගාස්තුවක් අඩු කිරීමෙන් පසු ඉතිරි වටිනාකම අනුව ප්‍රායෝගිකව හැකි තාක් දුරට සාධාරණ ලෙස ගණනය කළ යුතු බවට භාර ඔප්පුව මගින් නියම කර ඇති මිලකට භාර ඔප්පුවේ අන්තර්ගත හෝ අන්තර්ගත බවට සලකනු ලබන නැවත මිල දී ගැනීමේ ප්‍රතිඥා භාරයකට අනුකූලව සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයකට අදාළ වන භාර ඔප්පුවක් යටතේ භාරකරුවකු විසින් සිදු කරනු ලබන නිදහස් කිරීමක් සම්බන්ධයෙන් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

**තොරතුරු සාමාන්‍ය වීමේ විත්තිවාචකය**

**146.** (1) (අ) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත්වීමට පෙර එම තොරතුරු පිළිබඳව එම ගනුදෙනුවට හෝ ගිවිසුමට අදාළ අනෙක් පාර්ශ්වය දැන සිටියේ නම් හෝ සාධාරණ ලෙස දැන සිටිය හැකි වූයේ නම්; සහ

(ආ) (i) එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට ඉන් ඇති වීමට ඉඩ ඇති බලපෑම හේතුවෙන් තමාට හෝ වෙනත් යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම සම්බන්ධයෙන් වන උපලබ්ධි නොවූ ලාභ හෝ උපලබ්ධි නොවූ පාඩු මගහැරීම ඇතුළු එවැනි යම් ලාභයක් ඔහු ලබා නොගන්නා වූ හෝ එවැනි යම් පාඩුවක් මඟ නොහරින්නා වූ; සහ

(ii) එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට ඉන් ඇති වීමට ඉඩ ඇති බලපෑම හේතුවෙන් තමාට හෝ වෙනත් යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, යම් ලාභයක් ලබා ගැනීමේ හෝ පාඩුවක් මඟ හැරීමේ යම් අරමුණක් එම සුරැකුම්පත් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අරමුණට ඇතුළත් නොවන්නා වූ,

යම් නියම මත සහ යම් අවස්ථානුගත කරුණු යටතේ එම තැනැත්තා විසින් එම සුරැකුම්පත් අත්කරගනු ලබන්නේ නම් හෝ බැහැර කරනු ලබන්නේ නම්,

එවැනි යම් තැනැත්තකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(2) 137 වන වගන්තියේ (3) වන උපවගන්තිය කඩ කිරීමකට චෝදනා ලැබූ තැනැත්තකු විසින්-

(අ) හුදෙක්ම 134 වන වගන්තිය ප්‍රකාරව එකී තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත්වන ආකාරයකට දැනගැනීමට සැලැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පමණක් එම තොරතුරු සන්නිවේදනය කරන තැනැත්තාගේ සන්තකයට එම තොරතුරු පත් වූ බව;හෝ

(ආ) එම තොරතුරු සන්නිවේදනය කිරීමට පෙර අනෙක් පාර්ශ්වය එම තොරතුරු දැන සිටි බව හෝ දැන සිටිය යුතු වූ බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බව,

ඔප්පු කිරීම එම තැනැත්තාට විත්තිවාචකයක් වන්නේ ය.

*මේ කොටස යටතේ වන වැරදි සහ දඬුවම්*

**147.** (1) 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩ කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, ඒ සඳහා වරදකරු කරනු ලැබූ විට දී රුපියල් මිලියන දහයකට නොඅඩු දඩයකට හෝ වසර දහයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කිරීමට අනුබල දෙන හෝ ඒ සඳහා කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්ම එම තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය.

*අධිකරණවල අධිකරණ බලය*

**148.** මේ කොටස යටතේ සිදු කරන ලද සෑම වරදක් ම මහාධිකරණය විසින් අධිචෝදනා පත්‍රයක් නිකුත් කරනු ලැබූ පසු නඩු විභාග කරනු ලැබිය යුතු ය.

*මේ කොටස යටතේ වන වැරදි සඳහා වන අපරාධ නඩු කටයුතු*

**149.** මේ කොටස යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන සෑම අපරාධ නඩු කටයුත්තක්ම නීතිපතිවරයා විසින් පවරා මෙහෙයවනු ලැබිය යුතු ය.

*චෝදක පක්ෂය විසින් විත්තිවාචක විසාධනය කිරීමට අවශ්‍ය නොවන බව*

**150.** 137 වන වගන්තිය යටතේ වන වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව 152 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවරනු ලැබූ යම් අපරාධ නඩු කටයුත්තක දී හෝ නඩුකරයක දී, පැවතුණි නම්, 138 වන, 139 වන, 140 වන, 141 වන, 142 වන, 143 වන, 144 වන, 145 වන සහ 146 වන වගන්ති ප්‍රකාරව එකී ක්‍රියාව මගින් 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩකිරීමක් සංස්ථාපනය වීම වළක්වනු ලබනු ඇති වන්නා වූ යම් සිද්ධිමය කරුණු හෝ අවස්ථානුගත කරුණු නොපවතින බව චෝදක පක්ෂය විසින් හෝ කොමිෂන් සභාව විසින් ඔප්පු කිරීමට අවශ්‍ය නොවන්නේ ය.

හානි වන්දි ඉල්ලීම සඳහා අගතියට පත් පාර්ශ්වයට ඇති අයිතිවාසිකම

**151.** (1) මේ කොටස යටතේ වන 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන වගන්ති හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩ කර ඇති වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය හේතුවෙන් හෝ ඒ මත විශ්වාසය තැබීමෙන් පාඩුවක් හෝ හානියක් විඳින යම් තැනැත්තකු විසින්, එකී අනෙක් තැනැත්තා එම කඩකිරීම සම්බන්ධයෙන් වන වරදකට චෝදනා ලැබ තිබුණ ද නොතිබුණ ද නැතහොත් අපරාධ නඩු කටයුත්තක දී එවැනි කඩ කිරීමක් ඔප්පු කර ඇති වුව ද නැති වුව ද එකී අනෙක් තැනැත්තාට එරෙහිව අධිකරණයක නඩුකරයක් පැවරීම මගින් එම පාඩුවේ හෝ හානියේ වටිනාකමට අදාළ මුදල ආපසු අයකර ගනු ලැබිය හැකි ය.

(2) එම කඩකිරීම සංස්ථාපනය වන ක්‍රියා කලාපය සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක් යටතේ වන යම් වගකීමකට මේ වගන්තිය මගින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

හානියට අදාළ මුදල් ආපසු අයකර ගැනීමට සහ සිවිල් දණ්ඩන ඉල්ලා සිටීමට කොමිෂන් සභාව සතු අයිතිවාසිකම

**152.** (1) යම් තැනැත්තකු විසින් 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන වගන්ති හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩකර ඇති බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක සහ එම කඩ කිරීමේ ස්වභාවය සහ ආකාරය, ඉන් වෙළෙඳපොළට ඇතිවන බලපෑම සහ යම් ආයෝජකයකුට ඇති වූ පාඩුවේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන එසේ කිරීමට අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක සිවිල් නඩුකටයුත්තක් පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවරන ලද නඩු කටයුත්තක දී, එකී තැනැත්තා විසින් 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන වගන්ති හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩකර ඇති බවට සම්භාව්‍යතා වැඩි බර අනුව අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින්-

(අ) එම තැනැත්තා ලබා ගත් මූල්‍ය ලාභයේ හෝ මඟ හැරි පාඩුවේ දළ වටිනාකම මෙන් තුන් ගුණයකට සමාන මුදලක් කොමිෂන් සභාවට ගෙවන ලෙස; හෝ

(ආ) කඩ කිරීමේ බරපතළකම හෝ බැරෑරුම්කම සැලකිල්ලට ගෙන අධිකරණය විසින් උචිත යයි සලකනු ලබන පරිදි රුපියල් මිලියන දහයකට නොඅඩු වූ ද රුපියල් මිලියන සියයකට නොවැඩි වූ ද මුදලක සිවිල් දඩයක් ගෙවන ලෙස,

එම තැනැත්තාට එරෙහිව ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තියේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අධිකරණය විසින් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ වන නඩු කටයුතු කොමිෂන් සභාව විසින් පැමිණිලිපතක් මගින් පවරනු ලැබිය යුතු වන අතර, පැමිණිලිපතක් ගොනු කිරීම මගින් පවරනු ලබන සාමාන්‍ය නඩුකර සම්බන්ධයෙන් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ අඩංගු විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සඳහා අදාළ විය යුතු ය.

(4) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි එකී තැනැත්තා ලබාගත් මූල්‍ය ලාභයේ හෝ මඟ හැරි පාඩුවේ දළ වටිනාකම මෙන් තුන්ගුණයකට සමාන මුදලක්, වගකීම පිළිගෙන හෝ නොගෙන, ගෙවීම සඳහා යම් තැනැත්තකු සමඟ කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹීම වළක්වන බවට තේරුම් ගනු නොලැබිය යුතු ය.

(අ) එම තැනැත්තා ලබා ගත් මූල්‍ය ලාභයේ හෝ මඟ හැරි පාඩුවේ දළ වටිනාකම මෙන් තුන් ගුණයකට සමාන මුදලක් කොමිෂන් සභාවට ගෙවන ලෙස; හෝ

(ආ) කඩකිරීමේ බරපතළකම හෝ බැරෑරුම්කම සැලකිල්ලට ගෙන අධිකරණය විසින් උචිත යයි සලකනු ලබන පරිදි රුපියල් මිලියන දහයකට නොඅඩු වූ ද රුපියල් මිලියන සියයකට නොවැඩි වූ ද මුදලක් සිවිල් දඩයක් ලෙස ගෙවන ලෙස,

එම තැනැත්තාට එරෙහිව ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වන නඩුකරයක දී හෝ (4) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ආපසු අයකර ගන්නා ලද යම් මුදලක එක් එක් තුනෙන් එකක ප්‍රමාණය-

(අ) එම කඩකිරීම සම්බන්ධයෙන් වන විමර්ශනය සහ නඩු කටයුත්තකට අදාළ සියලු ගාස්තු කොමිෂන් සභාවට ප්‍රතිපූරණය කිරීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය;

(ආ) එම කඩකිරීමේ ප්‍රතිඵලයක් ලෙස පාඩු හෝ හානි විඳ ඇති තැනැත්තන්ට වන්දි ගෙවීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය; සහ

(ඇ) වන්දි අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, එකී එක් එක් තැනැත්තාට බෙදා හැරිය යුතු මුදල හෝ වන්දි ගෙවීමට සුදුසු තැනැත්තන් නිශ්චය කර ගැනීමට හෝ ඔවුන්ට ඒ පිළිබඳ දැනුම් දීමට ඇති අපහසුතාව පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන්ට වන්දි ගෙවීම ප්‍රායෝගික නැති බවට කොමිෂන් සභාව සලකනු ලබන්නේ නම්, කොමිෂන් සභාව විසින්, (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන්ට එම මුදල් බෙදා නොහැරීමට තීරණය කර එම මුදල් කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැර කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තියේ සඳහන් අධිකරණය විසින් කරන ලද ආඥාවේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත තමා වෙත නියම කරන ලද සිවිල් දඩය හෝ (4) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම ප්‍රකාරව ගෙවිය යුතු මුදල ගෙවීමට එකී තැනැත්තා අපොහොසත් වුවහොත්, කොමිෂන් සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, එම සිවිල් දණ්ඩනය හෝ මුදල කොමිෂන් සභාවට අයවිය යුතු විනිශ්චිත ණයක් මෙන් සලකා ආපසු අයකර ගනු ලැබිය හැකි ය.

කාලාවරෝධය

**153.** 152 වන වගන්තිය යටතේ වන නඩුකරයක් මේ කොටසේ යම් විධිවිධානයක් කඩ කළ දින සිට වසර හයක් ඉකුත් වීමෙන් පසු ආරම්භ කරනු නොලැබිය යුතු ය.

## VI වන කොටස

### මුදල්

මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ

**154.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ:-

(අ) කොමිෂන් සභාවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා විවිධ අරමුදල් පිහිටුවීම; සහ

(ආ) වෙනත් කිසිම ප්‍රතිකර්මයක් නොමැති ආයෝජකයන්ට සීමිත වන්දි සැපයීමට අරමුදලක් පිහිටුවීම,

විය යුතු ය.

## **1** වන පරිච්ඡේදය

### **කොමිෂන් සභාවේ අරමුදල්**

සෙස් බද්දක් අය කිරීම

**155.** (1) *ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්* අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව වූ සෙස් බද්දක්, විනිමය ස්ථානයක වාර්තාගත හෝ එහි රීති යටතේ එවැනි ගැනුම්කරුවකු සහ විකුණුම්කරුවකු යන දෙදෙනාම විසින් ඊට දන්වන ලද හෝ සුරැකුම්පත් පිළිබඳ සෑම මිල දී ගැනීමක් හෝ විකිණීමක් සම්බන්ධයෙන් නියම කිරීම, අය කිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු ය. එකිනෙකට වෙනස් පන්තිවලට අයත් සුරැකුම්පත් සඳහා එකිනෙකට වෙනස් අනුප්‍රමාණ නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ පනවනු ලබන සෙස් බද්ද, වෙනත් යම් නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතු ය.

සෙස් බදු අරමුදල

**156.** (1) කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන, "සෙස් බදු අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, 155 වන වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය:-

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටුවනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම;

(ඇ) එහි කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාස, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්ය සඳහා ණය ලබා දීම;

(ඉ) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාව පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශීය රටක දී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීම.

(3) සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ අරමුදල

**157.** (1) කොමිෂන් සභාවට, සභාවේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට, -

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ වන සියලු පරීක්ෂණ සිදු කිරීමේ දී දරන ලද වියදම් වශයෙන් අය කරගනු ලැබිය හැකි හෝ මේ පනතේ විධිවිධාන යටතේ ගාස්තු වශයෙන් ගෙවන ලද සියලු මුදල් ප්‍රමාණයන්;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ වන කඩකිරීම් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමේ දී හෝ නඩු කටයුතු පැවරීමේ දී දරන ලද වියදම් සඳහා ප්‍රතිපූරණ ලෙස ආපසු අයකර ගනු ලබන යම් මුදල් ප්‍රමාණයන්;

(ඈ) ඒකාබද්ධ අරමුදලෙන්, රජයෙන් හෝ විදේශීය රජයකින්, රජයේ නියෝජ්‍යායතනවලින් සහ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය නියෝජ්‍යායතනවලින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඉ) සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) එහි බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

2 වන පරිච්ඡේදය

**ආයෝජකයින්ට වන්දි ලබා දීම සඳහා වන අරමුදල**

**158.** (1) යම් බලපත්‍රලත් කොටස් තැරැව්කරුවකුට හෝ කොටස් වෙළෙන්දකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්, "වන්දි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. වන්දි අරමුදල

(2) එම වන්දි අරමුදල-

(අ) පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්,

සමන්විත විය යුතු ය.

(3) වන්දි අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

වන්දි කමිටුවක් පත් කිරීම

**159.** (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ සාමාජිකයින් අතරින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ වන්දි කමිටුව සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුව 162 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම සහ ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන් කමිටුව විසින් ලබා දෙනු ලබන තීරණයක් මේ පනතේ කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

වන්දි සඳහා ඉල්ලුම් කිරීම

**160.** (1) එකී ආයෝජකයා කෙරෙහි වූ ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට යම් බලපත්‍රලත් කොටස් තැරැව්කරුවකුට හෝ කොටස් වෙළෙන්දකුට නොහැකි බවට තීරණය කිරීම හේතු කොටගෙන මූල්‍යමය පාඩුවක් සිදු වී ඇති යම් ආයෝජකයකු විසින්, වන්දි අරමුදලින් වන්දි ලබාදෙන ලෙස ඉල්ලා නියමිත ආකෘතිය අනුව කමිටුව වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එකී ඉල්ලුම්කරු විසින් වන්දි ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම සනාථ කරනු පිණිස යම් ලේඛනයක් හෝ වෙනත් සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් කලින් කලට යම් ඉල්ලුම්කරුවකුගෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. එම ඉල්ලීමට අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක, කමිටුව විසින් එම ඉල්ලුම්කරුගේ ඉල්ලීම සඳහා අවසර නොදෙනු ලැබිය හැකි ය.

(3) ඕනෑම විටක දී, එසේ කිරීමට අවශ්‍ය යැයි කමිටුව සලකනු ලැබුවහොත්, කමිටුව විසින්, ඉල්ලුම්කරුගේ ඉල්ලීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි අතර ලිඛිත දැන්වීමක් මගින්, එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක දී හා යම් වේලාවක දී එහි නිශ්චිත සඳහන් යම් ස්ථානයකට පැමිණෙන ලෙස

ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය. දැන්වීමෙහි සඳහන් දිනයේ දී එකී පරීක්ෂණය සඳහා පෙනී සිටීමට ඒ ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක, කමිටුව විසින්, එම ඉල්ලුම්කරුගේ ඉල්ලීමට අවසර නොදෙනු ලැබිය හැකි ය.

**161.** (1) ඉල්ලුම්කරුවකු විසින් තම ඉල්ලීම සනාථ කරනු පිණිස ඉදිරිපත් කරන ලද ලේඛන හෝ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව හෝ පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවක දී, එම පරීක්ෂණය අවසන් වූ පසු, කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීම සඳහා අවසර දීම හෝ අවසර නොදීම කරනු ලැබිය හැකි ය. වන්දි ගෙවීම

(2) කමිටුව විසින් යම් ඉල්ලීමකට අවසර දෙනු ලබන අවස්ථාවක, කමිටුව විසින්, ගෙවිය යුතු සීමිත වන්දි ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක් කර ඊට අදාළව ප්‍රදානයක් කරනු ලැබිය යුතු ය. එකී ප්‍රදානය පිළිබඳ දැන්වීම ඉල්ලුම්කරු වෙත ලිඛිතව ලබා දෙනු ලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

**මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය**

**162.** එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනෙන් ආරම්භ වන මාස දොළහක කාලසීමාව කොමිෂන් සභාවේ මුදල් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය

**163.** (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය. ගිණුම් විගණනය

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**VII වන කොටස**

සාමාන්‍ය

**164.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ ලේඛන ඉදිරිපත් කිරීම, තොරතුරු හෙළිදරව් කිරීම, පැමිණිලි නිරාකරණ කමිටුවක් පිහිටුවීම, පරීක්ෂණ සහ විමර්ශන පැවැත්වීම, තොරතුරු බෙදා මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ

ගැනීම සහ ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීමට අදාළ මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම වන්නේ ය.

## 1 වන පරිච්ඡේදය

### ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන

ලේඛන ඉදිරිපත් කිරීම සහ තොරතුරු හෙළිදරව් කිරීම

**165.** (1) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින්, ලිඛිත දැන්වීමක් මගින්, එකී ලිඛිත දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත යම් බද්දක් පැනවීමට සහ අය කර ගැනීමට අදාළ යම් නීතියක් යටතේ හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම තහනම් කර ඇති යම් තොරතුරක් හෝ ලේඛනයක් හැර එකී දැන්වීමේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද මේ පනත යටතේ එහි බලතල නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හෝ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නා වූ ද යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස හෝ යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත එම දැන්වීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු යම් තැනැත්තකුගේ කාර්යය විය යුතු අතර, එම දැන්වීමට අනුකූලව කටයුතු කිරීමේ දී එම තැනැත්තා විසින් යම් නීතියක් යටතේ ඔහු විසින් එසේ සිදු කිරීම තහනම් වන්නා වූ යම් තොරතුරක් හෙළිදරව් කරන හෝ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ඉදිරිපත් කරන අවස්ථාවක, එම නීතියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එම හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම එම නීතියේ විධිවිධාන කඩ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමකට අනුකූලව කටයුතු කිරීමේ දී සපයන ලද යම් තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලද ලේඛනයක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක අන්තර්ගතයන්-

(අ) අධිකරණ ආඥාවක් මත;

(ආ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කරන අතුරතුර දී; හෝ

(ඇ) එකී තොරතුර, ලේඛනය හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාව සපයන තැනැත්තාගේ කැමැත්ත ඇතිව,

හැර වෙනත් යම් තැනැත්තකු වෙත පළ කිරීම හෝ සන්නිවේදනය කිරීම කරනු නොලැබිය යුතු ය.

(4) එම තොරතුර, ලේඛනය හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාව සපයන තැනැත්තා මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් විමර්ශනයට භාජනය වෙමින් සිටින අවස්ථාවක (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වූ කැමැත්ත අවශ්‍ය නොවන්නේ ය.

පරීක්ෂණ සහ විමර්ශන

**166.** (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ කොමිෂන් සාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණ පැවැත්වීම හෝ විමර්ශන සිදු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (අ) යම් තැනැත්තකු විසින් ආයෝජකයන්ට හෝ සුරැකුම්පත් වෙළෙඳපොළට අහිතකර ආකාරයකින් සුරැකුම්පත් ගනුදෙනු සිදු කරනු ලබන බවට; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ විධානයක් යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ආයෝජකයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කඩ කර තිබෙන බවට,

විශ්වාස කිරීමට කොමිෂන් සභාව සතුව සාධාරණ හේතු පවතින අවස්ථාවක (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින්, සාක්ෂි ලබා දීමට හෝ එම විමර්ශනයේ හෝ පරීක්ෂණයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ එම තැනැත්තා සන්තකයේ හෝ ඔහුගේ පාලනයේ ඇති යම් පොතක්

හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට කොමිෂන් සභාව ඉදිරියෙහි හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තා ඉදිරියෙහි පෙනී සිටින ලෙස සිතාසි යැවීම සහ කැඳවීම හෝ සිදු කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව ඉදිරියෙහි හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු ඉදිරියෙහි පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කරනු ලැබූ හෝ කැඳවනු ලැබූ යම් තැනැත්තකුගෙන් වාචිකව ප්‍රශ්න අසනු ලැබිය හැකි අතර, එසේ ප්‍රශ්න ඇසීමට ලක් වූ තැනැත්තා විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් ලේඛනගත කරනු ලැබිය හැකි ය. එසේ ලේඛනගත කළ සෑම ප්‍රකාශයක් ම එසේ ප්‍රශ්න ඇසීමට ලක් වූ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, ඊට අත්සන් කිරීමට පෙර, එම ප්‍රකාශය එම තැනැත්තා විසින් කියවනු ලැබිය යුතු අතර, ඔහුට එම ප්‍රකාශය ලියා ඇති භාෂාව තේරුම් ගත නොහැකි නම් ඔහුට තේරුම් ගත හැකි භාෂාවකින් ඔහු වෙත එම ප්‍රකාශය තේරුම් කර දිය යුතු වන අතර ඔහුට එම ප්‍රකාශය පැහැදිලි කිරීමට හෝ ඊට යමක් එකතු කිරීමට නිදහස තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ තැනැත්තා ඉදිරියේ පෙනී සිටීමට නියම කර ඇති අවස්ථාවක, එසේ කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම හෝ කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් ඔහු වෙත යොමු කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරන ලද තැනැත්තකු විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබූ විට දී, ඔහු සතුව හෝ ඔහුගේ පාලනය යටතේ පවතින යම් පොතක්, ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකුට ඒවායෙහි පිටපත් ලබා ගැනීමට ඉඩදීම ප්‍රතික්ෂේප කරන හෝ කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් අසනු ලබන යම් ප්‍රශ්නයකට දැන දැන ම අසත්‍ය පිළිතුරු ලබා දෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(5) (අ) (1) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්,

අවශ්‍ය පරිදි, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ පිළිගත් යම් නිලධරයකුට සහ යම් විශේෂඥයකුට, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ එම ව්‍යාපාරයට අදාළව තබා ගැනීමට නියම කර ඇති යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් පරීක්ෂා කර ඒවායේ පිටපත් ලබා ගැනීම සඳහා හෝ එවැනි යම් ඉලෙක්ට්‍රොනික උපකරණයක් තම සන්තකයට ගැනීම සඳහා ද මේ පනත යටතේ වන එහි කාර්ය ඉටු කිරීම සඳහා එම තොරතුරු අවශ්‍ය විය හැකි යැයි විශ්වාස කිරීමට කොමිෂන් සභාවට සාධාරණ හේතු ඇති විට දී, සාක්ෂි රැස් කිරීම සඳහා ඔවුන්ගේ පරිගණක පද්ධතිවලට ප්‍රවේශ වීම සඳහා ද දවසේ සියලු සාධාරණ හෝරාවන්හි දී වෙළෙඳපොළ ආයතනයක හෝ වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලැයිස්තුගත පොදු සමාගමක යම් පරිශ්‍රයකට ඇතුළු වීමට ලිඛිතව බලය දෙනු ලැබිය හැකි ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා, එකී බලයලත් තැනැත්තන් විසින් එය (1) වන උපවගන්තිය යටතේ වන සාර්ථක විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සඳහා වන වැදගත් සාක්ෂියක් ලෙස සලකනු ලබන්නේ නම්, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥාවක් මත, (අ) ඡේදයේ නිශ්චිතව දක්වා නොමැති වෙනත් යම් පරිශ්‍රයකට ප්‍රවේශ වී යම් දේපළක්, පොතක්, ලේඛනයක්, ද්‍රව්‍යයක්, දෙයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ උපකරණයක් හෝ වෙනත් කවර හෝ ආකාරයක දෙයක් පරීක්ෂා කිරීම සහ එම පොතේ, ලේඛනයේ, ද්‍රව්‍යයේ, දෙයෙහි හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් කවර හෝ ආකාරයක දෙයක පිටපත් තහනමට ගැනීම හෝ ඒවා තම සන්තකයට ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(6) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, (1) වන උපවගන්තිය යටතේ බලයලත් සෑම නිලධරයකු ම සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවලට හෝ ලේඛනවලට අදාළ මේ පනතේ වෙනත් යම් වගන්තියක් යටතේ යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සිදු කිරීම සම්බන්ධයෙන් 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.

(8) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අවස්ථාවෝචිත පරිදි, විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අතරතුර හෝ පරීක්ෂණයක් සහ විමර්ශනයක් යන දෙකම අතරතුර හෝ රැස් කර ගන්නා ලද තොරතුරු පිළිබඳ සලකා බැලීමේ දී, යම් තැනැත්තකු විසින් V වන කොටස යටතේ වන වරදක් හැර මේ පනත යටතේ වන වෙනත් යම් වරදක් සිදු කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීමට හෝ මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි වෙනත් යම් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගයක් ගැනීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට බලය දෙනු ලැබිය හැකි ය.

(9) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නේ නම්, කොමිෂන් සභාව විසින්, මේ කොටස යටතේ රැස් කරගත් සහ ලබාගත් තොරතුරු වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සුදුසු යම් ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා නීතිපතිවරයාට හෝ වෙනත් යම් අධිකාරියකට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

අවුරා තැබීමේ නියෝග නිකුත් කිරීම

**167.** (1) මේ පනතේ, යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් පිළිබඳව ඇති සාධාරණ සැකයක් මත, 165 වන වගන්තිය ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කරමින් පවතින හෝ යම් තැනැත්තකු විමර්ශනයට ලක් කරමින් පවතින ඕනෑම අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්,-

(අ) යම් තැනැත්තකු විසින් එම තැනැත්තාගේ වත්කම් හෝ එහි යම් කොටසක් බැහැර කිරීම තහනම් කරමින්; හෝ

(ආ) යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ගනුදෙනුවකට හෝ ගනුදෙනු පන්තියකට එළඹීම තහනම් කරමින්,

(මෙහි මින් මතු "අවුරා තැබීමේ නියෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අවුරා තැබීමේ නියෝගයක්, එම නියෝගය නිකුත් කළ දින සිට වෙළෙඳපොළ දින හතක් ඉක්මවන කාලසීමාවක් දක්වා බල නොපැවැත්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අවුරා තැබීමේ නියෝගයක් නිකුත් කිරීමෙන් පසුව ද, එම අවුරා තැබීමේ නියෝගය බලාත්මකව පවතින කාලසීමාව ඇතුළත ද, කොමිෂන් සභාව විසින්, එම අවුරා තැබීමේ නියෝගය ස්ථිර කරන ලෙස ඉල්ලා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, අවස්ථානුගත කරුණු අනුව එසේ කිරීමට අවශ්‍ය නම්, අගතියට පත් තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු අවශ්‍ය පරිදි, එම නියෝගය දීර්ඝ කරන ලෙස ද ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(4) එම අවුරා තැබීමේ නියෝගය නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින්, එම අවුරා තැබීමේ නියෝගය ස්ථිර කරනු ලැබිය හැකි අතර, එය දීර්ඝ කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් උචිත යැයි සලකනු ලබන යම් කාලසීමා දක්වා, අධිකරණය විසින්, එම නියෝගය දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, අධිකරණය විසින්, යම් අවුරා තැබීමේ නියෝගයක් යටතේ ඇති වත්කම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සුදුසු ආඥාවක් කරනු ලැබිය යුතු ය.

පැමිණිලි නිරාකරණ කමිටුව විසින් පරීක්ෂණ පැවැත්වීම

**168.** (1) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලියාපදිංචි තැනැත්තකු හෝ කොමිෂන් සභාවේ නියාමන විෂයපථය යටතට ගැනෙන වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද වෘත්තීමය විෂමාචාරයකට හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ නිකුත් කරන ලද විධාන කඩකිරීමකට හෝ අදාළව, යම් තැනැත්තකු විසින් සිදු කරන ලද පැමිණිලි විභාග කිරීමට කොමිෂන් සභාව විසින් පැමිණිලි නිරාකරණ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වන කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යැයි එය හෝ ඔහු විසින් සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණ පවත්වනු ලැබිය හැකි අතර, එම කාර්ය සඳහා, සාක්ෂි දීමට හෝ එම පරීක්ෂණවල කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඔහුගේ සන්තකයේ

පවතින හෝ ඔහුගේ පාලනය යටතේ පවතින යම් පොත් හෝ ලේඛන ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට පැමිණිලි නිරාකරණ කමිටුව ඉදිරියේ පෙනී සිටින ලෙස සිතාසි යැවීම හෝ කැඳවීම හෝ සිදු කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, එම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඊට අදාළ වන සියලු කාරණා සඳහා රීති මගින් සුදුසු ක්‍රියාවලි සහ කාර්යපටිපාටි පිහිටුවනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් ලිඛිත පැමිණිල්ලක් පැමිණිලි නිරාකරණ කමිටුව වෙත ලැබුණ විට දී, පැමිණිලි නිරාකරණ කමිටුව විසින්, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීති කඩකර ඇත් ද යන්න තීරණය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සාක්ෂි පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(5) මේ පනත යටතේ ඇති යම් විධිවිධානයක්, ඒ යටතේ නිකුත් කරන ලද නියෝගයක්, රීතියක් හෝ විධානයක් හෝ යම් වෙළෙඳපොළ ආයතනයක රීති, යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් කඩ කර ඇති බවට පැමිණිලි නිරාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, පැමිණිලි නිරාකරණ කමිටුව විසින්, නිර්දේශයක් ද සමග එම තීරණය කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට හෝ එය විසින් යෝග්‍ය යැයි සලකනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට කොමිෂන් සභාවට අභිමතානුසාරී බලය තිබිය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින්, එම වෙළෙඳපොළ ආයතනයට, වෙළෙඳපොළ අතරමැදියාට, ලැයිස්තුගත පොදු සමාගමට හෝ ලියාපදිංචි තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

අතිරේක සේවා සපයන්නන්

**169.** (1) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු හෝ 81 වන වගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදුකර ඇති ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලැයිස්තුගත නොකළ සමාගමක් සම්බන්ධයෙන් සිදුකරන වෘත්තීමය

සේවාවලට අදාළව අතිරේක සේවා සපයන්නන්ගෙන් තොරතුරු, පැහැදිලි කිරීම් හෝ විස්තර කිරීම් ලබා ගැනීමට කොමිෂන් සභාව හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව සපයන ලද සේවාවන් මගින් ආයෝජකයින්ගේ සුබසිද්ධියට හානියක් ඇති වීමට ඉඩ ඇති බවට කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලෙස එම අතිරේක සේවා සපයන්නාට විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) එසේ කිරීම අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, අතිරේක සේවා සපයන්නන්ගේ කාර්ය සහ බැඳීම් සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා මාර්ගෝපදේශ හෝ රීති සාදනු ලැබිය හැකි ය.

ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම

**170.** කොමිෂන් සභාව විසින්, සුරැකුම්පත් වෙළෙඳපොළවල්වල සුරැකුම්පත්වලට සහ ආයෝජකයන්ට අදාළ නියාමන කර්තව්‍ය පිළිබඳ තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් වෙනත් යම් සංවිධාන සමඟ ගිවිසුම්වලට හෝ අවබෝධතා ගිවිසුම්වලට එළඹෙනු ලැබිය හැකි ය.

තොරතුරු බෙදා ගැනීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම

**171.** (1) කොමිෂන් සභාව විසින්, ස්වකීය මෙහෙයවීමෙන් හෝ නිසි අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥාවක් මත-

(අ) මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද, කොමිෂන් සභාව විසින් තහනමට ගන්නා ලද, රඳවා තබා ගන්නා ලද හෝ තම සන්තකයට ගන්නා ලද යම් දේපළක්, පොතක්, ලේඛනයක්, ද්‍රව්‍යයක්, දෙයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් කවර හෝ ආකාරයකින් වන යම් දෙයක් වෙත ප්‍රවේශ වීම සඳහා සහ ඒවා පරීක්ෂා කිරීම සඳහා යම් පොලිස් නිලධරයකුට හෝ රාජ්‍ය නිලධරයකුට අවසර දෙනු ලැබිය හැකි ය; හෝ

(ආ) එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් තම කාර්ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් සිදු කරන ලද යම් පරීක්ෂණයක් අතරතුර දී,

විමර්ශන නිලධරයකු විසින් හෝ කොමිෂන් සභාව විසින් හෝ තහනමට ගන්නා ලද, රඳවා තබා ගන්නා ලද හෝ තම සන්තකයට ගන්නා ලද යම් පොතක, ලේඛනයක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ වෙනත් කවර හෝ ආකාරයකින් වන යම් දෙයක පිටපතක් පොලිස් නිලධරයකුට හෝ යම් රාජ්‍ය නිලධරයකුට ලබා දෙනු ලැබිය හැකි ය.

(2) එසේ කිරීම අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින්, සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින්-

(අ) යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියකින් යම් තොරතුරක් හෝ ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ලබා ගැනීම; සහ

(ආ) යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියක් සමඟ යම් තොරතුරක් හෝ ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් බෙදාගැනීම,

ඇතුළත් විය හැකි යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා වන නියාමන වැඩපිළිවෙළවල්වලට එළඹෙනු ලැබිය හැකි ය.

(3) එකී විදේශීය අධීක්ෂණ අධිකාරිය විසින් බලාත්මක කරන හෝ පරිපාලනය කරන යම් නියාමන කරුණක් සම්බන්ධයෙන් සහාය ලබා දෙන ලෙස යම් විදේශීය අධීක්ෂණ අධිකාරියක් විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් ලැබුණ විට දී, කොමිෂන් සභාව විසින්, ඒ කාර්ය සඳහා සුදුසු යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් සහායක් එම විදේශීය අධීක්ෂණ අධිකාරිය වෙත ලබා දෙනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ සහාය දිය යුතු ද යන්න තීරණය කිරීමේ දී, කොමිෂන් සභාව විසින්-

(අ) එම විදේශීය අධීක්ෂණ අධිකාරිය වෙත එම සහාය ලබා දීමේ දී දරනු ලබන යම් ගාස්තු සහ වියදම් එම විදේශීය අධීක්ෂණ අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත ගෙවනු ලබන්නේ ද යන්න; සහ

(ආ) කොමිෂන් සභාව විසින් සහාය ලබා ගැනීම සඳහා සිදුකරනු ලබන ඒ හා සමාන ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්

අන්‍යෝන්‍ය සහායක් ලබා දීමට එම විදේශීය අධීක්ෂණ අධිකාරියට හැකියාව සහ කැමැත්ත තිබේ ද යන්න,

පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ -

"දේශීය අධීක්ෂණ අධිකාරිය" යන්නෙන්, මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පත්කරනු ලැබූ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, පොලිසිය සහ යම් ලිඛිත නීතියක් යටතේ වන වෙනත් යම් නියාමන අධිකාරියක් අදහස් වේ;

"විදේශීය අධීක්ෂණ අධිකාරිය" යන්නෙන්, මහජන සුබසිද්ධිය උදෙසා එවැනි වැඩපිළිවෙළකට එළඹීම හෝ එවැනි සහායක් ලබා දීම සුදුසු සහ අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නා වූ මේ පනත යටතේ වන කොමිෂන් සභාවේ කර්තව්‍යවලට අනුරූපී කාර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන යම් විදේශීය අධිකාරියක් හෝ නියාමන කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු හෝ ජාත්‍යන්තර සංවිධානයක් අදහස් වේ; සහ

"රාජ්‍ය නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව මගින් එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

**ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම**

**172.** (1) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් කඩකිරීම් හෝ සිදු වීමට ඉඩ ඇති කඩකිරීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත තොරතුරු සපයනු ලැබීම හේතුවෙන්, සේවායෝජකයකු විසින්, සේවයේ නියුක්ත යම් තැනැත්තකු සේවයෙන් අස්කිරීම, ඔහුගේ සේවය අවසන් කිරීම, ඔහු තනතුරින් පහතට දැමීම හෝ ඔහුට හිරිහැර සිදු කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත තොරතුරු සැපයීම හේතුවෙන් යම් තැනැත්තකුට එරෙහිව ප්‍රතිහිංසා

කරනු ලබන යම් සේවායෝජකයකු, එම සේවායෝජකයාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමෙන් පසු, රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පරිපාලන දණ්ඩනයකට යටත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා, "සේවයේ නියුක්ත යම් තැනැත්තකු" යන්නට, අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, ප්‍රධාන විධායක නිලධරයකු, ප්‍රධාන මූල්‍ය නිලධරයකු, සමාගම් ලේකම්වරයකු, අභ්‍යන්තර විගණකවරයකු හෝ වෙනත් යම් සේවානියුක්තකයකු ඇතුළත් වන්නේ ය.

(4) මේ පනතේ විධිවිධාන කඩකිරීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව කොමිෂන් සභාව විසින් සාර්ථක අපරාධ නඩු කටයුත්තක් සිදු කිරීමට හෝ වෙනත් දණ්ඩනයක් දෙනු ලැබීමට හේතු වන යම් තොරතුරක් මුලින්ම සපයනු ලබන යම් ආයතනවල අකටයුතුකම් දැනුම්දෙන්නකු වෙත ඒ සම්බන්ධයෙන් සාදනු ලබන නීති ප්‍රකාරව කොමිෂන් සභාව විසින් යම් ත්‍යාගයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා වෙත තොරතුරු සැපයීම

**173.** අමාත්‍යවරයා විසින්, කලින් කලට, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව, වාර්තා, ගිණුම් සහ කොමිෂන් සභාවේ වැඩකටයුතු සම්බන්ධයෙන් වන වෙනත් තොරතුරු තමා වෙත සපයන ලෙස කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින්, එකී තොරතුරු සැපයීම මගින්-

(අ) පනත යටතේ සිදු කරමින් පවතින විමර්ශනයකට දැඩි අගතියක් සිදු වනු ඇති බවට;

(ආ) පනත යටතේ වන යම් වරදක් වැළැක්වීමට හෝ හඳුනාගැනීමට දැඩි අගතියක් සිදු වනු ඇති බවට; හෝ

(ඇ) පනත යටතේ කොමිෂන් සභාව විසින් සිදු කරමින් පවතින යම් පරීක්ෂණ හෝ විමර්ශනවලට අදාළ යම් රහසිගත තොරතුරු මූලාශ්‍රයක අනන්‍යතාව හෙළි වනු ඇති බවට,

වූ හේතු මත කොමිෂන් සභාව විසින් රහසිගත යැයි සලකනු ලබන යම් තොරතුරු හැර එකී අනෙකුත් තොරතුරු අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය හැකි ය.

**174.** (1) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානයක් මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් වෙනුවෙන් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට එරෙහිව හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකුට එරෙහිව හෝ කිසිදු සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය. පනත යටතේ ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා ආරක්ෂාව

(2) යම් අධිකරණයක් ඉදිරියේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව ගෙන එන ලද ඕනෑම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කොමිෂන් සභාව වෙත ගෙවනු ලබන හෝ කොමිෂන් සභාව විසින් ආපසු අය කර ගනු ලබන වියදම් කොමිෂන් සභාවේ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානයක් මත සිදු කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට එරෙහිව ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඔහු විසින් දරනු ලබන වියදම්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, එම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තේ දී එම වියදම් ඔහු විසින් ආපසු අය කර ගනු ලැබ ඇත්නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

**දඬුවම් සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණවලට අදාළ විධිවිධාන**

**175.** (1) V වන කොටස යටතේ වන වැරදි හැර- වැරදි

(අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනතේ විධිවිධාන යටතේ නියම කරනු ලබන යම් නියමයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ විධානයක් කඩ කරනු ලබන;

(ආ) මේ පනතේ හෝ මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් රීතියක් හෝ විධානයක් යටතේ නියම කරන ලද යම් නියමයක

කාර්ය සඳහා, ඔහු දන්නා තරමට අසත්‍ය, වැරදි හෝ නොමඟ යවන සුලු කරුණු ඇතුළත් යම් තොරතුරක් හෝ යම් වාර්තාවක්, ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ ප්‍රකාශයක් සපයනු ලබන හෝ ඉදිරිපත් කරනු ලබන;

(ඈ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට හෝ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වන ස්වකීය කාර්ය ඉටු කරන අතරතුර දී කොමිෂන් සභාව විසින් යම් ගිවිසුමකට එළඹ ඇත්තේ යම් තැනැත්තකු සමඟ ද එම තැනැත්තාට තර්ජනය කරනු ලබන හෝ ඔහු බිය ගන්වනු ලබන හෝ ඔහුට හිතාමතාම බාධා කරනු ලබන හෝ ඔහු අපකීර්තියට පත් කිරීමේ හෝ ඔහුට අපහාස කිරීමේ අදහස ඇතිව අවනම්බු සහගත ප්‍රකාශ සිදු කරනු ලබන සහ යම් ප්‍රකාශයක් පළ කරනු ලබන;

(ඇ) වෙළෙඳපොළ ආයතනයක, වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලැයිස්තුගත පොදු සමාගමක හෝ එහි යම් සම්බන්ධිත සමාගමක ව්‍යාපාර කටයුතුවලට අදාළ යම් තොරතුරක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් යම් ආකාරයකින් වංචනික ලෙස වෙනස් කරනු ලබන හෝ එවැනි යම් පොතක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක නොමඟ යවන සුලු හෝ අසත්‍ය තොරතුරු ගබඩා කරනු ලබන; හෝ

(ඉ) යම් තැනැත්තකුට වංචා කිරීමේ හෝ මේ පනත යටතේ වන යම් බලයක් ක්‍රියාත්මක කිරීම වැළැක්වීමේ, ප්‍රමාද කිරීමේ හෝ ඊට බාධා කිරීමේ අදහස ඇතිව මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ තබා ගැනීමට හෝ පවත්වාගෙන යාමට නියම කරනු ලැබ ඇති යම් පොතක් හෝ ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ ගිණුම් විනාශ කරනු ලබන, සඟවනු ලබන, විකෘති කරනු ලබන, වෙනස් කරනු ලබන, යවනු ලබන හෝ යැවීමට තැත් කරනු ලබන හෝ එහි පරිශ්‍රයෙන් ඉවත් කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට වෙනත් යම් තැනැත්තකු සමඟ කුමන්ත්‍රණ කරනු ලබන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) මෙහි (1) වන උපවගන්තියේ සඳහන් වරදක් සිදු කිරීමට අනුබල දෙන හෝ කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, එම වරදට (1) වන උපවගන්තිය යටතේ වන වරදකට දඬුවම් කරනු ලබන ආකාරයෙන් ම ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

(3) V වන කොටසේ වැරදි හැර මේ පනත යටතේ වන අනෙකුත් සියලු වැරදි මහෙස්ත්‍රාත් අධිකරණයක දී නඩු විභාග කරනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ කිසිදු දණ්ඩනයක් ප්‍රකාශිතව සලස්වා නොමැති මේ පනත යටතේ වන වරදකට වරදකරු වූ යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයකට නොඅඩු වූ ද රුපියල් මිලියන සියයකට නොවැඩි වූ ද දඩයකට හෝ වසර දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) මේ පනත යටතේ වන යම් වරදක් සංස්ථාවක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක, එම වරද ඔහුගේ දැනීමෙන් හෝ වරදට ඉඩ හැරීමෙන් තොරව සිදු කළ බව හෝ ඔහුගේ කාර්යයන්හි ස්වභාවය සහ එම සිද්ධියේ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඔහු විසින් ක්‍රියා කරනු ලැබිය යුතුව තිබූ පරිදි ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය සියලු නිසි උද්යෝගයෙන් ඔහු විසින් කටයුතු කරනු ලැබූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, එම වරද සිදුකළ අවස්ථාවේ දී එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ඒ හා සමාන වෙනත් යම් නිලධරයකු වන යම් තැනැත්තකු එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

අපරාධ නඩු කටයුතු සඳහා අදාළ වන පනත්

**176.** (1) මේ පනත යටතේ සිදු කරනු ලබන සියලු අපරාධ නඩු කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ විය යුතු අතර, V වන කොටස යටතේ වන වැරදි සම්බන්ධයෙන් හැර, කොමිෂන් සභාව වෙනුවෙන් වන නඩු කටයුතු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පවරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන අපරාධ නඩු කටයුතු සහ සිවිල් නඩු කටයුතුවල දී, ඉලෙක්ට්‍රොනික වාර්තාවල හෝ අනෙකුත් ලේඛනවල සාක්ෂි අවශ්‍යතාව සඳහා සහ ඒ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

**වැරදි සමථයකට පත් කිරීම**

**177.** මේ පනතේ V වන කොටසේ ලැයිස්තුගත කර ඇති වැරදි හැර, කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ වන වරද සිදු කරන ලද අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, එවැනි වරදකට නියම කරනු ලැබිය හැකි උපරිම දඩයෙන් භාගයක් නොඉක්මවන මුදලකට එම වරද සමථයකට පත් කරනු ලැබිය හැකි අතර, මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීමේ දී කොමිෂන් සභාව වෙත ලැබෙන සියලු මුදල් කොමිෂන් සභාවේ වන්දි අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

**පරිපාලනමය දණ්ඩන නියම කිරීමට කොමිෂන් සභාව සතු බලය**

**178.** (1) V වන කොටස යටතේ වන වැරදි සම්බන්ධයෙන් හැර, යම් තැනැත්තකු විසින් -

(අ) මේ පනතේ යම් විධිවිධානයක් කඩ කරනු ලැබුවහොත් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ නීති උල්ලංඝනය කිරීමක් සිදු කරනු ලැබුවහොත්;

(ආ) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක ලියාපදිංචියක යම් නියමයක් හෝ පරිසීමාවක් කඩ කරනු ලැබුවහොත් හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්;

(ඇ) වෙළෙඳපොළ ආයතනයක රීතිවල යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්; හෝ;

(ඈ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් ලිඛිත දැන්වීමකට, මාර්ගෝපදේශයකට, විධානයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්,

(1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කඩ කිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනය කිරීමේ ස්වභාවය සහ ආකාරය සහ එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය කිරීම මගින් වෙළෙඳපොළට ඇති වන බලපෑම සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින්, පහත දැක්වෙන පරිපාලනමය ක්‍රියාමාර්ග එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගනු ලැබිය හැකි ය :-

(i) එම කඩ කිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට එම විධිවිධාන, නියෝග, රීති, ලිඛිත දැන්වීම, කොන්දේසිය, විධානය හෝ මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීම, ඒවා අනුගමනය කිරීම, බලාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කරන ලෙස විධාන කිරීම;

(ii) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට එම කඩකිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනයේ බරපතළකම හෝ බැරෑරුම්කමට අනුපාතික වන පරිදි එහෙත් කිසිදු අවස්ථාවක දී රුපියල් මිලියන පනහක් නොඉක්මවන දඩයක් නියම කිරීම;

(iii) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට තරයේ අවවාද කිරීම;

(iv) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට, එම කඩකිරීමෙන්, අනුකූලව කටයුතු නොකිරීමෙන් හෝ උල්ලංඝනයෙන්, අගතියට පත් වෙනත් යම් තැනැත්තකුට ප්‍රතිෂ්ඨාපනයක් සිදු කිරීම ඇතුළුව එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනයට පිළියම් යෙදීම සඳහා හෝ එම කඩ කිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනයේ බලපෑම අවම කිරීම සඳහා කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි යම් පියවර ගන්නා ලෙස නියම කිරීම;

(v) ලැයිස්තුගත පොදු සමාගමක ප්‍රවර්ධකයෙක් හෝ අධ්‍යක්ෂවරයෙක් සම්බන්ධයෙන් වන විට, (i) සිට (iv) දක්වා වූ ඡේද යටතේ ගත හැකි ක්‍රියාමාර්ගවලට අමතරව, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය:-

(අ) ප්‍රවර්ධකයා හෝ අධ්‍යක්ෂවරයා හෝ ප්‍රවර්ධකයා හෝ අධ්‍යක්ෂවරයා හා සම්බන්ධ යම් තැනැත්තකු විසින්, ලැයිස්තුගත පොදු සමාගමේ සුරැකුම්පත් හෝ කොමිෂන් සභාව විසින් යෝග්‍ය යැයි සිතනු ලබන වෙනත් යම් සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම හෝ ගනුදෙනු කිරීම සඳහා විලම්බන කාලයක් නියම කිරීම හෝ තහනම් කිරීම; හෝ

(ආ) කොමිෂන් සභාවේ මතය අනුව, අධ්‍යක්ෂවරයා එම ධුරයේ රැඳී සිටීම මහජන සුබසිද්ධියට හානිකර බවට වූ ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීම.

(2) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (iv) වන ඡේදයේ කාර්ය සඳහා කඩකිරීමක්, අනුකූලව කටයුතු නොකිරීමක් හෝ උල්ලංඝනයක් කළ තැනැත්තකු විසින් ප්‍රතිෂ්ඨාපනයක් සිදු කළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීමේ දී, කොමිෂන් සභාව විසින්, -

(අ) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තා වෙත උපචිත වී ඇති ලාභ; හෝ

(ආ) එම කඩකිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනයේ ප්‍රතිඵලයක් ලෙස එක් තැනැත්තකුට හෝ ඊට වැඩි තැනැත්තන් ප්‍රමාණයකට පාඩුවක් සිදු වී හෝ අන්‍යාකාරයකින් අහිතකර ලෙස බලපෑමට ලක්වී ඇත් ද යන්න,

සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) වෙළෙඳපොළ ආයතනයක රීති යටතේ යම් තැනැත්තකුට එරෙහිව කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන අවස්ථාවක දී, එය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගය පිළිබඳව, කොමිෂන් සභාව විසින්, එම වෙළෙඳපොළ ආයතනය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, කොමිෂන් සභාව විසින්-

(අ) දඩයක් නියම කිරීම ඇතුළුව, වෙළෙඳපොළ ආයතනයේ රීති කඩකිරීම, ඊට අනුකූලව කටයුතු නොකිරීම, එම රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් එහි වෙළෙඳ සහභාගිකයන්ට, නිෂ්කාශන සාමාජිකයන්ට හෝ තැන්පතුගාර සහභාගිකයන්ට, ලැයිස්තුගත පොදු සමාගමකට සහ ලැයිස්තුගත පොදු සමාගමක

අධ්‍යක්ෂවරයකුට එරෙහිව යම් විනය ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස යම් වෙළෙඳපොළ ආයතනයකට විධාන කරනු ලැබීම; හෝ

(ආ) කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට එරෙහිව මේ පනත යටතේ ගැනීමට බලය ලබා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබීම,

වළක්වනු නොලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නියම කරන ලද දඩයක් ගෙවීමට යම් තැනැත්තකු අපොහොසත්ව ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, එම මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්ම වුව ද, එය නොතකා, එම දඩය වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස, එවැනිම ආකාරයකින් ආපසු අයකර ගනු ලැබිය හැකි අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ ආපසු අයකරගනු ලබන මුදල් ප්‍රමාණය කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

(7) වෙනත් යම් ප්‍රතිකර්මයකට අගතියක් නොමැතිව, (1) වන උපවගන්තියේ (iv) වන ඡේදය යටතේ වන පරිපාලනමය දණ්ඩනයක් අනුව, කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තා විසින් මුදල් ගෙවීමක ආකාරයෙන් ප්‍රතිෂ්ඨාපනයක් සිදු කරනු ලැබිය යුතු බවට නියම කර ඇත්තා වූ ද එම කඩකිරීම, අනුකූලව කටයුතු කිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තා විසින් එම ප්‍රතිෂ්ඨාපනය සිදු කිරීමට අපොහොසත් වන්නා වූ ද අවස්ථාවක, කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, එම මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්ම වුව ද, එය නොතකා, එම මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස, එවැනිම ආකාරයකින් ආපසු අයකර ගනු ලැබිය හැකි අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ ආපසු අයකරගනු ලබන මුදල් ප්‍රමාණය කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

(8) (2) වන උපවගන්තිය යටතේ ලබාගන්නා ලද මුදල් අගතියට පත් තැනැත්තන් නිශ්චය කර ගැනීමේ හා එම තැනැත්තන් වෙත ඒ පිළිබඳ දැනුම් දීමේ අපහසුතාව හේතුවෙන් බෙදා දී නොමැති අවස්ථාවක, එම මුදල් -

(අ) VI වන කොටස යටතේ පවත්වාගෙන යනු ලබන කොමිෂන් සභාවේ වන්දි අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය කිරීම සඳහා වන වියදම් පියවීම සඳහා කොමිෂන් සභාව විසින් රඳවා තබා ගනු ලැබිය යුතු ය.

ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය

**179.** (1) ගනුදෙනුකරුවන්ගේ මුදල් හෝ වත්කම් හසුරුවන හෝ ඒවා භාරව සිටින වෙළෙඳපොළ අතරමැදියකු විසින්, එහි ව්‍යාපාරය කරගෙන යන අතරතුරදී මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකරනු ලබන හෝ තවදුරටත් යෝග්‍ය සහ සුදුසු නොවන්නා වූ ද ආයෝජකයන්ගේ, වෙළෙඳපොළ අතරමැදියකුගේ, ගනුදෙනුකරුවන්ගේ හෝ සාමූහික ආයෝජන යෝජනාක්‍රමවල ඒකක දරන්නන්ගේ සම්බන්ධතා අනතුරට පත්වීමට ඉඩ ඇති බව හෝ අනතුරට පත්වන බව කොමිෂන් සභාවේ අදහස වන්නා වූ ද අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලින් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගනු ලැබිය හැකි ය:-

(අ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකාරයකට අනුව යම් ආයෝජකයකුගේ හෝ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල් සහ දේපළ හෝ එම මුදල් සහ දේපළ සම්බන්ධයෙන් කටයුතු නොකරන ලෙස හෝ එම ආයෝජකයන්ගේ හෝ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල් හෝ දේපළවලට අදාළ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වෙනත් යම් තැනැත්තකු වෙත පවරන ලෙස වෙළෙඳපොළ අතරමැදියාට විධාන කිරීම;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි, වෙනත් යම් තැනැත්තකුට මුදල් හෝ දේපළවලට අදාළ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් පවරන ලෙස භාරකරුවකුට විධාන කිරීම;

(ඇ) වෙළෙඳපොළ අතරමැදියා විසින් ගනුදෙනුවලට එළඹීම, තැනැත්තන්ගෙන් ව්‍යාපාර කටයුතු ඉල්ලා සිටීම තහනම් කිරීම හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට අනුව, ව්‍යාපාරයෙහි යෙදෙන ලෙස වෙළෙඳපොළ අතරමැදියාට හෝ භාරකරුට නියම කිරීම; හෝ

(ඈ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දේපළ පවත්වාගෙන යන ලෙස වෙළෙඳපොළ අතරමැදියකුට හෝ භාරකරුවකුට නියම කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර එම වෙළෙඳපොළ අතරමැදියාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදීමෙන් තොරව, කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගැනීම ප්‍රමාද වීම, ආයෝජකයන්ගේ සුබසිද්ධියට, වෙළෙඳපොළ අතරමැදියාගේ ගනුදෙනුකරුවන්ගේ සුබසිද්ධියට හෝ මහජන සුබසිද්ධියට අගතිදායක වියහැකි බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නේ නම්, (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය

ඇතැම් නියෝග ලබාගැනීම සඳහා අධිකරණයට ඉල්ලීමක් කිරීමට කොමිෂන් සභාව සතු බලය

**180.** (1) කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, යම් තැනැත්තකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් කඩකර ඇති බවට හෝ කඩකිරීමට ඉඩ ඇති බවට හෝ යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්ව ඇති බවට හෝ අපොහොසත් වීමට ඉඩ ඇති බවට වූ සාධාරණ ඉඩක් ඇති බවට අධිකරණය සෑහීමට පත්වන විට දී, අධිකරණය විසින් -

(අ) කඩකිරීම වළක්වාලමින් හෝ කඩකිරීම නතර කරන ලෙස නියම කරමින්;

(ආ) යම් තැනැත්තකු විසින් එම නියෝගයේ සඳහන් යම් සුරැකුම්පත් පන්තියක් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම හෝ වෙළෙඳාම් කිරීම වළක්වාලමින්;

(ඇ) සුරැකුම්පත් ගනුදෙනුවක් බලරහිත බව ප්‍රකාශයට පත් කරමින්;

(ඈ) එම තැනැත්තා විසින් අත්කර ගැනීමට, බැහැර කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීමට සාධාරණ ඉඩක් ඇති බවට අධිකරණය සෑහීමට පත්වන විට දී වත්කම් අත්කර ගැනීමෙන් බැහැර කිරීමෙන් හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීමෙන් යම් තැනැත්තකු වළක්වාලමින්;

(ඉ) නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත් බැහැර කරන ලෙස විධාන කරමින්;

(ඊ) නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත්වලට අදාළ ඡන්දය දීමේ හෝ වෙනත් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම වළක්වාලමින්;

(උ) යම් තැනැත්තකු විසින් නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත් ලබා ගැනීමට සැලැස්වීම හෝ එම සුරැකුම්පත් සඳහා දායක වීමට හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීමට අර්පණය කිරීම හෝ එම සුරැකුම්පත් සඳහා දායක වීමට හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීමට ආරාධනයන් නිකුත් කිරීම හෝ එම සුරැකුම්පත් විභජනය කිරීම වළක්වාලමින්;

(ඌ) වෙළෙඳපොළ අතරමැදියකුගේ දේපළ සම්බන්ධයෙන් හෝ යම් තැනැත්තකු විසින් භාරයක් ලෙස හෝ අන්‍යාකාරයකින් වෙනත් තැනැත්තකු වෙනුවෙන් දරනු ලබන දේපළ සම්බන්ධයෙන් භාර ගැනුම්කරුවකු හෝ ඇවරකරුවකු පත්කරමින්;

(එ) නියෝගයේ නිශ්චිතව සඳහන් සුරැකුම්පත් හෝ අනෙකුත් දේපළ අධිකරණය විසින් පත් කරන ලද භාරකරුවකු වෙත පවරමින්;

(ඒ) යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ එම තැනැත්තා විසින් කරනු ලැබිය යුතු යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කරන ලද හෝ අපොහොසත් වූ හෝ ප්‍රතික්ෂේප කරමින් සිටින හෝ අපොහොසත් වෙමින් සිටින හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ අපොහොසත් වීමට යෝජනා කරමින් සිටින අවස්ථාවක දී, එකී ක්‍රියාව කරන ලෙස හෝ එකී විධානයට අනුකූලව කටයුතු කරන ලෙස එකී තැනැත්තාට නියම කරමින්;

(ඔ) කඩකිරීමට දැන දැනම සම්බන්ධවී ඇති බව පෙනී යන යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු වෙත, එකී කඩකිරීමෙන් අගතියට පත් වෙනත් යම් තැනැත්තකුට ප්‍රතිෂ්ඨාපනයක් සිදු කිරීම ඇතුළුව එයට පිළියම් යෙදීම සඳහා හෝ එහි බලපෑම අවම කිරීම සඳහා අධිකරණය විසින් නියම කරනු ලබන යම් පියවර ගන්නා ලෙස නියම කරමින්;

(ඕ) මේ වගන්තිය යටතේ වන වෙනත් යම් නියෝගයකට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීමේ කාර්යය සඳහා යම් නිශ්චිත ක්‍රියාවක් කරන ලෙස හෝ කිරීමෙන් වළකින ලෙස යම් තැනැත්තකුට විධාන කරමින්;

(ක) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානයකට අනුකූලව කටයුතු කරන ලෙස යම් තැනැත්තකුට විධාන කරමින්;

(ග) මේ පනතේ යම් විධිවිධානයක් කඩකර ඇති යම් තැනැත්තකුට සංචාරක බාධකයක් පනවමින්; හෝ

(ච) මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් යටතේ නියෝගයක් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සුදුසු බවට සලකන යම් අනුයාත කරුණක් සම්බන්ධයෙන්,

නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගයක් සඳහා අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ විට, අධිකරණය විසින්, එම ඉල්ලීම පිළිබඳ අවසන් තීරණය ලබා දෙන තෙක්, ඒකපාර්ශ්වීය අතුරු නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් කිරීමට පෙර, අධිකරණය විසින්, සුදුසු යැයි සිතනු ලබන යම් තැනැත්තන්ට එම ඉල්ලීම පිළිබඳ දැන්වීමක් ලබා දෙන ලෙස විධාන කිරීම හෝ අධිකරණය විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකාරයකට අනුව එම ඉල්ලීම පිළිබඳ දැන්වීම පළ කරන ලෙස විධාන කිරීම හෝ ඒ දෙකම සිදු කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගයක් සඳහා කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් නිසි ලෙස බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට දී, එම නියෝගය ලබා දීමේ කොන්දේසියක් වශයෙන්, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් හානි වන්දි පිළිබඳ යම් ප්‍රතිඥාවක් ලබාදෙන ලෙස, අධිකරණය විසින්, නියම කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වන අධිකරණ නියෝගයක් මගින් වෙළෙඳපොළ අතරමැදියකුගේ දේපළවල භාර ගැනුම්කරුවකු ලෙස පත්කරන ලද තැනැත්තකු -

(අ) විසින් තමා භාර ගැනුම්කරු ලෙස පත් කරන ලද යම් දේපළක් තමා වෙත ලබා දෙන ලෙස හෝ සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි එම දේපළ සම්බන්ධයෙන් වන සියලු තොරතුරු තමා වෙත ලබා දෙන ලෙස වෙළෙඳපොළ අතරමැදියාට නියම කරනු ලැබිය හැකි ය;

(ආ) විසින්, තමා භාර ගැනුම්කරු ලෙස පත් කරන ලද යම් දේපළක් අත්කර ගැනීම සහ එය තම සන්තකයට ගැනීම කරනු ලැබිය හැකි ය;

(ඇ) විසින්, තමා අත්කරගන්නා ලද හෝ තම සන්තකයට ගන්නා ලද යම් දේපළක් සම්බන්ධයෙන්, එම දේපළ දරන්නා විසින් නීත්‍යානුකූල ලෙස එම දේපළ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබනු ඇති යම් ආකාරයකින් කටයුතු කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) සතුව, අධිකරණය විසින් එම නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම දේපළ සම්බන්ධයෙන් වෙනත් බලතල තිබෙන්නේ ය.

(6) මේ වගන්තියේ, වෙළෙඳපොළ අතරමැදියකු සම්බන්ධයෙන් වන විට ''දේපළ'' යන්නට වෙළෙඳපොළ අතරමැදියා විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් වෙළෙඳපොළ අතරමැදියාගේ ව්‍යාපාරය අතරතුර හෝ ඒ හා සම්බන්ධව වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් භාර ගත් හෝ ලබාගත් මුදල්, සුරැකුම්පත් හෝ වෙනත් දේපළ සහ සුරැකුම්පත්වල හිමිකම් ලේඛන හෝ වෙනත් දේපළ ඇතුළත් වේ.

(7) මේ වගන්තිය යටතේ අධිකරණයේ නියෝගයකින් පත්කරනු ලබන භාරකරුවකු -

(අ) විසින්, නියෝගයේ නිශ්චිතව සඳහන් යම් සුරැකුම්පතක් හෝ වෙනත් යම් දේපළක් භාරකරුට භාර දෙන ලෙස හෝ සාධාරණ ලෙස අවශ්‍ය වියහැකි සුරැකුම්පත් සම්බන්ධ සියලු තොරතුරු භාරකරුට ලබා දෙන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය;

(ආ) විසින්, සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ අත්කරගැනීම සහ එය තම සන්තකයට ගැනීම කරනු ලැබිය හැකි ය;

(ඇ) විසින්, ඔහු විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකාරයකට සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) වෙත, අධිකරණය විසින් නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ සම්බන්ධයෙන් වන වෙනත් යම් බලතල තිබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් අධිකරණයට ගෙවනු ලැබිය යුතු අතර, එකී මුළු මුදලට ම හෝ ඉන් යම් කොටසකට අර්ථලාභීව හිමිකම් ලබන බවට කියා සිටින යම් තැනැත්තකු විසින්, එකී ගෙවීම අධිකරණයට සිදු කළ දින සිට දින තිහක් ඇතුළත එම ගනුදෙනුවෙන් හෝ බැහැර කිරීමෙන් ලබා ගත් මුදලින් ඔහුට අය විය යුතු මුදල් ගෙවන ලෙස අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(9) එම නියෝගයෙන් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට දී, එකී අතෘප්තියට පත් පාර්ශ්වය විසින් කරන ලද ඉල්ලීම පිළිබඳව කොමිෂන් සභාව වෙත පූර්ව දැන්වීමක් සිදු කර, අධිකරණය විසින්, මේ වගන්තිය යටතේ කරන ලද නියෝගයක් පරිච්ඡින්න කිරීම, වෙනස් කිරීම හෝ නිදහස් කිරීම හෝ එකී නියෝගය ක්‍රියාත්මක වීම අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

තොරතුරු පළකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය

**181.** මහජන සුභසිද්ධිය උදෙසා හෝ ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සිතනු ලබන විට දී, කොමිෂන් සභාව විසින්, මේ පනත, නියෝග, රීති හෝ විධාන යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් තීරණයක් හෝ කරන ලද යම් ක්‍රියාවක් හා සම්බන්ධ යම් තොරතුරු කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකෘතියකට හෝ ආකාරයකට අනුව පළ කරනු ලැබිය හැකි ය.

නියෝග

**182.** (1) කොමිෂන් සභාවේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින්, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යැයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ අන්තර්ගත විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්,-

(අ) වෙළෙඳපොළ ආයතනයකට බලපත්‍ර ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා සපුරාලිය යුතු ගාස්තු නියම සහ කොන්දේසි;

(ආ) ශ්‍රී ලංකාව තුළ විදේශීය ආස්ථිත්‍යයක් ලැයිස්තුගත කිරීම හෝ තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව සහ එහි විදේශීය සම ආයතනය හෝ වෙනත් යම් සංවිධානයක් අතර ඇති යම් අවබෝධතා ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම;

(ඇ) සුරැකුම්පත් ලෙස වර්ගීකරණය නොකළ නිෂ්පාදනයක් හෝ නිෂ්පාදන පංතියක්; සහ

(ඇ) මේ පනතින් නියම කර ඇති යම් කරුණක්,

සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එකී පළකරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසුව හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

රීති

**183.** (1) කොමිෂන් සභාව විසින්, පහත දැක්වෙන කාරණා ඇතුළුව එහෙත් එම කාරණාවලට සීමා නොවී මේ පනත යටතේ රීති සෑදීමට බලය දී ඇති හෝ මේ පනත යටතේ රීති සෑදිය යුතු යැයි සඳහන් කර ඇති හෝ නියම කර ඇති යම් කාරණාවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යː-

(අ) විනිමය ස්ථානයක සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම සහ ලැයිස්තුගත පොදු සමාගමක් විසින් අයිතිවාසිකම් හෝ ප්‍රසාද වශයෙන් හෝ අන්‍යාකාරයකින් යම් අතිරේක සුරැකුම්පත් පසුව නිකුත් කිරීම හෝ එම සමාගම් උපලේඛනගත කිරීම;

(ආ) විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම සහ ඉන් පැනනගින ඒ හා සම්බන්ධ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ලැයිස්තුගත විදේශීය ආස්ථිත්වයක් නියාමනය කිරීම;

(ඇ) සුරැකුම්පත් අත්කරගන්නා ලද හෝ බැහැර කරන ලද තැනැත්තන් විසින් සිදු කරන සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව වෙළෙඳපොළ අතරමැදියන් විසින් සිදු කරනු ලබන හෙළිදරව් කිරීම් සහ සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව විනිමය ස්ථානයක් විසින් සිදු කරනු ලබන හෙළිදරව් කිරීම;

(ඇ) වෙළෙඳපොළ ආයතනයක් සහ වෙළෙඳපොළ අතරමැදියකු විසින් පොත්, වාර්තා, ගිණුම් සහ විගණන නිසි පරිදි පවත්වාගෙන යාම සහ එකී වෙළෙඳපොළ ආයතනය සහ වෙළෙඳපොළ අතරමැදියා විසින් තම කටයුතු පිළිබඳව කොමිෂන් සභාව වෙත නිරතුරුව ම වාර්තා කිරීම;

(ඉ) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචියක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය;

(ඊ) වෙළෙඳපොළ ආයතනයක් සහ වෙළෙඳපොළ අතරමැදියකු විසින් පොත්, වාර්තා, ගිණුම් වාර්ෂිකව විගණනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම;

(උ) යම් අත්කර ගැනීමක හෝ ඒකාබද්ධ කිරීමක ඉලක්කය ලැයිස්තුගත පොදු සමාගමක් වන විට දී, එම අත්කර ගැනීම් හෝ ඒකාබද්ධ කිරීම් නියාමනය කිරීම;

(ඌ) සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක භාරකරු සහ සුරැකුම්පත් නිකුත්කරන්නකු සහ කළමනාකරණ සමාගමක් විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම සංග්‍රහයක් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ අනුමත කිරීම පිළිබඳ සංග්‍රහයක්;

(එ) මේ පනතින් රීති සෑදිය යුතු යැයි නියම කර ඇති යම් කාරණා;

(ඒ) වෙළෙඳපොළ ආයතනයක් සහ වෙළෙඳපොළ අතරමැදියකු විසින් අනුගමනය කරනු ලැබිය යුතු විචක්ෂණශීලී නියමයන්, යෝග්‍ය සහ සුදුසු උපමාන, වාර්තා තබාගැනීම සහ අනෙකුත් ප්‍රලේඛන ක්‍රම;

(ඔ) ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලැයිස්තුගත කිරීමක් සඳහා ඉල්ලුම්කර ඇති පොදු සමාගමක් හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක් විසින් නිකුත් කිරීමට යෝජිත සංස්ථා ප්‍රකාශයේ ආකෘතිය සහ අන්තර්ගතයන්;

(ඕ) කොටස් තැරැව්කරුවකු හෝ ආන්තික සපයන්නකු විසින් ආන්තික ගිණුමක සුරැකුම්පත් මෙහෙයවීම;

(ක) ලැයිස්තුගත සුරැකුම්පත් සහ විනිමය ස්ථානයක් හරහා වෙළෙඳාම් කරන ව්‍යුත්පන්නවලට අදාළ වෙළෙඳපොළ ආයතනයක සහ වෙළෙඳපොළ අතරමැදියන්ගේ ව්‍යාපාර කටයුතු සහ කාර්ය;

(ග) මේ පනතේ විෂයපථය තුළට ගැනෙන ලැයිස්තුගත පොදු සමාගම්, ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යය, සහ අනෙකුත් ලැයිස්තුගත නොකළ සමාගම් විසින් තොරතුරු හෙළිදරව් කිරීම, වාර්තා කිරීම සහ සැපයීම;

(ච) විනිමය ස්ථානයකට ලැයිස්තුගත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම සහ විනිමය ස්ථානයක් විසින් ලැයිස්තුගත කිරීම අත්හිටුවීම සහ අවලංගු කිරීම;

(ජ) බලපත්‍රලත් ව්‍යුත්පන්න විනිමය ස්ථානයක පහසුකම් භාවිත කර සිදු කරන ව්‍යුත්පන්න ගිවිසුම්වල වෙළෙඳාම් සම්බන්ධයෙන්;

(ට) වෙළෙඳපොළ සාදන්නන්ගේ, කොටස් ණයට දෙන්නන්ගේ සහ කොටස් ණයට ගන්නන්ගේ ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ හිඟ වෙළෙඳාම නියාමනය කිරීම පිළිබඳව;

(ඩ) විනිමය ස්ථානයක් සඳහා සත්‍යානුරූපී අරමුදලක් හෝ වන්දි අරමුදලක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම; සහ

(ණ) ගනුදෙනුකරු සහ වෙළෙඳපොළ අතරමැදියා අතර සහ අදාළ සහභාගිකයන් හෝ සාමාජිකයන් සහ වෙළෙඳපොළ ආයතන අතර ආරවුල් නිරවුල් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එකී පළකරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**ව්‍යුත්පන්න, සූදු හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුම් නොවන බව**

**184.** වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වූව ද, විනිමය ස්ථානයක් හරහා වෙළෙඳාම් කරන ව්‍යුත්පන්න ගිවිසුමක් සූදූ හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

**වෙළෙඳපොළ සාදන්නා**

**185.** මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ බලපත්‍රලත් ක්‍රියාකාරකමට අදාළ කර්තව්‍ය කර ගෙන යාමේ දී වෙළෙඳපොළ අතරමැදියකු ලෙස බලපත්‍රලත් වෙළෙඳපොළ සාදන්නකු විසින් මේ පනතේ 128 වන හෝ 129 වන වගන්ති යටතේ වරදක් සිදු කරනු ලබන ලෙස සලකනු නොලැබිය යුතු ය.

**ඉවත් කිරීම්, ඉතිරි කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන**

**186.** (1) (මෙහි මින් මතු "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කරනු ලැබුව ද -

(අ) (i) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවා ඇත්තා වූ ද මේ පනතේ 1 වන කොටස ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාත්මක වන්නා වූ ද කොමිෂන් සභාව මේ පනතේ 2 වන කොටස යටතේ අලුත් කොමිෂන් සභාවක් පිහිටුවනු ලබන තෙක්, මේ පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව ලෙස සලකනු ලැබිය යුතු අතර එය ඒ අනුව දිගටම ක්‍රියාත්මක විය යුතු ය; සහ

(ii) 1 වන කොටස ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන පත් කළ සාමාජිකයන් මේ පනත යටතේ පත් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔවුන්ගේ ධුර කාලය අවසන් වන තෙක් හෝ මේ පනත යටතේ අලුත් සාමාජිකයන් පත් කරනු ලබන තෙක් එම සාමාජිකයන් දිගටම ධුර දරනු ලැබිය යුතු ය;

(ආ) යම් විනිමය ස්ථානයකට, කොටස් තැරැව්කරුවකුට හෝ කොටස් වෙළෙන්දකුට හෝ ඒකක භාරයක් මෙහෙයවීමේ කාර්ය සඳහා කළමනාකාර සමාගමකට ඉවත් කරන ලද පනත යටතේ නිකුත් කරනු ලැබ ඇත්තා වූ ද, මේ පනතේ II වන සහ III වන කොටස් ක්‍රියාත්මක වන දිනයන්ට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද සෑම බලපත්‍රයක් ම, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ යම් නිෂ්කාශනාගාරයකට හෝ යම් වෙළෙඳපොළ අතරමැදියකුට නිකුත් කරනු ලැබ ඇත්තා වූ ද මේ පනතේ II වන සහ III වන කොටස් ක්‍රියාත්මක වන දිනයන්ට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද සෑම ලියාපදිංචි සහතිකයක් ම මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද, මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන්නා වූ ද, ඉවත් කරන ලද පනත යටතේ සාදනු ලැබූ සියලු නියෝග, රීති සහ විධාන, ප්‍රදානය කරන ලද අනුමතයන් සහ ගන්නා ලද වෙනත් යම් ක්‍රියා මාර්ගයක් හෝ නිකුත් කරන ලද දැන්වීම් මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියෝග, රීති සහ විධාන, ප්‍රදානය කරන ලද අනුමතයන් සහ ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ගයක් හෝ නිකුත් කරන ලද දැන්වීම් ලෙස සලකනු ලැබිය යුතු අතර, දිගටම වලංගු විය යුතු ය;

(ඉ) ඉවත් කරන ලද පනත යටතේ එළඹුනා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පවතින්නා වූ ද සියලු කොන්ත්‍රාත්තු, ගිවිසුම් සහ අනෙකුත් සාධන පත්‍ර මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් එළඹෙන ලද කොන්ත්‍රාත්තු, ගිවිසුම් හෝ අනෙකුත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) ඉවත් කරන ලද පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු

ලැබ ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින්නා වූ ද සියලු නඩු කටයුතු, නඩුකර සහ අනෙකුත් නඩු කටයුතු කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට එරෙහිව පවරන ලද සියලු නඩු කටයුතු, නඩුකර සහ අනෙකුත් නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු ය;

(උ) ඉවත් කරන ලද පනත යටතේ සාදනු ලැබ ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක ව පවතින්නා වූ ද, මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන්නා වූ ද වෙළෙඳපොළ ආයතනයක සියලු රීති මේ පනත යටතේ එකී වෙළෙඳපොළ ආයතන විසින් අලුත් රීති සාදනු ලබන තෙක්, මේ පනත යටතේ එකී වෙළෙඳපොළ ආයතන විසින් සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඌ) ඉවත් කරන ලද පනත යටතේ ඉදිරිපත් කරන ලද බලපත්‍ර සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය;

(එ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතුව ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවතියා වූ ද සියලු චංචල සහ නිශ්චල දේපළ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, කොමිෂන් සභාව සතු විය යුතු ය;

(ඒ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුදල්වලට බැරව ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ ද සියලු මුදල්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනතේ VI වන කොටස යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන් සභාවේ අරමුදල්වලට බැර විය යුතු ය;

(ඔ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව, ඉවත් කරන ලද පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ සිදු කරනු ලැබූ සියලු වැරදි හෝ පවරනු ලැබූ සියලු නඩු කටයුතු ඉවත් කරන ලද පනත යටතේ සිදු කරන ලද වැරදි හෝ පවරන ලද නඩු කටයුතු විය යුතු අතර, ඒ අනුව ඒවා නඩු විභාග කරනු ලැබිය යුතු ය;

(ඕ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතු සියලු අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි කොමිෂන් සභාවේ අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ක) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ධුර දරන ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්, සියලු නිලධරයන් සහ සේවකයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, ඉවත් කරන ලද පනත යටතේ ඔවුන් හිමිකම් ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා වාසිදායක බවින් අඩු නොවන නියම මත, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා, නිලධරයන් සහ සේවකයන් ලෙස පත්වන බවට සලකනු ලැබිය යුතු ය.

(3) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කරනු ලැබූව ද -

(අ) වෙනත් යම් ලිඛිත නීතියක 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට කරන ලද සෑම සඳහනක් ම මේ පනතට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය; සහ

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක 1989 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට කරන ලද සෑම සඳහනක් ම මේ පනතේ අන්තර්ගත අනුරූපී විධිවිධානවලට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

**187.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ - අර්ථ නිරූපණය

"ප්‍රතීත ආයෝජකයා" යන්නට, -

(අ) (i) ප්‍රාථමික නේවාසික දේපළ හැර ස්වකීය ශුද්ධ පුද්ගලික වත්කම් ප්‍රමාණයේ වටිනාකම රුපියල් මිලියන දෙසියයක් හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ඊට වැඩි යම් වටිනාකමක් ඉක්මවනු ලබන; හෝ

(ii) ඉහතින් වූ වර්ෂ තුන තුළ දී ස්වකීය සාමාන්‍ය වාර්ෂික ආදායම රුපියල් මිලියන තිහකට හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ඊට වැඩි යම් අගයකට නොඅඩු; සහ

(iii) ආයෝජන අවදානම බාර ගැනීමට ඇති ස්වකීය පළපුරුද්ද, හැකියාව සහ විදග්ධතාවය පිළිබඳව ප්‍රකාශයක් කරනු ලබන,

යම් තැනැත්තකු;

(ආ) (i) එකී ආස්ථිත්‍යයේ වඩාත්ම මෑතකාලීන විගණනය කරන ලද ශේෂ පත්‍රය මගින්**;** හෝ

(ii) විගණනය කරන ලද ශේෂ පත්‍රයක් නොමැති අවස්ථාවක දී, ඉහතින් වූ මාස දොළහක කාලසීමාවක් ඇතුළත වූ යම් දිනයක් වන්නා වූ යම් ශේෂ පත්‍ර දිනයක දී එකී ආස්ථිත්‍යයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබාදෙන බවට එකී ආස්ථිත්‍යය විසින් සහතික කරන ලද එකී සංස්ථාමය ආස්ථිත්‍යයේ වඩාත්ම මෑතකාලීන ශේෂ පත්‍රය මගින්,

තීරණය කරනු ලබන පරිදි, වටිනාකම රුපියල් මිලියන එක් දහසක් ඉක්මවන ශුද්ධ වත්කම් සහිත සංස්ථාමය ආස්ථිත්‍යයක්;

(ඇ) එම තත්ත්වයෙන් ක්‍රියා කිරීමේ දී, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් භාරයක භාරකරු**;** හෝ

(ඇ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් ආස්ථිත්‍යයක් හෝ රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ආයතනයක් හෝ ආස්ථිත්‍යයක්;

ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"මධ්‍යම තැන්පතුගාරය" යන්නෙන්,-

(අ) එකී සුරැකුම්පත් ගනුදෙනු කිරීමේ කාර්යය සඳහා තැන්පතුකරුගේ හෝ ගිණුම් හිමියාගේ හෝ ඔහුගේ හෝ එහි නාමිකයකුගේ නමින් සියලු සුරැකුම්පත් තැන්පත් කර භාරයේ දරනු ලබන හෝ ලියාපදිංචි කරන ලද සහ එම සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු, කොටස්පත්‍ර භෞතිකව භාර නොදී සුරැකුම්පත් ගිණුම්වල සටහන් තැබීම මගින් සිදුකරනු ලබන්නා වූ;

(ආ) කොටස්පත්‍ර භෞතිකව භාර නොදි, සුරැකුම්පත් ගනුදෙනු හෝ සුරැකුම්පත් ගනුදෙනු කිරීම් නිරවුල් කිරීම සඳහා ඉඩ දෙනු ලබන්නා වූ හෝ පහසුකම් සලස්වනු ලබන්නා වූ; සහ

(ඇ) ඊට ආනුෂංගික වන්නා වූ වෙනත් පහසුකම් සහ සේවා සැපයීම සඳහා වූ,

යම් විනිමය ස්ථානයක් සුරැකුම්පත් මධ්‍යම ලෙස හැසිරවීම සඳහා වූ ක්‍රමයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් සංස්ථාවක් අදහස් වන නමුත් ඊට -

(i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ පිහිටුවනු ලබන මධ්‍යම තැන්පතුගාරයක්;

(ii) ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන හෝ පිහිටුවන මධ්‍යම තැන්පතුගාරයක්; හෝ

(iii) නිදහස් කරන ලද සුරැකුම්පත් සඳහා මධ්‍යම තැන්පතුගාරයක් සපයනු ලබන හෝ සපයනු ලබන ලෙස පෙනී සිටින යම් තැනැත්තකු,

ඇතුළත් නොවේ.

"නිෂ්කාශන පහසුකම" යන්නෙන්, සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීම සඳහා හෝ නිරවුල් කිරීම සඳහා වූ යම් පහසුකමක් අදහස් වේ;

"නිෂ්කාශනය කිරීම හෝ නිරවුල් කිරීම" යන්නට, යම් නිෂ්කාශන පහසුකමක් සම්බන්ධයෙන් වන විට, ගනුදෙනු සපයනු ලබන යම් යාන්ත්‍රණයක් හෝ සේවාවක්,-

(අ) එම ගනුදෙනු තහවුරු කිරීමේ අදහස ඇතිව එකී තැනැත්තා විසින් එම සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ නියම සත්‍යායනය කරනු ලබන්නා වූ;

(ආ) නවීකරණය මගින් හෝ අන්‍යාකාරයකින්, එම සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ පාර්ශ්ව විසින් එම තැනැත්තාගේ බැරකම් එම පාර්ශ්වයන්ගේ බැරකම් වෙනුවට ආදේශ කරනු ලබන්නා වූ;

(ඇ) එම ගණනය කිරීම්වලට බහුපාර්ශ්වික ලාභ ලබාගැනීමේ වැඩපිළිවෙළවල් අන්තර්ගත වුව ද, නොවුව ද, එම සුරැකුම්පත් ගනුදෙනු යටතේ වන පාර්ශ්වවල බැඳීම් ගණනය කරනු ලබන්නා වූ; හෝ

(ඈ) එම පාර්ශ්ව අතර සුරැකුම්පත් භාරදීම හෝ අරමුදල් පැවරීම හෝ සුරැකුම්පත් සඳහා වන හිමිකම් පැවරීම සඳහා වූ බැඳීම් ඇතුළු එම ගනුදෙනු යටතේ වන ස්වකීය වගකීම් එම සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ පාර්ශ්ව විසින් සපුරාලන ලබන්නා වූ -

සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් සපයනු ලබන යම් වැඩපිළිවෙළක්, ක්‍රියාවලියක්, යාන්ත්‍රණයක් හෝ සේවාවක් ඇතුළත් වන නමුත් ඊට -

(i) ඉහත සඳහන් සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ යම් පාර්ශ්වයක පසුපෙළ මෙහෙයුම් කටයුතු;

(ii) එම සේවාවන් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු නිරවුල් කිරීම සඳහා හුදෙක්ම ආනුෂංගික වන අවස්ථාවක දී, (මෙහි මින් මතු "ගනුදෙනුකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකු සමඟ වන වැඩපිළිවෙළක් යටතේ එම ගනුදෙනුකරුගේ සුරැකුම්පත්වල සන්තකය හෝ පාලනය දරනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින් සපයනු ලබන සේවාවන්; හෝ

(iii) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් සේවාවන්,

ඇතුළත් නොවේ.

"නිෂ්කාශන සාමාජිකයා" යන්නෙන්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීති යටතේ තමා වෙනුවෙන් හෝ අනෙක් අය වෙනුවෙන් සුරැකුම්පත් නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන සාමාජිකයකු ලෙස ඇතුළත් කර ගෙන ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"සාමූහික ආයෝජන යෝජනා ක්‍රමය" යන්නට -

(අ) කවර නමකින් හෝ හඳුන්වනු ලබන, ආයෝජකයන් විසින් සිදු කරනු ලබන දායකත්වයක් හෝ ගෙවීම් හුදෙක්ම එකී යෝජනා ක්‍රමයේ හෝ වැඩපිළිවෙලේ කාර්ය සඳහා පමණක් රැස්කරනු ලබන සහ උපයෝගී කරගනු ලබන;

(ආ) එම යෝජනා ක්‍රමයෙන් හෝ වැඩපිළිවෙලින් ලාභ, ආදායම්, නිෂ්පාදන හෝ චංචල හෝ නිශ්චල දේපළ ලබා ගැනීමේ අදහස ඇතිව ආයෝජකයන් විසින් එම යෝජනා ක්‍රමයට හෝ වැඩපිළිවෙළට දායකත්වයන් හෝ ගෙවීම් සිදු කරනු ලබන;

(ඇ) ආයෝජකයන් විසින්, යම් යෝජනා ක්‍රමයක ආයෝජනාවලිය මත වූ ස්වකීය සහභාගීත්ව සම්බන්ධතාවයට ප්‍රමාණානුකූලව හෝ ඔවුන් විසින් තීරණය කරනු ලබන වෙනත් පදනමක් මත ආයෝජනයේ අවදානම සහ ප්‍රතිලාභය බෙදා ගනු ලබන;

(ඈ) හඳුනාගත හැකි වූ හෝ නොහැකි වූ, එම යෝජනා ක්‍රමයේ හෝ වැඩපිළිවෙලේ කොටසක් වන්නා වූ යම් දේපළක්, දායකත්වයක් හෝ ආයෝජනයක් ආයෝජකයන් වෙනුවෙන් කළමනාකරණය කරනු ලබන; සහ

(ඉ) එම යෝජනා ක්‍රමයේ හෝ වැඩපිළිවෙලේ කළමනාකරණය සහ මෙහෙයවීම සම්බන්ධයෙන් ආයෝජකයන්ට එදිනෙදා පාලනයක් නොමැති,

සමාගමක් විසින් මහජනයාට යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩපිළිවෙලක් නිකුත් කරන්නේ හෝ අර්පණය කරන්නේ යම් කොන්දේසි යටතේ ද එම කොන්දේසි සපුරාලනු ලබන යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩපිළිවෙලක් ඇතුළත් වන නමුත් ඊට-

(i) තනිපුද්ගල ආයෝජන කළමනාකරණ වැඩපිළිවෙළවල්වලට;

(ii) ව්‍යවසායකත්ව ආරම්භක යෝජනා ක්‍රමවලට;

(iii) ශුද්ධ තැන්පතු පාදක වූ යෝජනා ක්‍රමවලට;

(iv) ව්‍යාපාර ආකාරයෙන් ක්‍රියාත්මක නොවන යෝජනා ක්‍රමවලට;

(v) ණයපත්‍ර, බැඳුම්කර සහ ණය කොටස් වැනි ණය නිකුත් කිරීම්වලට;

(vi) සේවා නියුක්තයන්ගේ කොටස් යෝජනා ක්‍රමවලට;

(vii) පූර්ණ සාමාජිකත්ව වැඩපිළිවෙළවල්වලට;

(viii) කාල කොටස් යෝජනා ක්‍රමවලට;

(ix) නිෂ්කාශන සේවා සැපයීම්වලට;

(x) රක්ෂණ ගිවිසුම්වලට;

(xi) තනි පුද්ගල විශ්‍රාම වැටුප් ගිණුම්වලට;

(xii) වෘත්තීය සහ පුද්ගල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවලට;

(xiii) ගොඩනැගීම් සමිති, සමූපකාර සමිති, කාර්මික සහ අර්ථසාධක සමිති සහ ලියාපදිංචි මිත්‍රත්ව සමිති ඇතුළු ඇතැම් සංස්ථාවලට; හෝ

(xiv) ඉහත කී යෝජනා ක්‍රම හා සමාන වූ යම් වැඩපිළිවෙළකට,

අදාළ වන අරමුදල් සංචිත ඇතුළත් නොවේ.

"පාලකවරයා" යන්නෙන් -

(අ) එම දරන්නාගේ ඡන්දහිමි කොටස්වලට අදාළ ඡන්ද ප්‍රමාණයෙන් සියයට විස්සකට නොඅඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සඳහා හිමිකම් ඇත්තා වූ; හෝ

(ආ) දරන්නාගේ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් පත් කිරීම සඳහා හෝ පත් කිරීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ; හෝ

(ඇ) වෙළෙඳපොළ ආයතනයේ, සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ සහ වෙළෙඳපොළ අතරමැදියාගේ ව්‍යාපාරය හෝ පරිපාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා හෝ තීරණ ගැනීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ ද එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ ද,

යම් තැනැත්තකු අදහස් වේ.

''අධිකරණය'' යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පළාතක් සඳහා පිහිටුවනු ලැබුවා වූ ද, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින් එම මහාධිකරණය පිහිටුවනු ලැබුවේ යම් පළාතක් සඳහා ද එම පළාත ඇතුළත සිවිල් අධිකරණ බලය ඇත්තා වූ ද යම් මහාධිකරණයක් හෝ යම් පළාතක් සඳහා එවැනි සිවිල් අධිකරණ බලයක් පැවරුණු මහාධිකරණයක් පිහිටුවනු ලැබ නොමැති විටක බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ලැබූ මහාධිකරණය අදහස් වේ;

"අපලේඛනගත කිරීම" යන්නෙන්, විනිමය ස්ථානයක නිල ලැයිස්තුවෙන් ලැයිස්තුගත සුරැකුම්පත් ඉවත් කිරීම අදහස් වේ;

"තැන්පතුගාර සහභාගිකයා" යන්නෙන්, මධ්‍යම තැන්පතුගාරයක පහසුකම් සඳහා ප්‍රවේශ විය හැකි සහ මධ්‍යම තැන්පතුගාරයක රීති යටතේ තැන්පතුගාර සහභාගිකයකු ලෙස ඇතුළත් කරගෙන ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"ව්‍යුත්පන්න" යන්නට, ගැළපීම් ගිවිසුමක්, අනාගතයන්, මනාප සහ යෝග්‍ය විනිමය ස්ථාන වෙළෙඳ විකල්පයක් හෝ කොමිෂන් සභාව විසින් ව්‍යුත්පන්න ලෙස නිශ්චිතව දක්වනු ලබන යම් ගිවිසුම් පන්තියක වෙනත් යම් ගිවිසුමක් සංයුක්ත වන අනාගතයන් පිළිබඳ ගිවිසුම් ඇතුළත් වන නමුත් යම් ව්‍යුත්පන්න විනිමය ස්ථානයක අනාගතයන් වෙළෙඳපොළේ වෙළෙඳාම් කරනු නොලබන ව්‍යුත්පන්න ගිවිසුමක් ලෙස නිශ්චිතව දක්වනු ලබන යම් ගිවිසුමක් ඉන් බැහැර කරනු ලැබිය යුතු ය;

"ව්‍යුත්පන්න විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ ව්‍යුත්පන්න විනිමය ස්ථානයක් ලෙස බලපත්‍රලත් යම් සංස්ථාවක් අදහස් වේ;

"ඉලෙක්ට්‍රොනික වාර්තාව" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් නිර්මාණය කරන ලද, ගබඩා කරන ලද, උත්පාදනය කරන ලද, ලැබුණු හෝ සන්නිවේදනය කරනු ලබන ලිඛිත ලේඛනයක් හෝ වෙනත් යම් වාර්තාවක් අදහස් වේ;

"විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද කොටස් විනිමය ස්ථානයක් හෝ ව්‍යුත්පන්න විනිමය ස්ථානයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" යන්නෙන්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදහස් වේ;

"නිකුත්කරන්නා" යන්නෙන්, මහජන අර්පණයක් මගින් විකිණීම සඳහා සුරැකුම්පත් නිකුත් කරනු ලබන හෝ නිකුත් කිරීමට යෝජනා කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"බලපත්‍රලත් නිෂ්කාශනාගාරය" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද්දා වූ ද එහි කටයුතුවලට හෝ පරමාර්ථවලට නිෂ්කාශන පහසුකම් සැපයීම ඇතුළත් වන්නා වූ ද යම් සංස්ථාවක් අදහස් වේ;

"ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර නොමැත්තා වූ ද, ද්විතියික ලැයිස්තුගත කිරීමක් මගින්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක නිල ලැයිස්තුවකට ඇතුළත් කර ගනු ලැබ ඇත්තා වූ ද යම් ආස්ථිත්‍යයක් අදහස් වේ;

"ලැයිස්තුගත පොදු සමාගම" යන්නෙන්, එහි සුරැකුම්පත් යම් කොටස් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇත්තා වූ යම් සමාගමක් අදහස් වන අතර, ඊට මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද ස්ථානයක එහි සුරැකුම්පත් ලැයිස්තුගත කර ඇත්තා වූ රාජ්‍ය සංස්ථාවක් ද ඇතුළත් වේ;

"ලැයිස්තුගත සුරැකුම්පත්" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් විනිමය ස්ථානයක ලැයිස්තුගතකර ඇත්තා වූ සුරැකුම්පත් අදහස් වේ;

"කළමනාකරු" යන්නෙන්, සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට එහි ව්‍යාපාරයෙන් යම් කොටසක් කළමනාකරණය කිරීම

සඳහා එකී සංස්ථාව විසින් පත්කර ඇති තැනැත්තකු අදහස් වන අතර, ඊට යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයාගේ ආසන්නතම අධිකාරි බලය යටතේ කළමනාකරණ කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන හෝ එකී සංස්ථාවේ ගිණුම් හෝ අනෙකුත් වාර්තා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් වගකිවයුතු (ප්‍රධාන විධායක නිලධරයා නොවන) සංස්ථාවේ යම් සේවානියුක්තයකු ඇතුළත් වේ;

"ආන්තික ගිණුම" යන්නෙන්, ආයෝජකයකුට ලැයිස්තුගත සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට ඉඩ සලසන, ලැයිස්තුගත සුරැකුම්පත් ණයට මිල දී ගැනීම සඳහා යම් පාර්ශ්වික ගිණුමක් ලෙස සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගැනෙන තැරැව්කාර ගිණුමක් අදහස් වේ;

"වෙළෙඳපොළ ආයතනය" යන්නෙන්, මේ පනතේ II වන කොටස යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් විනිමය ස්ථානයක්, නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් අදහස් වේ;

"වෙළෙඳපොළ අතරමැදියා" යන්නට, ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක්, සංස්ථාමය මූල්‍ය උපදේශකවරයකු, ව්‍යුත්පන්න තැරැව්කරුවකු, ව්‍යුත්පන්න වෙළෙන්දකු, මූල්‍ය සැලසුම්කරුවකු, ආයෝජන විශ්ලේෂකයකු, ආයෝජන කළමනාකරුවකු, කළමනාකාර සමාගමක්, ආන්තික සපයන්නකු, වෙළෙඳපොළ සාදන්නකු, ස්ථානගත කිරීමේ අනුයෝජිතයකු, කොටස් තැරැව්කරුවකු, කොටස් වෙළෙන්දකු, ප්‍රතිරක්ෂිතයකු ලෙස බලපත්‍රලත් යම් තැනැත්තකු හෝ ඒ හා සමාන ක්‍රියාකාරකම් භාරගෙන ඉටු කරනු ලබන්නා වූ ද කොමිෂන් සභාව විසින් එකී බලපත්‍රය නිකුත් කිරීමේ කාර්යය සඳහා රීති මගින් විස්තර කර ඇත්තා වූ ද වෙනත් යම් තැනැත්තකු ඇතුළත් වේ.

මේ අර්ථ නිරූපණයේ කාර්ය සඳහා -

(අ) "සංස්ථාමය මූල්‍ය උපදේශකවරයා" යන්නෙන්, යම් ගාස්තුවකට හෝ කොමිස් මුදලකට -

(i) මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අරමුදල් රැස් කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම හෝ අරමුදල් රැස් කිරීම සම්බන්ධයෙන්;

(ii) මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම;

(iii) මූල්‍ය නිෂ්පාදන ව්‍යුහගත කිරීම; හෝ

(iv) ලැයිස්තුගත පොදු සමාගමක සකස් කිරීම පිළිබඳ යෝජනාක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනාක්‍රම හෝ අත්කර ගැනීමේ යෝජනාක්‍රම,

පිළිබඳ උපදෙස් සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වන නමුත්, ඊට -

(අ) හුදෙක්ම ස්වකීය වෘත්තියෙහි පරිචයට ආනුෂංගික වන්නා වූ ඉහත සඳහන් කරුණු කිසිවකට අදාළ උපදෙස් ලබාදීමෙහි යෙදී සිටින නීතිඥවරයකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු;

(ආ) හුදෙක්ම ස්වකීය වෘත්තියෙහි පරිචයට ආනුෂංගික වන්නා වූ සංස්ථාමය මූල්‍ය උපදෙස් ලබාදීමෙහි යෙදී සිටින ගණකාධිකාරිවරයකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු; හෝ

(ඇ) හුදෙක්ම එහි ප්‍රතිලාභය සඳහා හෝ එහි සම්බන්ධිත සමාගම් කිසිවක් සඳහා සංස්ථාමය මූල්‍ය උපදෙස් ලබාදීමෙහි යෙදී සිටින යම් සමාගමක්,

ඇතුළත් නොවේ;

(ආ) "ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනය" යන්නෙන්, යම් නිකුත්කරන්නකුගේ හෝ යම් නිශ්චිත සුරැකුම්පත් නිකුත් කිරීමක ණය පිළිබඳ සුදුසුකම් තක්සේරු කිරීමේ සහ ඇගයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් සංස්ථාවක් අදහස් වේ;

(ඇ) "ව්‍යුත්පන්න තැරැව්කරු" යන්නෙන්, කොමිස් මුදල් පෙරළා ලබා ගනිමින් ආයෝජකයන් වෙනුවෙන් ව්‍යුත්පන්න මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඈ) "ව්‍යුත්පන්න වෙළෙන්දා" යන්නෙන්, තමාගේම ගිණුම මත ව්‍යුත්පන්න ගිවිසුම්වල වෙළෙඳාම් කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු සඳහන් වේ;

(ඉ) "මූල්‍ය සැලසුම්කරු" යන්නෙන්, යම් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා වෙනත් යම් තැනැත්තකුගේ මූල්‍ය තත්ත්වයන් විශ්ලේෂණය කිරීමේ සහ යම් සුරැකුම්පත්වල ආයෝජන කිරීමේ සැලසුමක් ඇතුළු එම වෙනත් තැනැත්තාගේ මූල්‍ය අවශ්‍යතා සහ පරමාර්ථ සපුරාලීම සඳහා වන යම් සැලසුමක් සපයනු ලැබීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඊ) "ආයෝජන විශ්ලේෂකයා" යන්නෙන්, සුරැකුම්පත් සම්බන්ධයෙන් වෙනත් තැනැත්තන්ට උපදෙස් ලබා දීමේ ව්‍යාපාරයක යෙදී සිටින හෝ තම ව්‍යාපාරයේ කොටසක් සුරැකුම්පත්

නිකුත් කරනු ලබන හෝ ප්‍රසිද්ධ කරනු ලබන, විශ්ලේෂණය කරනු ලබන හෝ ඒ පිළිබඳ වාර්තා කරනු ලබන, කොමිෂන් සභාව විසින් රීතිවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි පුවත්පත් හිමිකරුවන් නොවන යම් තැනැත්තකු අදහස් වේ;

(උ) "ආයෝජන කළමනාකරු" යන්නට, යම් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා ආයෝජකයකු වෙනුවෙන් සුරැකුම්පත් ආයෝජනාවලියක් කළමනාකරණය කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු ඇතුළත් වන නමුත් ඊට යම් සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක කළමනාකරු ඇතුළත් නොවේ;

(ඌ) "කළමනාකාර සමාගම" යන්නෙන්, ඒකක භාර යෝජනා ක්‍රමයක, නිශ්චල දේපළ ආයෝජන භාරයක, විනිමය ස්ථානයක වෙළෙඳාම් කිරීමේ අරමුදලක හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක ඒකකයක් -

(i) නිකුත් කර හෝ දායකවීම සඳහා අර්පණය කර ඇති හෝ නිකුත් කිරීමට හෝ දායකවීම සඳහා අර්පණය කිරීමට යෝජනා කරනු ලබන; හෝ

(ii) දායකවීම හෝ මිල දී ගැනීමට ආරාධනාවක් කර ඇති යම් සමාගමක් අදහස් වන අතර, ඊට තත්කාලයෙහි කළමනාකරණ සමාගමක කර්තව්‍ය ඉටුකරන,

යම් තැනැත්තකු ඇතුළත් වේ;

(එ) "ආන්තික සපයන්නා" යන්නෙන්, කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා ආයෝජකයන්ට ණය මුදල් සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඒ) "වෙළෙඳපොළ සාදන්නා" යන්නෙන්, එකී විනිමය ස්ථානය විසින් දක්වා ඇති නියමයන් මත පදනම්ව නිශ්චිත සුරැකුම්පතක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක ස්වයංක්‍රීය වෙළෙඳ පද්ධතියක පවත්වාගෙන යනු ලබන ඇණවුම් පොතක ලංසු සහ අර්පණ මිල ගණන් ඇතුළත් කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

(ඔ) "ස්ථානගත කිරීමේ අනුයෝජිතයා" යන්නෙන්, එම සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා සුරැකුම්පත් නිකුත්කරන්නකු සහ ආයෝජකයන් අතර අතරමැදියකු වශයෙන් ක්‍රියාකරනු ලබන යම් තැනැත්තකු අදහස් වන අතර, ඊට විශේෂයෙන් මහජනයාට එම සුරැකුම්පත් අර්පණය කිරීමේ අදහස ඇතිව එම සමාගමෙන් එම නිකුත් කිරීම මිල දී ගන්නා යම් තැනැත්තකු ඇතුළත් වේ:

(ඕ) "කොටස් තැරැව්කරු" යන්නෙන්, කොමිස් මුදලක් පෙරළා ලබා ගනිමින් අයෝජකයන් වෙනුවෙන් ව්‍යුත්පන්න නොවන සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ක) "කොටස් වෙළෙන්දා" යන්නෙන්, තමාගේම ගිණුමට ව්‍යුත්පන්න නොවන සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් සංස්ථාවක් අදහස් වේ;

(ග) "ප්‍රතිරක්ෂිතයා" යන්නෙන්, යම් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සම්බන්ධයෙන්, එම සුරැකුම්පත්වල දායක නොවුණු කොටස ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා මිලදී ගැනීමට ඇපවන්නා වූ හෝ එම අර්පණය සඳහා සම්පූර්ණයෙන් ම දායක වී නොමැති අවස්ථාවක එම සුරැකුම්පත් මිල දී ගැනීමට සුරැකුම්පත් නිකුත් කරන්නකු සමඟ සාකච්ඡා කරන්නා වූ යම් සංස්ථාවක් අදහස් වේ;

"වෙළෙඳපොළ මෙහෙයුම්කරු" යන්නෙන්, IV වන කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම, නිෂ්කාශනය කිරීම හෝ නිරවුල් කිරීම සඳහා පහසුකම් සලස්වනු ලබන වෙළෙඳපොළ යටිතල පහසුකම් පිහිටුවනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විෂයය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"අර්පණය" හෝ "අර්පණය කිරීම" යන්නට, සංස්ථා ප්‍රකාශයක් මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් යම් සුරැකුම්පත් හෝ එම සුරැකුම්පත්වල සම්බන්ධතාව යම් වටිනාකමකට මහජනයාට විකිණීම හෝ බැහැර කිරීම සඳහා කරනු ලබන යම් උත්සාහයක් ඇතුළත් වන නමුත් ඊට එකී සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත් වන ලෙස යම් තැනැත්තකු වෙත කරනු ලබන සද්භාවී ආරාධනාවක් ඇතුළත් නොවේ;

"පෞද්ගලික ස්ථානගත කිරීම" යන්නෙන්, තථ්‍ය කොටස් හිමියන් සඳහා ඔවුන්ගේ කොටස් ප්‍රමාණයට සමානුපාතිකව ඉදිරිපත් කරනු ලබන අයිතිවාසිකම් නිකුතුවක් හෝ දායකවීම සඳහා මහජනයාට කරනු ලබන සාමාන්‍ය අර්පණයක් මාර්ගයෙන් හැර, හඳුනාගනු ලැබූ ආයෝජකයකු හෝ ආයෝජකයන් කාණ්ඩයක් වෙත සුරැකුම්පත් නිකුත් කිරීමක් අදහස් වේ;

"එක්ව ක්‍රියා කිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන්" යන්නෙන්, යම් විධිමත් හෝ අවිධිමත් ගිවිසුමක් හෝ අවබෝධතාවක් ප්‍රකාරව, සමාගමක හෝ වෙනත් යම් සමාගමක කොටස්වල යම් සම්බන්ධතාවක් ඔවුන් අතරින් කිසිවකු විසින් අත්කර ගැනීම මගින් සහයෝගීව කටයුතු කරනු ලබන හෝ සමාගමක් සඳහා වූ අර්පණයක සාර්ථක ප්‍රතිඵලය ව්‍යාර්ථ කරනු ලබන තැනැත්තන් අදහස් වේ. මේ අර්ථ නිරූපණයේ සාමාන්‍ය

අදාළවීමට අගතියක් නොමැතිව, කොමිෂන් සභාව සෑහීමට පත්වන පරිදි ඊට පටහැනිව යම් දෙයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, පහත දැක්වෙන තැනැත්තන් එකිනෙකා සමඟ එක්ව ක්‍රියා කිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන් බවට පූර්ව නිගමනය කරනු ලැබිය යුතු යː-

(අ) සියල්ලන්ම එකිනෙකා සමඟ කටයුතු කරන යම් සමාගමක්, එහි මව් සමාගම, පාලිත සමාගම් සහ හවුල්කාර පාලිත සමාගම් සහ ඒවායේ ආශ්‍රිත සමාගම් සහ ඡන්ද අයිතිවාසිකම් මිල දී ගැනීම සඳහා ඉහත සඳහන් තැනැත්තන් කිසිවකුට (බලපත්‍රලාභී බැංකුවක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කරන ලද මූල්‍ය සමාගමක් විසින් එහි සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යන අතරතුර දී හැර) මූල්‍ය සහාය ලබා දී ඇති යම් තැනැත්තකු;

මේ ඡේදයේ කාර්ය සඳහා "ආශ්‍රිත සමාගමක්" යනු 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ සාදන ලද ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති ප්‍රකාරව අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ සමාගමක් වේ;

(ආ) එහි අධ්‍යක්ෂවරුන් කිසිවකු සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්, එම අධ්‍යක්ෂවරුන් කිසිවකු විසින් පාලනය කරනු ලබන සම්බන්ධිත භාර මෙන්ම සමාගම්, ඔවුන්ගේ ළඟම ඥාතීන් සහ සම්බන්ධිත භාර සමඟ යම් සමාගමක්;

(ඇ) එහි විශ්‍රාම වැටුප් අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ කොටස් යෝජනා ක්‍රම සමඟ යම් සමාගමක්;

(ඈ) යම් ආයෝජන සමාගමක්, ඒකක භාරයක් හෝ එකී ආයෝජන කළමණාකරු කළමනාකරණය කරන්නේ යම් තැනැත්තකුගේ ආයෝජන ද එම තැනැත්තා සමඟ අරමුදල් කළමනාකරුවකු; සහ

(ඉ) සියල්ලන්ම එකිනෙක සමඟ කටයුතු කරන යම් තැනැත්තකු, එම තැනැත්තාගේ ඥාතීන් සහ ඔවුන් කිසිවකුගේ සම්බන්ධිත භාරයක්.

මේ ඡේදයේ කාර්ය සඳහා, "ඥාතියා" යන්නෙන්, එම තැනැත්තාගේ මව හෝ පියා, කලත්‍රයා, සුළු දරුවන් ඇතුළු දරුවකු, සුළු සහෝදරයා හෝ සුළු සහෝදරිය ඇතුළු සහෝදරයකු හෝ සහෝදරියක හෝ එම තැනැත්තාගේ දරුවකුගේ කලත්‍රයා අදහස් වේ;

"සංස්ථා ප්‍රකාශය" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රසිද්ධ දැන්වීම" යන්නෙන්, යටත් පිරිසෙයින්, එක් ගැසට් පත්‍රයකවත්, සහ යටත් පිරිසෙයින්, ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් වූ එක් දිනපතා පුවත්පතකවත්, එම කරුණ පිළිබඳ දැන්වීමක් පළකිරීම මගින් ලබාදිය යුතු වන්නා වූ මේ පනත යටතේ ලබා දීමට නියමිත යම් කරුණක් පිළිබඳ දැන්වීමක් අදහස් වේ;

"ලියාපදිංචි තැනැත්තා" යන්නෙන්, වෙළෙඳපොළ අතරමැදියකු සඳහා සහ ඔහු වෙනුවෙන් ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කරනු ලබන්නා වූ ද මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කරන ලද්දා වූ ද යම් තැනැත්තකු අදහස් වේ;

"සම්බන්ධිත සමාගම" යන්නෙන්, යම් සංස්ථාවක පාලක සමාගමක්, ආශ්‍රිත සමාගමක් හෝ පාලක සමාගමක් හෝ පාලක සමාගමේ පාලිත සමාගමක් අදහස් වේ;

"අයිතිවාසිකම් නිකුත් කිරීම" යන්නෙන්, එම නිකුත් කිරීම විස්තර කරනු ලබන්නේ හෝ සඳහන් කරනු ලබන්නේ කවරාකාරයකින් වුව ද, ලැයිස්තුගත පොදු සමාගමක පවත්නා යම් කොටසක් හෝ අනාගතයේ දී නිකුත් කරනු ලබන කොටස් ප්‍රතිෂ්ඨාවක් සඳහා සහ එම අර්පණය සිදු කරන දිනයේ දී එම සමාගමේ ඔවුන් විසින් දරනු ලබන සුරැකුම්පත් පන්තියට අනුපාතිකව එම සමාගමේ දැනට සිටින කොටස්හිමියන්ට නිකුත් කිරීමක් අදහස් වේ;

"සුරැකුම්පත්" යන්නට-

(අ) ණයපත්‍ර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, බැඳුම්කර, සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක, ඒකක හෝ එහි යම් අයිතිවාසිකමක්, මනාප හෝ සම්බන්ධතා; හෝ

(ආ) විශ්වාසය තබා ඇති පාදක වූ වත්කමේ ස්වභාවය කවරක් වුව ද, අනාගතයන් සහ මනාප ඇතුළුව ව්‍යුත්පන්න; හෝ

(ඇ) රජයක් විසින් හෝ වෙනත් යම් සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් විසින් නිකුත් කරන ලද හෝ නිකුත් කිරිමට යෝජිත නෝට්ටු,

ඇතුළත් වන නමුත්, ඊට බැංකුවක් විසින් නිකුත් කරන ලද විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටු හෝ තැන්පතු සහතික, ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් හෝ 181 වන වගන්තිය යටතේ සුරැකුම්පත් නොවන බවට නියම කර ඇති වෙනත් යම් නිෂ්පාදනයක් හෝ නිෂ්පාදන පන්තියක් ඇතුළත් නොවේ;

"සුරැකුම්පත් වෙළෙඳපොළ" යන්නෙන් -

(අ) සුරැකුම්පත් විකිණීම, මිල දී ගැනීම හෝ හුවමාරු කිරීම සඳහා වන අර්පණ සිදු කිරීමට හෝ ප්‍රතිග්‍රහණය කිරීමට ඍජුව හෝ වක්‍රව හේතුවීම අරමුණු කරගත් හෝ එසේ කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි අර්පණ හෝ ආරාධනා නිතිපතා සිදු කරනු ලබන; හෝ

(ආ) සුරැකුම්පත් විකිණීම, මිල දී ගැනීම හෝ හුවමාරු කිරීමට ඍජුව හෝ වක්‍රව හේතුවීම අරමුණු කර ගත් හෝ එසේ කිරිමට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි අර්පණ හෝ ආරාධනා නිතිපතා සිදු කරනු ලබන; හෝ

(ඇ) යම් නිශ්චිත තැනැත්තන් හෝ නිශ්චිත තැනැත්තන් පන්ති විසින් සුරැකුම්පත් විකිණීමට, මිල දී ගැනීමට හෝ හුවමාරු කිරීමට යෝජනා කරනු ලබන හෝ එසේ කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කිරීම සඳහා වන මිල ගණන් හෝ ප්‍රතිෂ්ඨාව පිළිබඳ තොරතුරු නිතිපතා සපයනු ලබන,

යම් වෙළෙඳපොළක් හෝ වෙනත් ස්ථානයක් හෝ පහසුකමක් අදහස් වන නමුත්, ඊට මේ පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇතුළත් නොවේ;

"කොටස" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඊට ලබා දී ඇති අර්ථයම හෝ එහි නීති යටතේ වෙනත් යම් අධිකරණ කලාපයක පිළිගනු ලබන කොටසකට දී ඇති අර්ථයම තිබිය යුත්තේ ය;

"කොටස් ණයට ගන්නා" යන්නෙන්, සුරැකුම්පත් ණයට ගැනීමේ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තකු අදහස් වේ;

"කොටස් විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් කොටස් විනිමය ස්ථානයක් ලෙස බලපත්‍ර දෙන ලද යම් සංස්ථාවක් අදහස් වේ;

"අතිරේක සේවා සපයන්නා" යන්නට, යම් සංඛ්‍යාන න්‍යාය පිළිබඳ විශේෂඥයකු, විගණකවරයකු, රක්ෂකයකු, භාරකරුවකු, තක්සේරුකරුවකු හෝ යම් වෙළෙඳපොළ ආයතනයකට, වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලැයිස්තුගත පොදු සමාගමකට හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයකට වෘත්තීමය සේවා සපයනු ලබන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් තැනැත්තකු ඇතුළත් වේ;

"වෙළෙඳ සහභාගිකයා" යන්නෙන්, යම් විනිමය ස්ථානයක, පහසුකම් සඳහා ප්‍රවේශය ඇත්තා වූ ද මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් විනිමය ස්ථානයක රීති යටතේ වෙළෙඳ සහභාගිකයකු ලෙස ඇතුළත් කරගෙන ඇත්තා වූ ද යම් තැනැත්තකු අදහස් වේ;

"ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නා" යන්නෙන්, මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක්

උල්ලංඝනය කිරීමක් හෝ සිදුවීමට ඉඩ ඇති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් තොරතුරු සපයනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**188.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.